





# සාමය ගොඩනැගීම - සාමය පවත්වාගැනීම

## පුත්තලමේ ප්‍රජා ගැටුම් කළමනාකරණය පිළිබඳ අධ්‍යයනය

ප්‍රශාන් තලයසිංහම්
ගයාත්‍රි ලොකුගේ
මොහොමඩ් මුනාස්

අගෝස්තු 2009
කාර්ය පත්‍රිකා මාලා අංක 17 - 2009

cepa
centre for poverty analysis

# සාමය ගොඩනැගීම - සාමය පවත්වාගැනීම

## පුත්තලමේ ප්‍රජා ගැටුම් කළමනාකරණය පිළිබඳ අධ්‍යයනය

ප්‍රශාන් තලයසිංහම්, ගයාත්‍රි ලොකුගේ, මොහොමඩ් මුනාස්

අගෝස්තු 2009

© දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය 2009

ප්‍රථම ප්‍රකාශනය 2009

ISBN : 978-955-1040-53-6

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සුචිකරණ දත්ත

තලයසිංහම් ප්‍රශාන්
සාමය ගොඩනැගීම - සාමය පවත්වාගැනීමඃ පුත්තලමේ ප්‍රජා ගැටුම් කළමනාකරණය පිළිබඳ අධ්‍යයනය / ප්‍රශාන් තලයසිංහම්, ගයාත්‍රි ලොකුගේ සහ මොහොමඩ් මුනාස් - කොළඹඃ දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය, 2009. - පි. 66ඃ සෙ.මී. 29

ISBN: 978-955-1040-53-6 මිලඃ රු.

i. 303.69
ii. ග්‍රන්ථ නාමය
iii. ලොකුගේ, ගයත්‍රි - සම කර්තෘ
iv. මුනාස්, මොහොමඩ් - සම කර්තෘ
1. ගැටුම් කළමනාකරණය

මෙම ග්‍රන්ථයේ ප්‍රකාශන අයිතිය සේපා ආයතනය සතු වේ. කර්තෘ/කර්තෘන් හා ග්‍රන්ථ ප්‍රකාශනයේ අවසරය ඇතිව මෙම ග්‍රන්ථයේ ඕනෑම කොටසක් පිටපත් කළ හැකිය.

සේපා ප්‍රකාශන මාලාවටඃ අධ්‍යයනයන් සංස්කරණය කරනු ලැබූ වෙළුම්, කාර්ය පත්‍රිකා මාලාවන් හා සංක්ෂිප්ත අධ්‍යයන පත්‍රිකා අයත් වේ. මෙම කාර්ය පත්‍රිකා මාලාවෙන් ඉදිරිපත්වන අර්ථකථනයන් සහ නිගමනයන් එම කර්තෘන්ගේ අයිතියට යටත්වන අතර සේපා ආයතනයේ හෝ ග්‍රන්ථ අනුග්‍රහකයන්ගේ මතය හෝ ප්‍රතිපත්තිය මතු නොකරයි.

මෙම ග්‍රන්ථයේ යොදාගෙන ඇති ඡායාරූප පවා සේපා කාර්ය මණ්ඩලයට අයත් වේ.

මෙම ග්‍රන්ථය පිළිබඳ සියළු විමසීම්ඃ
දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය
29, ග්‍රෙගරි පාර, කොළඹ 7
ශ්‍රී ලංකාව
දු. අංඃ +94 11 2676955-8, 2667967-8
ෆැක්ස්ඃ +94 11 2676959
ඊ මේල්ඃ info@cepa.lk
වෙබ්ඃ www.cepa.lk
වෙත යොමු කරන්න.

මුද්‍රණය
සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පෞද්ගලික) සමාගම
67, කාර්මික ජනපදය
කටුවාන පාර
හෝමාගම
ශ්‍රී ලංකාව

**ප්‍රශාන් තලයසිංගම්** දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයෙහි දරිද්‍රතාව සහ ගැටුම් පිළිබඳ වැඩසටහනේ කණ්ඩායම් නියමු ලෙස කටයුතු කරයි. ඔහු එංගලන්තයේ සසෙක්ස් සරසවියේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙකි.

**මොහොමඩ් මුනාස්** දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයෙහි දරිද්‍රතාව සහ ගැටුම් පිළිබඳ වැඩසටහනේ වෘත්තිකයෙකු වශයෙන් කටයුතු කරයි. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ ආර්ථික විද්‍යා අධ්‍යයනය අංශයේ ශාස්ත්‍රපති උපාධිය හදාරනු ලබයි. එමෙන්ම ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිධරයෙකි.

**ගයාත්‍රි ලොකුගේ** දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයෙහි දරිද්‍රතාව සහ ගැටුම් පිළිබඳ වැඩසටහනේ වෘත්තිකයෙකු වශයෙන් කටයුතු කරයි. ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයේ (FGS) සංවර්ධන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හදාරනු ලබයි. එමෙන්ම ඇය කැළණිය විශ්ව විද්‍යාලයේ භාෂා පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිධාරිනියකි.

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය වූ කලී ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවට අදාළ ගැටළු වඩාත් මැනවින් අවබෝධ කර ගැනීම ප්‍රවර්ධනය කරන ස්වාධීන වෘත්තීය සේවා සපයන්නෙකි. දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ සේවා නැඹුරුව කේන්ද්‍රගත ව ඇත්තේ දරිද්‍රතාව අඩුකරලීම පිළිබඳ කටයුතුවල නිරත සංවිධාන සහ වෘත්තිකයන් කරා විහිද ගිය ව්‍යවහාරික පර්යේෂණ, උපදේශන සේවා, පුහුණුව සහ සංවාද හා හුවමාරුව යන අංශ හතර කෙරෙහිය.

# ස්තුති කිරීම

මුන්දලම සඳහා පර්යේෂණ මූලය යෝජනා කිරීම සම්බන්ධයෙන්, ක්ෂේත්‍ර මට්ටමේ සම්බන්ධීකරණය කිරීම, මුලින්ම සම්බන්ධතාවයන් ඇති කරදීම සම්බන්ධයෙන්, සහ පර්යේෂණය සඳහා අමතර අධ්‍යයනය ලබාදීම සම්බන්ධයෙන් විනිවිද ඒකාබද්ධ ස්වේච්ඡා සංවිධානයට,

ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රාදේශීය මට්ටමේ ප්‍රජා මූල සංවිධාන, පුත්තලම දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලයේ නිලධාරීන්, පුත්තලම, කල්පිටිය, මුන්දලම සහ වනාතවිල්ලුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ නිලධාරීන්, ප්‍රාදේශීය රජයේ නිලධාරීන්, දේශපාලඥයින්, ආගමික නායකයින්, ආගමික කමිටු, කඳවුරු කමිටු, ප්‍රජා නායකයින් සහ වටිනා තොරතුරු සහ අත්දැකීම් අපත් සමග බෙදා ගැනීම සම්බන්ධයෙන් ප්‍රජා සාමාජිකයන්ට,

සිංහල භාෂා පරිවර්තනය සිදු කළ වාසනා ගුණරත්නට,

පර්යේෂණ යෝජනාවට මූල්‍යාධාර සැපයූ යුරෝපීය කොමිසමට,

එමෙන්ම පර්යේෂණය කරගෙන යාමට උදව් උපකාර කළ පර්යේෂණ කණ්ඩායමට සහ සේපා කාර්ය මණ්ඩලය සහ ආධාරක කාර්ය මණ්ඩලයට,

අපට දැක්වූ දායකත්වය සම්බන්ධයෙන් කෘතඥ පූර්වක ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමු.


පුත්තලමේ ගැටුම් අවස්ථා 6ක වර්ධනය සහ නිරාකරණය පිළිබඳව මෙම අධ්‍යයනයෙන් විභාග කළේය. මෙමගින් අභ්‍යන්තර අවතැන්වූවන්ගේ හදිසි ආගමනයේ ද්විත්ව බලපෑම පිළිබඳව අධ්‍යයනය කළේය. තවදුරටත් වෙනත් ගැටළු පිළිබඳව එනම් ගැටුමේ සහ ඒවායේ නිරාකරණයේ සංකීර්ණතාවයන් පිළිබඳව අධ්‍යයනය කළේය. ප්‍රදේශයේ සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ සවිස්තර සාකච්ඡාවක් ඇතුළත්ව ඇත. මෙම අධ්‍යයනයෙන් අර්බුද නිරාකරණය සඳහා පවතින විවිධ ප්‍රාදේශීය යාන්ත්‍රණයන් විශ්ලේෂණයන් කරනු ලැබීය.

# කෙටි යෙදුම්

| | |
|---|---|
| AGA | Assistant Government Agent<br>උප දිසාපති |
| CBO | Community Based Organisation<br>ප්‍රජා මූලික සංවිධාන |
| CEPA | Centre for Poverty Analysis<br>දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය |
| CFA | Cease Fire Agreement<br>සටන් විරාම ගිවිසුම |
| CHA | Consortium for Humanitarian Agencies<br>මානුෂික සේවායතන සමූහය |
| CPA | Center for Policy Aulternatives<br>ප්‍රතිපත්ති විශ්ලේෂණ කේන්ද්‍රය |
| CTB | Ceylon Transport Board<br>ලංකා ගමනාගමන මණ්ඩලය |
| CTF | Community Trust Fund<br>ප්‍රජා භාරකාර අරමුදල |
| DCS | Department of Census and Statistics<br>ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුව |
| DS | District Secretary/Divisional Secretary<br>දිස්ත්‍රික්ක ලේකම් |
| DS division | Divisional Secretariat Division<br>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
| FGD | Focus Group Discussion<br>කේන්ද්‍රගත කණ්ඩායම් සාකච්ඡා |
| FLICT | Facilitating Local Initiatives for Conflict Transformation<br>ගැටුම් පරිවර්ථන දේශීය ආරම්භනයට පහසුකරණය |
| GA | Government Agent<br>දිසාපති |
| GS/GN Division | Grama Sevaka / Grama Niladari Division<br>ග්‍රාමසේවක / ග්‍රාම නිලධාරි කොට්ඨාශය |
| GTZ | German Technical Corporation<br>ජර්මානු තාක්ෂණික සහයෝගීතාවය |

| | |
|---|---|
| HCI | Head Count Index<br>ජනගහණ දරිද්‍රතා දර්ශකය |
| IDMC | Internal Displacement Monitoring Centre<br>අභ්‍යන්තර අවතැන්වූවන් නිරීක්ෂණය කිරීමේ කේන්ද්‍රය |
| IDP | Internally Displaced Person<br>අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයෙක් |
| IFSP | Integrated Food Security Project<br>අනුකලිත ආහාර ආරක්ෂණ ව්‍යාපෘතිය |
| INGOs | International Non Government Organisations<br>ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන |
| ISRC | Islamic Relief Committee<br>ඉස්ලාමීය සහන කමිටුව |
| KI | Key Informant interview<br>මූලික තොරතුරු සපයන සම්මුඛ සාකච්ඡා |
| LRC | Land Reform Commission<br>ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම |
| LTTE | Liberation Tigers of Tamil Ealam<br>දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධාන. |
| MOH | Medical Officer of Health<br>මහජන සෞඛ්‍ය පරීක්ෂක |
| MP | Member of Parliament<br>පාර්ලිමේන්තු මන්ත්‍රී |
| NGO | Non Government Organisation<br>රාජ්‍ය නොවන සංවිධාන |
| PLOTE | People’s Liberation Organisation of Tamil Ealam<br>ද්‍රවිඩ ඊලාම් ජනතා විමුක්ති කොටි සංවිධානය |
| RDF | Rural Development Foundation<br>ග්‍රාමීය සංවර්ධන පදනම |
| UNHCR | United Nations High Commissioner for Refugees<br>සරණාගතයන් සඳහා වූ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය |
| USAID | United States Agency for International Development<br>ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද කාර්යාලය |
| WODEPT | Women’s Organisation for Development, Equity, Peace and Temperance<br>සංවර්ධනය, සමානාත්මතාව, සාමය හා අමද්‍යපානය සඳහා වූ කාන්තා සංවිධානය |

# පටුන


සාරාංශය i

1. **හැඳින්වීම** 1

2. **පසුබිම** 2

    2.1 ජනගහණ සංයුතිය 3

    2.2 ජනගහණ ව්‍යාප්තිය 3

    2.3 පුත්තලම ප්‍රදේශයේ දරිද්‍රතාව 5

    2.4 සංක්‍රමණ උපනතීන් 9

    2.5 අධ්‍යයන ක්‍රියාවලිය 13

3. **මූලික පද** 17

4. **ගැටුම් පරිසරය** 19

    4.1 ගැටුම් රේඛා - කුඩා ප්‍රත්‍යෙක අධ්‍යයනයන් 20

    වනාතවිල්ලුව 20

    නාගවල්ලි ත්‍රීරෝදරථ 22

    නොරොච්චොලේ සායනය 23

    පලාවි ඉඩම 24

    සිරිමාපුර සුසානභූමිය 25

    උඩප්පු 26

    4.2 අන්තර්බන්ධන සිදුවීම් සහ ආධාරක සාධක 27

    4.3 ගැටුමට ප්‍රතික්‍රියා දැක්වීම 29

5. **පුත්තලමේ ගැටුම, ගතිකයන්, ආධාරක සාධක සහ හරස්කඩ පැතුරණු ප්‍රශ්න** 31

    5.1 ගැටුම් / ආරවුල් වර්ග 31

    5.2 වර්ධනයේ සහ නිරාකරණයේ විවිධ අවස්ථා 32

    5.3 තීව්‍රතාවයේ පරාසය 33

    5.4 ගැටුම්වල සංකීර්ණත්වය 33

    5.5 හරස්කඩ ගැටළු 35

    5.6 සමාජ ආර්ථික තත්ත්වයන් 42

    5.7 අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ පුද්ගලයන් හා ගැටුම 47

6 **සාමය ගොඩනැගීම හා සාමය පවත්වාගෙන යාම** 57

7. **නිගමනයන්** 65

## සාරාංශය

මෙම අධ්‍යයනය ගැටුම් අවස්ථා 6 කින් ද ඒවා වර්ධනය වූ ආකාරය හා විසඳනු ලැබූ ආකාරයෙන් ද සමන්විතය. මෙම ගැටුම් අවස්ථා ඇතිවන්නේ මිශ්‍ර ජාතීන් ජීවත්වන්නා වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලය. මෙම අධ්‍යයනය මගින් ජනවර්ගය ගැටුම්වලට ඇති කරන බලපෑම හා ගැටුම්වලට බලපෑම්වන අනෙකුත් සාධක මත ඔවුන් අතර පවත්නා ආතතිය ජනවාර්ගිකත්වය මත රදා ඇති බව සොයාගෙන ඇත.

අභ්‍යන්තර අවතැන්වූවන් හෝ ජනවාර්ගික මිශ්‍රණය නිසා ප්‍රදේශයේ ජනගහනයේ යලිත් වෙනස් වීම මතත් ඇති වූ ජන කොට්ඨාශයන්ගේ විවිධ වූ ආධාර ක්‍රම හා දේශපාලන බලවේගයක් නිසා ද ආතතිය හා ගැටුම් ඇති වීමට පාදක වී ඇත. මෙම විවිධතාවයන් දිස්ත්‍රික්ක ජනගහන විවිධත්වය හා සමාජ ආර්ථික චිත්‍රය තුළ මුල් බැසගෙන ඇත.

ජාතික සංඛ්‍යාත්මක දත්ත පෙන්වන පරිදි පුත්තලම දිළිඳු දිස්ත්‍රික්කයක් වන අතර එයට හේතු වී ඇත්තේ එහි සිටින අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ජනගහණයයි. 1990-1995 ජන සංඛ්‍යාත දර්ශකයේ මිනුම්වල වෙනස එනම් 22% සිට 31% ක් වූ වර්ධනයට හේතු වී ඇත්තේ අභ්‍යන්තර අවතැන්වූවන්ගේ ආගමනය හා අඩු පුද්ගලික සම්පත් පසුබිමයි. දිස්ත්‍රික්කයේ පවතින සම්පත් ප්‍රමාණය හදිසි ආගමනයට ආධාර කිරීම සඳහා ප්‍රමාණවත් නොවන අතරම එය පවතින දුර්වල ආර්ථිකයට තවත් පීඩාකාරී වේ. 2006 නවතම දරිද්‍රතා දර්ශකවල අනුව ජන සංඛ්‍යාත දර්ශකයේ 2002 දී 31% සිට 13% දක්වා ඉතා පහළ බැසීමක් පෙන්වයි. එයට ප්‍රධාන ලෙසම ආධාර ගලා ඒමත් සහ ඒවා ලබා දීමටත් ඒ අනුව වර්ධනය වූ පුත්තලම ජනතාවගේ පරිභෝජන රටාවන් මෙයට හේතුව විය හැකිය. එසේම අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ආගමනයත් සමගම ප්‍රදේශයට යටිතල පහසුකම් වර්ධනය වීමක් සිදු වී ඇත. ඔවුන් දේශීය ආර්ථිකය සඳහා කුඩා ව්‍යාපාර අරඹමින් තම නිෂ්පාදන ආයෝජනය කිරීමෙන් දායක වී ඇත. ඉතා මෑතකදී දක්වන දත්තවලට අනුව ඔවුන් දිස්ත්‍රික්කයේ පරිභෝජන වර්ධනය අවමකිරීම මත පදනම් වූ දුප්පත්කම සඳහා දායක වන අතර දුප්පත්කම සම්බන්ධයෙන් අභ්‍යන්තර අවතැන් වූවන්ගෙන් ඇති බලපෑම මුලිකව ඍණාත්මකව පවතින්නා වූ විශාල වූ ආර්ථික වෙනස්කම්වලට අමතරව සත්කාරක ප්‍රජාවගේ සිතුවිලි වලට අනුව අවතැන්වූවන් දිස්ත්‍රික්කයේ ආර්ථිකයට ඍණාත්මක ලෙස බලපෑම් කරයි. මෙම සංජානනවල උරා ගැනීමෙහි ප්‍රතිඵලයක් ලෙස අධ්‍යයනය කළ ගැටුම් සියල්ලම සමාජ ආර්ථික තරගයකට සම්බන්ධ වී ඇත.

අධ්‍යයනයේ දක්නට ලැබුණු ආගමනයන් සියල්ලම ගැටුම් පරිසරය හා දිස්ත්‍රික්කයේ සමාජ ආර්ථික වෙනස්වීම් සමග බැඳී ඇත. පුත්තලමේ ආගමනයන් පිළිබඳව උදාහරණ විශාල සංඛ්‍යාවක් ඇති අතර විශේෂයෙන් ඉන්දීය රජවරුන් සමග (බු.ව. 543 විජයගේ ශ්‍රී ලංකා ආගමනය සිදු වූ තම්මැන්නාව අද වනාතවිල්ලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වූවකි.) ආර්ථික පදනම් මත පදිංචි වීම හා ඒ හා බැඳුණු වෙළඳාම් තොටුපළවල් ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහාත් උදාහරණ ලෙස හලාවත වරාය, පුත්තලම, මාදම්පේ, එසේම vi වන පරාක්‍රමබාහු රජ සමයේ සිට පශ්චාත් යටත්විජිතවාදී වාරිමාර්ග ජනපද යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම හා තබ්බෝවේ පදිංචි කළ ගොවි පවුල් 29 හා විජයකටුපොත ජනපදයේ පදිංචි කළ පවුල් 327 උදාහරණ වේ. ඉතාම මෑතකාලීන ආගමනයක් වන්නේ උතුරු නැගෙනහිර පදිංචිකරුවන්ට LTTE මගින් 1990-1991 සිය වාසස්ථාන අතහැර යාමට සිදු වූ පසු ඇතිවූ අභ්‍යන්තර අවතැන්වූවන්ය. මෙලෙස අවතැන්වූවන්ගෙන් බහුතරය යාපනය, මන්නාරම, මුලතිවු හා කිලිනොච්චිය යන උතුරේ දිස්ත්‍රික්කවල පදිංචි LTTE විසින් නෙරපා හැරීම්වලට ලක්වුණු මුස්ලිම් ජනතාවයි.

මෙම අධ්‍යයනය ප්‍රධාන ලෙසම පුත්තලමේ සිදු වූ ගැටුම් අවස්ථා 6 ක් ගවේෂණය කරයි. ඒවා තෝරාගෙන ඇත්තේ එහි ඇති විවිධත්වය, විසඳුම් අවස්ථා හා ඒවාට සම්බන්ධ වූ පාර්ශ්වයන් යන කරුණු සැලකීමෙනි. එක් අවස්ථාවක් වන්නේ ප්‍රජාවන් ත්‍රිත්වය අතර වූ සිරිමාපුර පිහිටි පොදු සුසාන භූමියක් සඳහා වූ ගැටුමකි. මෙම ගැටුම නිසා ප්‍රජාවන් අතර ආතතියක් වර්ධනය වන බව ද දැකිය හැකි විය. මෙම සිදුවීමේ දී බෞද්ධ හා කතෝලික බැතිමතුන් සුසාන භූමිය භාවිතා කළ අතර මුස්ලිම් අවතැන් වූවන්ගේ පැමිණීම සමගම ඔවුන්ටත් වෙනම කොටසක් ඉල්ලීමේ දී පාර්ශ්වයන් එහි එකඟතාවය බිඳීමෙන් සමාජයේ ආතතියක් ඇති විය. දේශීය රාජ්‍ය නොවන සංවිධානයක් වන ග්‍රාම සංවර්ධන පදනම (RDF - Rural Development Foundation) මැදිහත් වීමෙන් සිද්ධිය සමථයකට පත් කරන ලද අතරම ගැටුම් පාර්ශව දෙක මුස්ලිම් අවතැන් වූවන්ට ද කොටසක් වෙන් කර දීමට එකඟ විය. තුන්වෙනි පාර්ශවයක් මැදිහත් වීමෙන් ගැටළුව නිරාකරණය වූ නමුත් එය සැමවිටම අනෙක් සමාන ගැටුම් විසඳීමේදී සාර්ථක නොවනු ඇත.

දෙවන අවස්ථාව වන්නේ නොරොච්චෝලයෙහි මුස්ලිම් පල්ලියේ ගොඩනැගිල්ලක් සායනයක් උදෙසා භාවිතා කිරීම සම්බන්ධවයි. මුස්ලිම් පල්ලියේ කමිටුවට දැනුණු පරිදි මෙම සායනයට ජනයා පැමිණීම නිසා වැඩිවූ අවතැන්වූවන්ගේ පැමිණීම පල්ලියේ සාමාන්‍ය පැවැත්මට බාධාවක් වූ බවයි. මුස්ලිම් සායන කමිටුව හා USAID මැදිහත්වීමෙන් පල්ලියෙන් පිටත නව සායනයක් ආරම්භ කරන ලදී. නව සම්පත් සැපයීමෙන් පසුව ගැටුමේ ගතිකයන්වල වෙනස්වීමක් ඇති වූ අතර එම සිද්ධිය ද නිරාකරණය විය.

නාගවිල්ලුහි දී සිංහල හා මුස්ලිම් ත්‍රීරෝද රථ රියදුරන්ගේ කණ්ඩායම් දෙකක රථ ගාලක් පිළිබඳව ආරවුලක් ඇතිවුණි. මෙම ආරවුල ප්‍රචණ්ඩකාරීත්වයක් දක්වා ගොස්, එම ප්‍රදේශය පුරා යම් ආතතියක් ඇති කරන ලදී. එම ආතතිය නොකඩවා පැවති අතර පොලිස් මාර්ග බාධකයක් ඒ අසල ප්‍රදේශයේ ඇති කිරීමෙන් එය ප්‍රචණ්ඩකාරී නොවීය. නමුත් ඒ ආරවුල විසඳුමක් රහිතව අඛණ්ඩව පැවතිණි.

උඩුප්පුහී දී හින්දු කෝවිලක් ගොඩනගන ලද ඉඩම් කොටසක් උදෙසා හින්දු හා කතෝලික බැතිමතුන් අතර ආරවුලක් ඇතිවිය. දෙපාර්ශවයේ තරුණ ප්‍රජාවගේ ගැටුම් නිසා ප්‍රදේශයේ සාමකාමී වාතාවරණය බිඳ වැටුණු අතර, ගැටුම් අවසානයේ නිරාකරණය වූයේ පුද්ගලයෙකු විසින් සාකච්ඡා කිරීමෙන් පසුව ඉඩම් කොටසක් පරිත්‍යාග කිරීමෙන් අනතුරුවයි.

වනාතවිල්ලුව ප්‍රදේශයේ ගැටුම් ඇති වීමට හේතු වී ඇත්තේ ගඟේවාඩිය සහ සේරක්කුලිය ධීවර ප්‍රජාවගේ ධීවර කර්මාන්තය සහ එකිනෙකාට අයිතිව තිබූ ප්‍රවේශ මාර්ග හා බෝට්ටු ස්ථානගත කරන ප්‍රදේශ පිළිබඳව වූ තරගකාරී ස්වරූපයකිනි. ප්‍රදේශයේ පැවතුණු සංවේදී අවස්ථාව නිසා ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් නිලධාරීන්ද හමුදා නිලධාරීන් ද එකතු වී විසඳුමක් ලබාදෙන ලදී. ප්‍රාදේශීය ලේකම් විසින් අක්කර 4ක භූමි ප්‍රමාණයක් ප්‍රජාවන්ට වෙන් කර දුන් අතර, එහිදී ඔවුන්ට එකතුව සිය මාළු වෙළඳාම හා බෝට්ටු ගාල්කර තැබීම කළ හැකි විය.

අනන්‍යතාවය පිළිබඳ ප්‍රශ්නය, භූමිය හා දේශපාලන බලය ගැටුම්වල ප්‍රබලතාවය වර්ධනය කරන ලද අතර මේ නිසාම විසඳුම් සෙවීම අපහසු සහ අසීරු කාර්යයක් විය. මෙම ගැටුම් අවස්ථා ප්‍රශ්න පිළිබඳව ගැඹුරු ප්‍රතිබිම්භයක් කිරීමට යොමු කරන අතරම ඒවා සංකීර්ණ සමාජ තත්වයක් පවත්නා කොටස් බවත්, වෙනම කොටස් නොවන බවත් විවිධ වූ ගැටුම් හා නිරාකරණ යාන්ත්‍රණයක් සඳහා උදාහරණ ලෙස අපි මෙම අවස්ථා තෝරා ගත්තෙමු.

ප්‍රදේශයේ වසර 17ක් පුරා පදිංචිව සිටි අභ්‍යන්තර අවතැන්වූවන්ගේ විශ්වාසය වන්නේ ඔවුන් මෙම දිස්ත්‍රික්කයේ තාවකාලික පදිංචිකරුවන් බවයි. 2006 UNHCR සංගණනය අනුව අභ්‍යන්තර

අවතැන්වූවන්ගෙන් 94% පැවසූ පරිදි ඔවුන් පුත්තලමේ පදිංචිය සඳහා තෝරාගෙන ඇති අතර යළිත් ඔවුන්ගේ මුල් ප්‍රදේශ කරා නොයන බවත් ඔවුන්ගෙන් 74% ප්‍රකාශ කරන පරිදි පුත්තලමේ ඔවුන්ට අයත් ඉඩම් කොටසක් ඇති අතර 58% කටම ඔවුන්ට හිමි නිවසක් පුත්තලමේ ඇත. සත්කාරක ප්‍රජාවගෙන් ප්‍රශ්න කිරීම්වලට අනුව ඔවුන්ගේ අදහස වන්නේ, ඔවුන්ගේ තත්වය අවදානම් වන අතර එය සමාජයේ වෙසෙන අනෙක් තර්ජනාත්මක කොටස්වලට බලපෑමක් කරන බවයි. අභ්‍යන්තර අවතැන්වූවන්ට ඔවුන්ගේ තත්වය පදනම් කරගෙන ආධාර දෙනවා'යැයි යන හැඟීම නිසා දිස්ත්‍රික්කයේ සමාජ අප්‍රසාදයක් ඔවුනට හිමිවීමත් ඒ නිසාම ගැටුම් ඇතිවන බවත් අධ්‍යයනය කර ඇත. අධ්‍යයනයේ ප්‍රතිපෝෂණයට අනුව නිවාස සියල්ලකම කාන්තාව ගෘහමූලික වන අතර ඔවුන්ගෙන් සංචාරක ධීවර පවුල් සහ කම්කරු පවුල්වලට තත්වය තර්ජනාත්මක වන අතර, ඔවුන්ට සංවර්ධන ආයතනවල විශේෂ ආධාරයක් අවශ්‍ය වේ. සාර්ථක සංවර්ධන ව්‍යාපෘති සහ ආධාරයන් ලබාදීමේදී අවදානම් බව පටු ආකාරයෙන් අර්ථ කථනය කිරීම යන වැරැද්ද හේතුවෙන් එය සමාජයේ අසන්තෝෂයට ලක් වී ඇත. මෙම අසතුට නැති කිරීම හෝ පැතිරීම අවම කිරීම පිණිස අනාගතයේදී අදාල බලධාරීන් විසින් වඩා සංවේදීව හා ඔවුන්ගේ මූලික තත්ත්වය පිළිබඳ අවබෝධයෙන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම කළ යුතුය.

සියලුම ගැටුම් හා ගැටළු විසඳීමට සිදුව ඇත්තේ බාහිර උදව් ඇතිව හා සාමූහික විසඳුම් වශයෙනි. මීට පෙර බාහිර මැදිහත්වීම් ධනාත්මක විසඳුමක වැදගත් බව සෑම විටම ඔප්පු කර ඇත. ප්‍රජාව එකිනෙකා අතර වෛරයකින් පසුනොවන නිසා තවමත් ඔවුන් යම් එකඟතාවයකට පත්කර ගත හැකි නිසා ගැටුම් නිරාකරණයට අවස්ථාවක් ඇත. මෙම විසඳුම සාර්ථක වීමට නම් කාලීන හා අවබෝධාත්මක විය යුතුය. මෙතෙක් සාර්ථකව විසඳුණු ගැටුම් සියල්ලම ජනතාවගේ සාමාජීය නොඉවසුම්කාරී මට්ටමකට හෝ පාර්ශ්වයන් දෙකක් එකඟනොවන තත්වයකට පත්වීමට පෙර නිරාකරණය ක්‍රියාවලියෙන් දක්වා ඇත.

ගැටුම් නීත්‍යානුකූල ඉඩම් අයිතිකරුවන් පදනම් කරගෙන සිදුවීමේදී පාර්ශවයන් සාම්ප්‍රදායික යුක්තිය විසඳීමේ ක්‍රියාවලිය මගින් උපදෙස් පතන ලදී. නිදසුනක් ලෙස පාලවිවල ඇති වූ ඉඩම් ආරවුලේදී මිනිසුන් උසාවියේ පිහිට පතන ලද්දේ මොවුන් අර්බුදය හේතුවෙන් ධ්‍රැවීකරණය වී සිටි හෙයින් සාම කමිටු, ආගමික නායකයින් වැනි ප්‍රාදේශීය ව්‍යුහයන් මගින් විසඳුමක් ලබාගත නොහැකි බව දැනුණු හෙයිනි.

පොදු දේවල් සඳහා ගැටුම් ඇතිවීමේදී සංවර්ධන ආයතන වලින් විසඳුම් ලබා ගැනීම සඳහා ඉදිරිපත් විය. නොරොච්චෝලෙහි අවතැන්වූවන් පැමිණීමට පෙර සත්කාරක ප්‍රජාවේ කාන්තා කණ්ඩායමකට ඇතිවූ පොදු සායනයක් පිළිබඳව ප්‍රශ්නය ISRC වෙත යොමු කරන ලදී.

ආණ්ඩුවේ යාන්ත්‍රණ හා ක්‍රියාකාරීන් ආරවුල් නිරාකරණය සඳහා මැදිහත්වීමේදී ගැටුම් පාර්ශ්වකරුවන් ඔවුන් අපක්ෂපාතී ද යන වග දැනසිටීම වැදගත් විය. වනාතවිල්ලුල උඩප්පුල නාගවිල්ලු ප්‍රජාවගේ අත්දැකීම් පෙන්වන පරිදි ගැටුම් විසඳීම සාර්ථකත්වය රඳාපවතින්නේ පාර්ශ්ව දෙකම විසඳුම සාධාරණදැයි සෑහීමකට පත්වූ විටයි.

ඇතැම්විට විවිධ වූ ආරවුල් විසඳීම සඳහා කමිටු පත්කරන ලද අතර ඒවා විවිධ වූ ආකාරයන්ගෙන් ක්‍රියාත්මක වී ඇත. ප්‍රජා නායකයන්ගෙන්, ආගමික නායකයන්ගෙන් හා ප්‍රදේශයේ සංවර්ධන ආයතනවල නියෝජිතයන්ගෙන් ප්‍රජා මූලික සාම කමිටු සමන්විත වී ඇත. මෙම සාම කමිටු ප්‍රාදේශීය ආරවුල් සඳහා ඍජුව මැදිහත් වේ. මෙම කණ්ඩායම් මූලිකව ම ප්‍රාදේශීය වශයෙන් ගොඩනැගී ඇත. මේවා බාහිර ආයතන මඟින් සාමය ගොඩනැංවීම හෝ ආධාරක යාන්ත්‍රණය සඳහා නිර්මාණය වී නැත. ඔවුන්ගේ සාර්ථකත්වය රඳා පවතින්නේ ඔවුන්ගේ ඇති ප්‍රජා සම්බන්ධකම් හා ඔවුනට ගැටුමට සම්බන්ධ වූ පුද්ගලයන්ගේ ඇති ගෞරවය පදනම් කරගෙනයි. එසේම පුද්ගලිකව ආගමික නායකයින් ද ආරවුල් නිරාකරණයේ දී ඔවුන්ට හැකි ආකාරයට යම් කාර්යයක් ඉටු කරයි. ඔවුන් තමන්ගේ ආගමික

බැතිමතුන්ගේ ආරවුල් සමථයකට පත් කිරීම සම්බන්ධයෙන් හා එම ගැටුම් පැතිරීම වැළැක්වීම සඳහා වැදගත් හා සාර්ථක මෙහෙයක් ඉටුකරයි. ඔවුන්ගේ විශ්වාසය සහ ගැටුම් සමග ගනුදෙනු කිරීමට සමත් නිසා මෙම නායකයින් ගැටුමේ මුල් අවස්ථාවේදීම අර්බුදකරුවන් ඔවුන්ව මුලින්ම සම්බන්ධ කරගනු ලබයි.

අනෙකුත් විසඳුම් ක්‍රියාවලීන්වලදී ප්‍රජාවටම බලපෑම් කළ හැකි තනි පුද්ගලයන්, දේශපාලඥයන්, පරිපාලන නිලධාරීන් හා සාම්ප්‍රදායික නීතිමය යාන්ත්‍රණයන් එනම් උසාවිය, පොලීසිය වැනි ඒවායින් සමන්විත වේ. මේ සියලුම ආයතන ගැටුම් නිරාකරණයේ මැදිහත්වීම් වලදී විවිධ වූ සාර්ථකත්වයන් දක්වා ඇත. අධ්‍යනයෙන් නිරාවරණය කරන පරිදි මෙම ක්‍රියාකාරීන්ගේ හා ගැටුමට මූලික වූ පාර්ශ්වයන්ගේ සාමුහික උත්සහයක ප්‍රතිඵලයක් බවත් එමගින් වඩා ස්ථිර සහ ස්ථිරසාර විසඳුම් ලබාගත හැකි බවත් පෙන්වාදී ඇත. අධ්‍යයනයෙන් සොයාගත් පරිදි පුත්තලම බාහිර වශයෙන් සාමකාමී දිස්ත්‍රික්කයක් ලෙස පෙනුණත් එහි ආරවුල් හා ප්‍රචණ්ඩත්වයෙන් යුක්තය. පවත්නා ගැටුම විසින් විවිධ වූ ගැටුම් නිරාකරණ ප්‍රාදේශීය යාන්ත්‍රණ නිර්මාණය සඳහා යොමු වී ඇති අතර එමගින් සාමාන්‍ය සාමකාමී වාතාවරණයක් පවත්වාගෙන යයි.

වඩාත් වැදගත් වන්නේ දිස්ත්‍රික්කයේ කටයුතු කරන බාහිර ආයතන පාරිසරික දුර්වලතාවය වටහාගෙන එම තත්ත්වය වඩාත් අයහපත් වන ආකාරයට වැඩ කටයුතු කිරීමෙන් වැලකී සිටීමය. ප්‍රදේශයේ ආර්ථික සම්පත් සඳහා තරගකාරී බවක් ඇති බව දැන සිටීමත් එය ගැටුමක් සඳහා යොමු විය හැකි බවත් අවදානම් සහිත විවිධ වූ ප්‍රජාවන් හා කණ්ඩායම් අතර සම්පත් සමානව බෙදී යන ආකාරයෙන් කටයුතු කළ යුතු බවත් දිස්ත්‍රික්කයේ විවිධ වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නන් දැනුවත් විය යුතුය. අවදානම් කණ්ඩායම්වලින් ප්‍රතිචාර ලබාගත නොහැකි ව්‍යාපෘතිවල දී ඔවුන් තෝරා ගන්නා ක්‍රියාමාර්ග විනිවිද පෙනෙන සුළු විය යුතු අතර, එමගින් ජනතාවට එම තෝරා ගැනීම පක්ෂග්‍රාහි නොවූ බවට අර්ථකථනය කර ගනියි.

පුත්තලමේ ක්‍රියාත්මක වන දේශීය හා ජාත්‍යන්තර ආයතන තමන්ගේ සංවර්ධන ක්‍රියාකාරකම් ගැටුම් සඳහා සංවේදී වන ක්‍රියාපිළිවෙලකට හැඩගස්වනු ඇත. ප්‍රදේශයේ ක්‍රියාත්මක වන ඇතැම් සංවර්ධන ආයතන අවතැන් වූවන්ගේ සුභ සාධනය සඳහා පැවතිවත් ඒවා සඳහා සත්කාරක ප්‍රජාවගෙන් යම් කොටසක් ඇතුළත් කර ගැනීමට තීරණය කිරීමත් සමගම අවතැන්වූවන් හා සත්කාරක සමාජය සමග වූ ගැටුම් අවම කරගැනීමට හැකියාව ලැබී ඇත.

පුත්තලමේ ක්‍රියාත්මක වන විවිධ ප්‍රාදේශීය යාන්ත්‍රණ ගැටුම්කාරී වාතාවරණයට හැඩගැසුණු දිස්ත්‍රික්කයේ පවත්නා ගැටුම් සඳහා ආමන්ත්‍රණය කරන බාහිර ක්‍රියාකාරීන් සඳහා සහයෝගයක් ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරීමත් අනුමත කරන අතර ඔවුන් වෙනුවට අනෙක් ආයතන ගැටුම් නිරාකරණ ක්‍රියාමාර්ග හා සාමය වර්ධනයක් සිදු නොකරයි.

# 1. හැඳින්වීම

මෙම අධ්‍යයනය සහ මීට සම්බන්ධ සන්නිවේදන මාලාව සකස් කරන ලද්දේ, යුද්ධයෙන් පීඩාවට පත් ජනතාව අතර ගැටුම් නිරාකරණය සහ සාමය පිළිබඳ හැකියා වර්ධනය කිරීමේත් ඉන් ඔබ්බට ගොස් ගැටුම හා සාමය පිළිබඳ ලංකාවේ ඇති පුළුල් කතිකාව පර්යේෂණ පර්යාලෝකයක් තුලින් සාක්ෂාත් කරගැනීමේ මූලික අරමුණ ඇතිවයි.

ඉහත අරමුණ දේශීය දැනුම ගැටුම් කළමණාකරණය සහ නිරාකරණය සඳහා යොදා ගැනීමට පහසුකරණය කිරීමෙන්, ප්‍රජා සංවිධානවල හැකියා වර්ධනය කොට, ප්‍රජා මට්ටමේ ගැටුම් කළමණාකරණය පිළිබඳ දැනට පවතින සහ නව ක්‍රමවේදයන්ට ඇතුළත් කරගත හැකි පර්යාලෝකයන් වර්ධනය කරගැනීම ඔවුන් සමග වැඩකිරීමෙන් ඉටුකරගත හැක.


දත්ත ගවේෂණ, හුමවාරු කරගැනීම්, අන්තර් සම්බන්ධතා ගොඩනැගීම් සහ පුහුණු වැඩසටහන් යොදාගත්, ප්‍රතිනිර්මාණාත්මක ක්‍රියාදාමයක් තුළින් මෙම අරමුණ ඉටුකර ගැනීමට මෙම වැඩසටහනේ කැපවීමක් ඇත. වැඩසටහනේ ඉලක්කගත කණ්ඩායම වන්නේ ප්‍රජා කණ්ඩායම් සහ ප්‍රජා මූලික සංවිධානයි. පුත්තලම දිස්ත්‍රික්කයෙන් ආරම්භ කෙරුණ මෙම වැඩසටහනට රජයේ සහ ජාත්‍යන්තර ආයතනවල ප්‍රතිපත්ති සහ පුද්ගලයන් සමග ද සම්බන්ධකම් ගොඩ නගා ඇත.

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ මූලික අරමුණු රාමුවට යටත්ව සකස් කළ විශ්ලේෂී රාමුවක් තුළ මෙම සමීක්ෂණය සිදුකරන ලදි. පුත්තලම ප්‍රදේශයේ ගැටුමට පාදක වූ සංකීර්ණ සමාජ-ආර්ථික කරුණුත් එම ගැටුම් කළමණාකරණය කරගැනීමට උපකාර වූ ක්‍රියාවලීන් සහ යාන්ත්‍රණයන් දිගුකාලීව සාමය පවත්වා ගැනීමට දායක වූ දීර්ඝ කාලීන ක්‍රියාවලියනුත් හඳුනාගැනීමට මෙම රාමුව උපකාරී විය. දරිද්‍රතාවය, විශ්ලේෂණාත්මක කේන්ද්‍රය ලෙස ගැනීම නිසා අධ්‍යයන කණ්ඩායම මූලික ඉලක්කයෙන් තරමක් ඔබ්බට ගොස් සාමය ඇති කිරීම සහ සාමය පවත්වා ගැනීමෙන් පුත්තලම ප්‍රදේශයේ ගැටුමට මූල හේතු වූ එකිනෙක පරයා යන අවදානම් තරමක් ගැඹුරට අධ්‍යයන කිරීමට අවකාශ ලැබිණ.

# 2. පසුබිම

## හැඳින්වීම


අධ්‍යයන ක්‍රියාවලියේ කොටසක් ලෙස විමර්ෂණය කෙරුණු ද්විතීය දත්ත මෙම කොටසේදී අවධානයට යොමු කරනු ලබයි. මෙහිදී පුත්තලමෙන් ලබාගත් සමාජ-ආර්ථික සහ ජන විකාශනය පිළිබඳ දත්ත සංශ්ලේෂණය කර මෙම අධ්‍යයනයේ සොයා ගැනීම් ලෙස මතුවූ සිද්ධාන්තයන් ද සමග එකතු කර අවශ්‍ය පසුබිම සකස් කෙරිණි. පුත්තලමේ ජන විකාශන ව්‍යුහයත් එහි සමාජ-ආර්ථික නැඹුරුවත් එහි ගැටුම් ඇතිවීමට පැහැදිලිවම සම්බන්ධ වී ඇත. මේ නිසා එම ප්‍රදේශයේ ගැටුම් නිරාකරණය පිළිබඳ යාන්ත්‍රණයන් සහ ක්‍රියාවලීන් හඳුනා ගැනීම සඳහා, එම ප්‍රදේශයේ ජන විකාශනය සහ සමාජ-ආර්ථික රටාවන් පිළිබඳ දැනුවත් වී සිටීම වැදගත්වේ. මෙම කොටසේදී පුත්තලම ප්‍රදේශයේ ජනගහණ සංයුතිය සහ විකාශනය, දරිද්‍රතාව හා සංක්‍රමණය පිළිබඳ දත්ත සහ තොරතුරු ප්‍රාථමික හා ද්විතික දත්ත විශ්ලේෂණය සමග සම්බන්ධ කර උකහා දක්වනු ලැබේ.




**රූප සටහන 2.1 . පුත්තලම දිස්ත්‍රික්කයේ සිතියම (අධ්‍යයනය මඟින් ආවරණය කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ රවුම් කර තිබේ.)**

## 2.1 ජනගහණ සංයුතිය

පුත්තලම් දිස්ත්‍රික්කයේ ජනගහණ සංයුතිය තදින් මිශ්‍රණය වූ බවක් විද්‍යාමාන වේ. 2001 වර්ෂයේ කරන ලද ජනගහණ සංගණනයට අනුව, ප්‍රදේශයේ මුළු ජනගහණය වන 709,677 න් 523,116ක් සිංහල වන අතර 133,134ක් ශ්‍රී ලාංකික යෝනක (මුස්ලිම්) සහ 48,078 ශ්‍රී ලාංකික දෙමළ වේ. මෙම මිශ්‍ර ජනවාර්ගික සංයුතිය ආතුල්‍ය නොවුනද, 1990 වර්ෂයේ සිදුවූ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ ජනගහණයේ ආගමනය, විශේෂයෙන්ම අවතැන්වූවන් ප්‍රදේශයේ ජනතාව සමග පදිංචි වූ පළාත්වලදීවත් නිසැකයෙන්ම විශාල බලපෑමක් ඇතිකරන්නට ඇත. ජාතික ආරක්ෂාව සහ අවතැන්වූවන්ට ස්ථිරසාර විසඳුම් ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2004දී කරන ලද දත්ත සමීක්ෂණයකට අනුව, පුත්තලම දිස්ත්‍රික්කයේ මුළු ජනගහණය 705,342ක් වන අතර ඉන් 61,585ක් අවතැන්වූවන්වේ. මෙම අවතැන්වූවන්ගෙන් 99%ක්ම මුස්ලිම් ප්‍රජාවට අයත්වේ. මෙම මුස්ලිම් අවතැන්වූවන්ගේ සැලකිය යුතු ආගමනය, පසුකලෙක පුත්තලම ප්‍රදේශයේ ජනගහණ සංයුතිය වෙනස්කිරීමට හේතු පාදක විය. නිදර්ශනයක් ලෙස, මන්නාරම ප්‍රදේශයෙන් පලාගිය 66,200ක මුස්ලිම් ජනතාව එම ප්‍රදේශයේ, 2003 වසරේදී සිටි මුළු ජනගහණයෙන් 10%කට සමාන විය.




**රූප සටහන 2.2 පුත්තලම් දිස්ත්‍රිකයේ ජන සංයුතිය**
(මූලාශ්‍රයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2001 සංඛ්‍යාලේඛන ඇසුරින් සකස් කරන ලදී.)

## 2.2 ජනගහණ ව්‍යාප්තිය

පුත්තලම ප්‍රදේශයේ බහුවිධ ජනවර්ගයන් ජීවත්වීමත් ඒට ආවේණිකවූ ජන විකාශනයත් සාමය ඇතිකිරීමේ සහ සාමය පවත්වා ගෙන යාමේ අධ්‍යයනයට වැදගත්වේ.

වගුව 2.1 අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වැඩි ගණනක බහුතරය සිංහල ජනවර්ගයට අයත්වේ. හලාවත සහ නාත්තණ්ඩිය හැර අනෙකුත් සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ජනගහණයෙන් 90%ට වඩා සිංහල ජනවර්ගයට අයත්වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සුළුතරයක අනෙකුත් ජනවර්ග බහුතරය වන අතර දිස්ත්‍රික්කය පුරා මෙවැනි ප්‍රාදේශීය මට්ටමේ කොට්ඨාශ කිහිපයක් ඇත. උදාහරණයක්

ලෙස ශ්‍රී ලාංකික යෝනක (මුස්ලිම්) ජනතාව, පුත්තලම සහ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල බහුතරයවේ.

එසේම, කල්පිටිය, පුත්තලම, මූන්දලම, වනාතවිල්ලුව වැනි ප්‍රදේශ ඉතා මිශ්‍ර ජන වාර්ගිකත්වයකින් යුක්තවේ. මෙම අධ්‍යයනය ගැටුම් අවස්ථා 6ක වර්ධනය සහ එම ගැටුම් විසඳනු ලැබූ ආකාරය පිළිබඳව අවධානය යොමු කරයි. මෙම අවස්ථා හෝ ගැටුම් සිද්ධීන් සිදුවන්නේ ඉහත සඳහන් මිශ්‍ර ජනවාර්ගිකත්වයන්ගෙන් සමන්විත ප්‍රද්ශවලයි. මෙම අධ්‍යයනයේ සොයාගැනීම්වලට අනුව, ජනවාර්ගිකත්වය බොහෝ ගැටුම්වලට බලපා ඇත. වෙනත් සාධක මත ඇතිවූ ගැටුම් අවස්ථා පවා, ප්‍රදේශයේ ජනතාව අතර ඇති ජනවාර්ගික ආතතිය මත අවසානයේ ජනවාර්ගිකත්ව ස්වාභාවයක් ගෙන ඇත.

ක්ෂණිකවම ජනගහණ සංයුතියේ වෙනසක් අවතැන්වූවන්ගේ ආගමනයත් සමග සිදුවූ අතර, ඒ සමගම ගැටුම් හා ආතතීන්ට පදනමක් ඇතිකරමින්, වෙනස් වූ දේශපාලනමය බලයක් සහ වෙනස් අනුග්‍රාහාත්මක පදනමක් ඇති පිරිසක් ඇතිවිය. මෙම වෙනස්කම් ප්‍රදේශයේ ජන විකාශනයේ මූලාශ්‍රයන් වී ඇති අතර, නොයෙකුත් කණ්ඩායම් මෙම ජන විකාශනය අසමාන සැලසීම් සහ පක්ෂග්‍රාහීත්වය පිළිබඳ චෝදනා නැගීමත්, වේදනාත්මක තත්ත්වයන් ඇති කිරීමට හා ඒවා පවත්වා ගැනීමටත් යොදාගනී.

> "සාමාන්‍යයෙන් මිනිසුන් අතර ගැටුම් නැහැ. සමහරවිට ඊට හේතුව වන්නේ ජනගහණයෙන් වැඩි කොටසක් සත්කාරක ජනයාටත් සුළු කොටසක් අවතැන් වූ ජනයාටත් අයත් නිසා විය හැකිය."
>
> (ප්‍රධාන තොරතුරුදායකයා, පි, වනාතවිල්ලුව)

මෙම අධ්‍යයනයේදී සොයාගත් තවත් කරුණක් වූයේ අවතැන් වූ ජනයා, ප්‍රදේශයේ ජනතාව සමග මිශ්‍ර නොවී වෙන්ව ජීවත් වූ ප්‍රදේශවල ගැටුම් තත්ත්වයන් වැඩිපුර ඇතිබවයි. මෙය ප්‍රතිවිරුද්ධව, අවතැන් වූ ජනයා සුළු වශයෙන් ජීවත් වූ ප්‍රදේශ සහ ප්‍රදේශයේ ජනතාවට වඩාත් අනුකලනය වූ ප්‍රදේශවල ගැටුම් තත්ත්වයන් ඉතා අල්ප බව පෙනින.


**වගුව 2.1 ජනවාර්ගිකත්වය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව ජනගහණ සංයුතිය**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | සිංහල | ශ්‍රී ලාංකික දෙමළ | ඉන්දියානු දෙමළ | ශ්‍රී ලාංකික යෝනක | වෙනත් |
|---|---|---|---|---|---|
| **පුත්තලම දිස්ත්‍රික්කය** | **73.71** | **6.77** | **0.31** | **18.76** | **0.44** |
| 1. කල්පිටිය | 28.90 | 12.16 | 0.40 | 58.19 | 0.35 |
| 2. වනාතවිල්ලුව | 54.40 | 5.97 | 0.68 | 38.69 | 0.26 |
| 3. කරුවලගස්වැව | 98.86 | 0.71 | 0.03 | 0.27 | 0.13 |
| 4. නවගත්තේගම | 97.35 | 2.59 | - | 0.02 | 0.04 |
| 5. පුත්තලම | 29.54 | 11.10 | 0.23 | 58.00 | 1.12 |
| 6. මූන්දලම | 40.82 | 21.26 | 0.26 | 37.40 | 0.20 |
| 7. මහකුඹුක්කඩවල | 96.29 | 3.45 | 0.05 | 0.14 | 0.08 |
| 8. ආනමඩුව | 97.45 | 0.60 | 0.02 | 1.80 | 0.13 |
| 9. පල්ලම | 83.06 | 1.70 | 0.07 | 15.10 | 0.09 |
| 10. ආරච්චිකට්ටුව | 91.37 | 7.10 | 1.84 | 0.48 | 0.26 |
| 11. හලාවත | 81.76 | 9.93 | 0.53 | 8.14 | 0.65 |
| 12. මාදම්පේ | 91.41 | 2.57 | 0.52 | 5.24 | 0.26 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 13. මහවැව | 97.38 | 2.19 | 0.10 | 0.15 | 0.18 |
| 14. නාත්තණ්ඩිය | 87.00 | 2.99 | 0.17 | 9.56 | 0.29 |
| 15. වෙන්නප්පුව | 96.51 | 2.46 | 0.42 | 0.21 | 0.40 |
| 16. දන්කොටුව | 95.88 | 2.26 | 0.25 | 0.59 | 1.02 |

(මූලාශ්‍රයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2001)

**රූප සටහන 2.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව ජනගහණ ව්‍යාප්තිය**




(මූලාශ්‍රයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2004 සංඛ්‍යාලේඛන ඇසුරින් සකස් කරන ලදී.)

## 2.3 පුත්තලම ප්‍රදේශයේ දරිද්‍රතාව

1990 වර්ෂයේ පුත්තලම දිස්ත්‍රික්කයේ ජනගහන දරිද්‍රතා දර්ශකය[1] 22%ක් වූ අතර අවතැන්වූවන් ද ඇතුළත් කළවිට මෙම දර්ශකය 31% දක්වා වැඩිවිය. වැඩිවන ප්‍රචණ්ඩත්වය හේතුවෙන් හෝ උතුරෙන් නෙරපා හැරීම නිසා සංක්‍රමණය වූ අවතැන්වූවන් නිසා, ප්‍රදේශයෙන් දුගී ජනයා වැඩිවීමෙන් මෙම දර්ශකය ඉහළ ගියා විය හැකිය. අදාළ කාලය තුළ මෙවැනි වර්ධනයන් වෙනත් ප්‍රදේශවල ද සිදු වී ඇති බැවින් මෙයට වෙනත් හේතූන් ද බලපෑවා විය හැකිය ( පහළ වගු අංක 2.2 බලන්න). එතෙක් ප්‍රදේශයේ පැවති සම්පත් මෙම හදිසි ජන ආගමනයට මුහුණදීමට ප්‍රමාණවත් නොවූ අතර මෙය ඒ වනවිටත් දුර්වලව පැවති පලාතේ ආර්ථිකයට තවත් බරක් විය. එතැන් සිට, පුත්තලම දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩසටහන් රැසක් ක්‍රියාත්මකවේ. එසේ තිබියදීත්, ජනගහණ දරිද්‍රතා දර්ශකය වෙනස් නොවී වසර 2002 දක්වා 31%ක් ව පැවතිණි. නමුත් ඉතා මෑතකදී ජනලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තුමෙන්තුව නිකුත් කළ දත්තවලට අනුව පුත්තලම දිස්ත්‍රික්කයෙන් දරිද්‍රතා මට්ටම විශ්මය ජනක ලෙස 2002 වසරේ තිබූ 31% සිට 2006 වසරේදී 13% දක්වා අඩු වී ඇත. නොයෙකුත් කණ්ඩායම් විසින් දරිද්‍රතාවය සහ සමාජ තත්ත්වයන් පිළිබඳ ඉදිරිපත් කර ඇති ආර්ථික උපනති හා වෙනත් ගුණාත්මක තොරතුරු

1 ජනගහන දරිද්‍රතා දර්ශකය අර්ථ නිරූපණය කර ඇත්තේ දරිද්‍රතා රේඛාවට පහළින් සිටින ජනගහණ ප්‍රතිශතය වශයෙනි.

ආශ්‍රයෙන් මෙම විශ්මය ජනක අඩුවීම අවබෝධ කරගැනීමට සහායක් නොලැබේ. ආධාර ගලා ඒමෙන් වසර කීපයකට පසුව එහි ප්‍රතිඵලයන් ලෙස පුත්තලමේ ජනතාවගෙන් පාරිභෝජන රටාවන් වෙනස් වීමට ඉඩ ඇති මුත්, එය එසේ වේ යැයි සිතිය නොහැක.

තවත් එවැනි සාධකයක් විය හැක්කේ ප්‍රදේශයේ ජනතාව එම ප්‍රදේශයේම ආයෝජනය කිරීමයි. මෙම අධ්‍යයනයට ප්‍රතිචාර දැක්වූවන්ට අනුව, අවතැන්වූවන්ගේ පැමිණීමෙන් පසුව ප්‍රදේශයේ යටිතල ව්‍යුහය සීඝ්‍රයෙන් දියුණු වී ඇත. මෙම දියුණුවීම් සහ තමන්ගේ මූලෝත්පත්ති ප්‍රදේශවලට නැවත යාමට නොලැබේය යන නොබිණු වැටහීම, අවතැන්වූ ජනතාව එම ප්‍රදේශයේ ඵලදායී ආයෝජනයන් කර සුළු ව්‍යාපාරයන් ආරම්භ කිරීමෙන්, ප්‍රදේශයේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීමට දායකවීමට පෙළඹවූවා විය හැක. 1995-.96 වර්ෂවල දරිද්‍රතාවයට අවතැන්වූවන්ගේ ගලා ඒම හේතුවක් වූවා සේම, එම අවතැන්වූවන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් හේතුවෙන් පසු වර්ෂවල තත්ත්වය යහපත් වූවා සේද සැලකිය හැකිය. මේ අනුව 1990 වසරේ සිට 1995 වසර දක්වා, 22% සිට 31% දක්වා ජනගහන දරිද්‍රතා දර්ශකයේ සිදුවූ අසාමාන්‍ය වෙනසක්, නිශ්චලනය සහ නැවත ජනගහන දරිද්‍රතා දර්ශකයේ අඩුවීමත් පුත්තලම දිස්ත්‍රික්කයේ ආර්ථික තත්ත්වයට අවතැන්වූවන්ගේ දායකත්වයේ ඇති තීරණාත්මකභාවය පිළිබිඹු කරයි.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්ට අදාළව ප්‍රදේශයේ ඇතිවූ සුභදායී උපනතීන් ද දරිද්‍රතාවය පහළ දැමීමට දායක වූවා විය හැක. වියළි කලාප පළතුරු වගාව පුත්තලම ප්‍රදේශයේ වසර ගණනාවක සිටම සිදුවූවත්, 2002 වසරේදී නොරොච්චෝලෙ හි ඇති කරන ලද අලුත් වෙළෙඳ පොළ වැනි අමතර යටිතල පහසුකම් සැපයීම් කුඩා පරිමාණ කෘෂිකර්මාන්තවල නියැලෙන්නන්ගේ ආර්ථික ප්‍රතිලාභ වර්ධනයට බලපෑවා විය හැකිය. ප්‍රදේශයේ ප්‍රධාන භෝගයක් වන පොල් මිල ඉහළ යාමද ප්‍රදේශයේ සිටින මහා පරිමාණ ඉඩම් හිමියන්ගේ මෙන්ම කුඩා ප්‍රමාණයේ නිෂ්පාදකයන්ගේද ආදායම වැඩි කිරීමට දායකවන්නට ඇත.

මෙම අධ්‍යයනට අදාළ ක්ෂේත්‍ර පර්යේෂණ 2006 වසරේ පෙබරවාරි මාසයත් 2007 වසරේ ඔක්තෝම්බර් මාසයත් අතරේ සිදුවිය. මෙම කාලය තුළ අධ්‍යයනයට ප්‍රතිචාර දැක්වූවන්ට අනුව, අධ්‍යයනයට අදාළ පවුල්වල ගෘහස්ථ දරිද්‍රතාවය යහපත් වී නැත. 1995 සිට සීඝ්‍රලෙස සිදු වූ ආහාර ද්‍රව්‍යවල හා ඉන්ධන මිල ඉහළයාම මෙම දරිද්‍රතාවය තවදුරටත් වැඩිකළා විය හැක.

අධ්‍යයනය කරන ලද සියළුම ගැටුම් සිදුවීම්වලට මූලික හේතුව වී ඇත්තේ සමාජ-ආර්ථික ප්‍රශ්නයයි. සාර්ව දත්තයන්ට අනුව දරිද්‍රතා මට්ටම් පහළ ගොස් ඇතත්, පවතින සමාජ-ආර්ථික තත්ත්වයන් ප්‍රදේශයේ ජනතාව අතර ගැටුම් හෝ මතභේද ඇති කිරීමට හේතුවනු ඇත.

සංඛ්‍යා වර්ධනයන් නොසලකා තිබියදීත්, දිස්ත්‍රික්කය තුළ සමාජ ආර්ථික දත්ත දිගින් දිගටම වැදගත් සහ විවාදශීලී විය. පුත්තලමේ දරිද්‍රතා වර්ධනය, සමාජ ඒකාබද්ධතාවය හෝ සාමයේ වර්ධනය සමාන්තරව ගැලපිය නොහැක.

**2.2 වගුව දිස්ත්‍රික්ක අනුව ජනගහණ දරිද්‍රතා දර්ශකය**

| දිස්ත්‍රික්කය | 1990/91 | 1995/96 | 2002 | 2006/07 |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා | 26.1 | 28.8 | 22.7 | 15.2 |
| කොළඹ | 16 | 12 | 6 | 5 |
| ගම්පහ | 15 | 14 | 11 | 9 |
| කළුතර | 32 | 30 | 20 | 13 |
| මහනුවර | 36 | 37 | 25 | 17 |
| මාතලේ | 29 | 42 | 30 | 19 |

| | | | | |
|---|---|---|---|---|
| නුවරඑළිය | 20 | 32 | 23 | 34 |
| ගාල්ල | 30 | 32 | 26 | 14 |
| මාතර | 29 | 35 | 28 | 15 |
| හම්බන්තොට | 32 | 31 | 32 | 13 |
| කුරුණෑගල | 27 | 26 | 25 | 15 |
| පුත්තලම | 22 | 31 | 31 | 13 |
| අනුරාධපුරය | 24 | 27 | 20 | 15 |
| පොළොන්නරුව | 25 | 20 | 24 | 13 |
| බදුල්ල | 31 | 41 | 37 | 24 |
| මොණරාගල | 34 | 56 | 37 | 33 |
| රත්නපුර | 31 | 46 | 34 | 27 |
| කෑගල්ල | 31 | 36 | 33 | 21 |
| මඩකලපුව | * | * | * | 11 |
| අම්පාර | * | * | * | 11 |

* - දත්ත සොයාගත නොහැක.

2001 වර්ෂයේ කරන ලද ජන සංගණනයට අනුව, පහත දැක්වෙන පරිදි පුත්තලම් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 3ක්ම ලංකාවේ දුගීම දිස්ත්‍රික්ක 10 අතරට වැටේ. කල්පිටිය, මූන්දලම හා වනාතවිල්ලුව මේ කොට්ඨාශ 3වේ.

**වගුව 2.3 ලංකාවේ දිළිඳුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ජනගහණ දරිද්‍රතා දර්ශකය |
|---|---|
| 1. සියඹලාආණ්ඩුව (මොණරාගල) | 51.8 |
| 2. රිදීමාලියද්ද (බදුල්ල) | 51.2 |
| 3. මීගහකිවුල (බදුල්ල) | 46.5 |
| 4. කන්දකැටිය (බදුල්ල) | 46.1 |
| 5. කල්පිටිය (පුත්තලම) | 45.3 |
| 6. මූන්දලම (පුත්තලම) | 41.1 |
| 7. මදුල්ල (මොණරාගල) | 40.7 |
| 8. වනාතවිල්ලුව (පුත්තලම) | 40.3 |
| 9. ඇළපාත (රත්නපුර) | 40.1 |
| 10. වැලිගෙපොළ (රත්නපුර) | 39.2 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2001
සටහන: ජනගහණ දරිද්‍රතා දර්ශක: දරිද්‍රතා රේඛාවට පහළින් සිටින ජනසංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස

පුත්තලම් දිස්ත්‍රික්කයේ අවතැන්වූවන් ජීවත්වීම එහි දරිද්‍රතාවයට හේතුව බව අවතැන්වූවන් නොවන ජනතාවගේ සුලභ සංජානනයි. අවතැන්වූවන්ට විවිධ සහනාධාර ලැබීමෙන්, ප්‍රදේශයේ සත්කාරක ජනතාව අවතැන්වූවන් සමග සම්පත් සහ ආධාර වෙනුවෙන් තරගකරන තත්ත්වයට පත්වී සිටිති. මෙම තත්ත්වය ප්‍රදේශයේ දරිද්‍රතා මායිමේ සිටි සත්කාරක ප්‍රජාවගෙන් කොටසක් තවදුරටත් දරිද්‍රතාවයටම

තල්ලු කිරීම හේතුවිය. සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලින් ලැබෙන මහා පරිමාණ දත්ත මෙම ප්‍රත්‍යක්‍ෂය සනාථ කරයි. පහත වගුවෙන් පෙන්වන පරිදි, අවතැන්වූවන්ගෙන් 55.14%ක් කල්පිටියේ පදිංචි වී සිටින අතර එහි ජනගහන දරිද්‍රතා දර්ශකය 45.3%ක් ලෙස පවතී. කල්පිටිය, ලංකාවේ පස්වැනියට දරිද්‍රතාවය වැඩිම ප්‍රදේශයයි.

මෙයට ප්‍රතිවිරුද්ධව, පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ටාශයේ අවතැන්වූවන්ගේ ප්‍රතිශතය 33.35%ක් වන අතර එහි ජනගහන දරිද්‍රතා දර්ශකය 25.08%කි.

අවතැන්වූවන් සිටීම හා පරිභෝජන දරිද්‍රතා අනුපාතය අතර සරල හා ඍජු සම්බන්ධතාවයක් නැති බවට මෙම අධ්‍යයන කණ්ඩායම තර්ක කරන්නේ, ද්විතිය දත්ත සහ ප්‍රදේශයේ සමහර පුද්ගලයන්ගේ සංජානනයන් අතර දෘෂ්‍යමාන සම්බන්ධතාවයක් තිබියදීත්ය.

**වගුව 2.4 පුත්තලම දිස්ත්‍රික්කයේ අවතැන්වූ ජනගහණය සහ ජනගහණ දරිද්‍රතා අනුපාතිකය**

| කාණ්ඩය | 1990--.1991 | 1995-.1996 | 2001.-2002 | 2006 |
|---|---|---|---|---|
| ජනගහණ දරිද්‍රතා අනුපාතිකය | 22 | 31 | 31 | 13 |
| අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ ජනගහණය | 80, 000 | 52,555 | 81,707 | 63,145 |

මූලාශ්‍රඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, CPA, UNHCR

වගු අංක 2.4 න් පුත්තලම් දිස්ත්‍රික්කයේ ජනගහණය සහ ජනගහණ දරිද්‍රතා අනුපාතිකය පෙන්නුම් කළත් මෙයින් අවතැන්වූවන්ගේ පලාජ්ම සහ ප්‍රදේශයේ දරිද්‍රතා මට්ටම අතර පැහැදිලි සහසම්බන්ධතාවයක් පෙන්වන්නේ නැත.

පුත්තලම ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය තුළ ඉහළ අවතැන්වූවන් ප්‍රමාණයක් සිටීමත් සංසන්ධනාත්මකව අඩු දරිද්‍රතා මට්ටමක් පැවතීමත් නාගරික ස්වාභාවයක් ලෙස ප්‍රදේශයේ ඇති සාපේක්‍ෂව යහපත් යටිතල පහසුකම් හා සේවාවන් නිසාත් වඩා හොඳ ජීවනෝපා අවස්ථා නිසාත් සිදු වූවක් විය හැක.

**වගුව 2.5 තෝරාගත් ප්‍රදේශීය ලේකම් කොට්ඨාශවල අවතැන්වූවන්ගේ ජනගහන ව්‍යාප්තිය**

| කොට්ඨාශය | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|
| කල්පිටිය | 34,821 | 55.14 |
| වනාතවිල්ලුව | 2,008 | 3.18 |
| පුත්තලම | 20,994 | 33.25 |
| මූන්දලම | 5,322 | 8.43 |
| **එකතුව** | 63,145 | |

මූලාශ්‍රයඃ UNHCR, 2006

පුත්තලමේ දරිද්‍රතාවය අවතැන්වූවන්ට පමණක් සීමා වී නැත. මහකුඹුක්කඩවල, නවගත්තේගම සහ පල්ලම වැනි කොට්ඨාශ ද ලංකාවේ දරිද්‍රතාවයට අතින් උග්‍රම කොට්ඨාශ 119 අතරට ගැනෙන අතර එහි ජනගහණ දරිද්‍රතා දර්ශක අනුපාතිය 20.2 සහ 30.9 අතරවේ. අවතැන්වූවන් පිළිබඳ යුනෙස්කෝ සංඛ්‍යාලේඛනවලට අනුව කල්පිටිය, වනාතවිල්ලුව, පුත්තලම, මූන්දලම ප්‍රදේශවලට පමණක් සීමා වී ඇතිබවක් පෙනේ.

## 2.4 සංක්‍රමණ උපනතීන්

අධ්‍යයනය පුරාම, ගැටුම් පරිසරයට සහ ප්‍රදේශයේ සමාජ ආර්ථික වෙනස්කම්වලට සම්බන්ධව සංක්‍රමණය නැවත නැවතත් මතුවිය. පුත්තලම දිස්ත්‍රික්කයේ ඉතිහාසය ගෙන බැලූ කලද පුත්තලම විශාල වන ආගමනවල කේන්ද්‍රය ලෙස සෑම අවස්ථාවකම පැවති බව පැහැදිලිවේ. මේ ආගමන හේතුවෙන් ප්‍රදේශයේ ජනවිකාශනය පිළිබඳ අනන්‍යතාවය අවස්ථා ගණනකදීම වෙනස්කම්වලට භාජනය වී ඇත.

*පුත්තලමේ ජන ආගමනය - ඉතිහාසය කෙටියෙන්*

සංක්‍රමණ හා සම්බන්ධව පුත්තලමට දිගු ඉතිහාසයක් ඇත. බුද්ධ වර්ෂ 543දී විජය රජු ලංකාවට පැමිණි බව සැලකෙන තම්මැන්නා නමින් හඳුන්වන ප්‍රදේශය වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇත. කෝට්ටේ රාජධානිය සමයේත් IV වන පරාක්‍රමබාහු රජුගේ කාලයේදීත් හලාවත, පුත්තලම සහ මාදම්පේ වරායන් වෙනත් වෙළෙඳාමේ යෙදෙන ජාතීන්ගේ නැව්වලට ආගන්තුක සත්කාර සපයන වෙළෙඳ මධ්‍යස්ථානයන් විය. 1505 වර්ෂයේ දිවයිනට පැමිණි පෘතුගීසීහු 1559 වර්ෂයේදී පුත්තලම ප්‍රදේශයේ පාලන බලය අත්පත් කරගත්හ. ඉන්දියාවේ රාමේෂ්වරන් ප්‍රදේශයේ දකුණු කොටසේ මෝගල් අධිරාජ්‍යයාගෙන් එල්ලවූ පහරදීමකට පසුව තලෙයිමන්නාරමේත් පසුව මන්නාරමේත් පදිංචියට පැමිණ පවුල් 18ක්, බීමට සුදුසු ජලය සොයාගැනීමට අපහසු වූ නිසා අවසානයේ උඩප්පු ප්‍රදේශයේ පදිංචි වී ඇත. මෙම කණ්ඩායමෙන් පැවත එන්නන් තවමත් මෙම ප්‍රදේශයේ පදිංචි වී සිටින අතර වෘත්තියක් ලෙස ධීවර කර්මාන්තයේ යෙදෙයි. 1695දී කල්පිටිය ලන්දේසීන්ගේ ග්‍රහණයට හසුවිය.

(මූලාශ්‍රයඃ අමතර අධ්‍යයන වාර්තාව, විනිවිඳ)

*තබ්බෝව යෝජනා ක්‍රමය*

වියළි කලාපයේ ගොවි ජනාවාස සංවර්ධනය කිරීමේ වැඩ සටහනේ පළමු අදියර යටතේ නාච්චදූව (අනුරාධපුර දිස්ත්‍රික්කය), බෙරගම (හම්බන්තොට දිස්ත්‍රික්කය) සහ තබ්බෝව (පුත්තලම දිස්ත්‍රික්කය) වැනි ජනාවාස ඇතිකර ගොවි ජනතාවට ඉඩම් බෙදා දී, එම ප්‍රදේශවල එතෙක් පැවති වාරිමාර්ග ක්‍රම සහ දිය ඇළි ප්‍රතිසංස්කරණය කර වාරිමාර්ග පහසුකම් සපයා දෙන ලදි (ජී. එල්. පීරිස්, 2006). පුත්තලම දිස්ත්‍රික්කයේ තබ්බෝව, කොට්ටුකාච්චිය සහ මහඋස්වැව ලංකාවේ පළමු වාරිමාර්ග ක්‍රම 28ට අයත්වේ. 1928 වසරේදී තබ්බෝව යෝජනා ක්‍රමය යටතේ ගොවියන් 29 දෙනෙකුට ඉඩම් අක්කර 5 බැගින් බෙදාදෙන ලදි. මෙම පදිංචිකරුවන් සිංහල, දෙමළ සහ මුස්ලිම් ජන කොටස්වලට අයත් විය.

*ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රම*

1927 සිටම ඉඩම් බෙදාදීමේ යෝජනා ක්‍රම තිබුණත් නිදහසින් පසු ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රම යටතේ ඉඩම් බෙදා දීම විශාල වශයෙන් වැඩිවිය. ග්‍රාමීය ප්‍රදේශවල ජනගහණය වැඩි වී, රජයේ ඉඩම් දුබල වනවිට, 1950 ඉඩම් පවරාගෙන ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රම පවත්වා ගෙන යාමට රජයට අවකාශ ලැබිණ. ග්‍රාමීය සංවර්ධනය මූලෝපාය යටතේ, ඉඩම් නැති ගොවීන්ට ඉඩම් ලබාදී දරිද්‍රතාවය දුරු කිරීමේ අරමුණ ඇතිව මෙම යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන ලදි (ජී. එල්. පීරිස්, 2006).

*විජයකටුපොත යෝජනා ක්‍රමය*

අක්කර 3ක කුඹුරු ඉඩම් සහ අක්කර 1 3/4 ක නිවාස සෑදීමට ඉඩම් කැබලි වශයෙන්, පවුල් 327කට ඉඩම් ලබාදෙමින් මෙම යෝජනා ක්‍රමය 1951-1953 අතර ක්‍රියාත්මක විය. විල්පොත ගොඩ ගොවි ජනපද ඇතිකිරීමේ වැඩ සටහන යටතේ 1956-1960 අතර, පවුල් 510කට අක්කර 5 බැගින් ලබාදෙන ලදි. තවත් රජයට පවරා ගත් ඉඩම් 1972 සිට වරින් වර ඉඩම් නැති පුද්ගලයන් අතර බෙදා දෙන ලදි. 1988දී ආනමඩුව කොට්ඨාශය ඉලක්ක කරගනිමින් ගම්උදාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ අතර, මීට

සමාන්තරව, තෝරාගත් ප්‍රදේශවල, ඉඩම් අයිතිය සහ නිවාස සාදා ගැනීමට මිනිසුන්ට ආධාර සැපයූ උදාගම් සංකල්පය හඳුන්වා දෙන ලදී.

1990-1991 අතර යුද්ධය නිසා වරින් වර උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ජනතාව පුත්තලම දිස්ත්‍රික්කයට සංක්‍රමණය විය. මෙම ජනයා බලහත්කාරයෙන් තමන්ගේ ගේදොරවලින් ඉවත් කර, ඔවුන්ගේ අකමැත්තෙන් මෙසේ සංක්‍රමණය වීමට සැලැස්වූ පුද්ගලයෝය.

අතිරේක අධ්‍යයනයට අනුව පුත්තලමේ විශාලම ජන සංක්‍රමණය 1990 ඔක්තෝම්බර් 21 වන දින සිදුව ඇත. මෙසේ පැමිණි ජනයා, එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් බලහත්කාරයෙන් යාපනය, මන්නාරම, මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක වලින් පිටමං කළ මුස්ලිම් ජනතාව වේ.

අතිරේක අධ්‍යයනයට අනුව, මෙම සිද්ධියට සමාන්තරව තවත් විශාල ජන ගලනයක් සිදුවිය. ඒ මන්නාරම දිස්ත්‍රික්කයේ මායිම් ගම්මානවල සිටි ජනයා වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දුෂ්කර සහ අභ්‍යන්තර ප්‍රදේශවලට මාරුවීමයි. රාල්මඩුව ගමේ පවුල් 85ක්, පරණ එළුවන්කුලම ගමේ පවුල් 60ක් සහ අළුත් එළුවන්කුලම ගමේ පවුල් 97ක් මෙසේ පදිංචිය වෙනස් කළහ. මේ කාලය තුළ තවත් සිංහල සහ දෙමළ පවුල් ද පුත්තලම දිස්ත්‍රික්කයේ පදිංචියට පැමිණියහ.

**වගුව 2.6 ආරම්භක ප්‍රදේශ අනුව පවුල් සංඛ්‍යාව**

| දැනට පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ආරම්භක පදිංචි ප්‍රදේශය | පවුල් සංඛ්‍යාව |
|---|---|---|
| වනාතවිල්ලුව | මන්නාරම | 585 |
| වනාතවිල්ලුව | රාල්මඩුව, අළුත් එළුවන්කුලම, පරණ එළුවන්කුලම (මායිම් ගම්මානවල සිට) | 242 |
| මූන්දලම | මන්නාරම, මුලතිව්, යාපනය | 1442 |
| කල්පිටිය | මන්නාරම, මුලතිව්, කිලිනොච්චිය යාපනය | 8759 |
| පුත්තලම | යාපනය, මන්නාරම, මුලතිව් | 6156 |

මූලාශ්‍රය : විනිවිද දිස්ත්‍රික්ක සමීක්ෂණය, 2008

මෙම ජන සංක්‍රමණයන්ට හේතුවී ඇත්තේ මුහුණට මුහුණ කෙරුණු තර්ජන, බලහත්කාරයෙන් නෙරපා දැමීම, උතුරේ සහ මායිම් ගම්මානවල ඇති ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ බිය වීමයි. අතිරේක අධ්‍යයනයට අනුව, මෙවැනි හේතුන් මත පැමිණි ජනයා දැනට අවුරුදු 18කටත් වැඩි කාලයක් තිස්සේ මූන්දලම, කල්පිටිය, පුත්තලම සහ වනාතවිල්ලුව ප්‍රදේශවල ජීවත්වෙති.

අතිරේක අධ්‍යයනය තවදුරටත් පෙන්වන්නේ, මුලදී සත්කාරක ප්‍රජාව විසින් අවතැන්වූවන්ට ආධාර ලෙස ලබාදුන් සියල්ල, පසු කලෙක අවතැන්වූවන්ගේ අයිතිවාසිකම් බවට පත්වූ බවත් ඒ අනුව අවතැනවූවන් ප්‍රදේශයේ සම්පත් සහ සේවාවන් පාලනය කරන හෝ අනිසිලෙස පරිහරණය කරන බවට සංජානනයක් ඇතිවූ බවත්ය.

මේ සියල්ලේ ප්‍රතිඵලය මෙසේ සාරංශ කළ හැක;

- අවතැන්වූවන්ගේ පැමිණීමත් සමග පුත්තලමේ සත්කාරක ප්‍රජාව තුළ සම්පත් සමසේ බෙදී නොයෑම පිළිබඳ හැඟීම් වැඩිවීම.
- දිස්ත්‍රික්කයේ සත්කාරක ජනතාව විසින් තනිවම භුක්ති විඳින ලද පලාතේ රැකියා අවස්ථාවලට ඇති තරගය අවතැන්වූවන්ගේ පැමිණීමත් සමගම වැඩි වීම සහ රැකියා බෙදාගන්නා තත්ත්වයක් ඇතිවීම.

- ප්‍රමාණවත් නොවන සේවා සැපයුම් නිසා ඇතිවන ගැටළු

- විශේෂයෙන්ම අවතැන්වූවන්ගේ පදිංචිය දිස්ත්‍රික්කයේ ස්ථිර ස්වාභාවයක් ගැනීම තුළ අවතැන්වූවන්ට ආධාර උපකාර කිරීම තමන්ට කරදරයක් ලෙස සත්කාරක ප්‍රජාවට දැනෙන්නට පටන් ගැනීම.

- සමහර වරප්‍රසාද ප්‍රදේශයේ සිටින අනෙකුත් ජනතාවට නොලැබී අවතැන්වූවන්ට පමණක් ලැබීම.

- අවතැන්වූවන් ප්‍රදේශයේ ඉඩම් මිලට ගැනීමට නැඹුරු වීම නිසා ඉඩම් මිල අධික ලෙස ඉහළ යාමෙන් සත්කාරක ප්‍රජාවට අභියෝගාත්මක තත්ත්වයක් ඇතිවීම.

- වනාතවිල්ලුව ප්‍රදේශයේ අවතැන්වූවන්ට දීර්ඝ කාලීනව වියළි ආහාර ආධාර ලැබීම ඔවුන්ට ලැබෙන විශේෂ වරප්‍රසාදයක් ලෙස ප්‍රදේශයේ අනෙකුත් ජනතාවට පෙනීම.

- සමහර ප්‍රදේශවල මත්ද්‍රව්‍ය භාවිතය හා අයථා පාවිච්චිය වැඩිවීම.

- සාමාන්‍ය පරිපාලන ක්‍රියාවලීන් පවත්වා ගැනීමේ අපහසුව. (සමහර කණ්ඩායම් රාජ්‍ය නොවන සංවිධානවල බලය තමන්ට එකතුකර ගැනීම නිසා)

- රාජ්‍ය නොවන සංවිධාන තම ව්‍යාපෘති සඳහා අවතැන්වූවන් පමණක් යොදාගැනීමෙන්, ප්‍රදේශයේ ව්‍යාපෘති ක්‍රියාත්මක වන පළාත්වල අවතැන්වූවන්ගේ සහ අවතැන් නොවූ ජනකොටස් අතර වෙනස්කම් වර්ධනය වීම.


අවතැන්වූවන්ගේ සංක්‍රමණයෙන් ඇතිවූ බලපෑම ද එම පුද්ගලයන් කලින් සිටි ප්‍රදේශවල දේශපාලනමය වාතාවරණය යටතේ අවබෝධ කරගැනිණි. මතභේද ඇති නොකරන ජනකොටසක් වූ මුස්ලිම් ජනතාව ගැටුමට අදාළ ප්‍රදේශවන උතුරු නැගෙනහිරින් නෙරපා හැරීම එම ගැටුමේ ස්වාභාවය වෙනස් කිරීමට සාධක විය.

උතුරෙන් ආගමනය වූ අවතැන්වූ ජනතාව, දිස්ත්‍රික්කයේ විශාලතම ජන ආගමනය'යැයි සංජානනයක් පුත්තලම් දිස්ත්‍රික්කයේ ජනතාව අතර පවතියි. ලංකාවේ විවිධ දිස්ත්‍රික්කවලින් පුත්තලමට සංක්‍රමණය වූ පුද්ගලයන්ගේ ඉතිහාසය සලකා බැලීමේදී, සංක්‍රමණිකයන් වැඩිම ප්‍රමාණයක් සංක්‍රමණය වී ඇත්තේ කුරුණෑගල හා ගම්පහ දිස්ත්‍රික්කවලින් බව පෙනේ. පුත්තලම ප්‍රදේශයේ සැලකිය යුතු මුස්ලිම් ජනතාවක් සිටියත්, අවතැනුවූවන් ද මෙම මුස්ලිම් ජන කොටසමටම අයත් වුවත් උතුරින් පැමිණි ජනතාව අවතැන්වූවන් ලෙස හංවඩු ගැසීම, එම අවතැන් වූ ජනතාවගේ ජීවන තත්ත්වයත් ජන කොටස් අතර සම්බන්ධතාවයත්, අවතැන් වූ ජනතාවට සත්කාරක ප්‍රජාවට ඔබින සේ හැඩගැසීමට සහ ඔවුන් සමග එකමුතුව ජීවත්වීමට ඇති හැකියාටත් බලපෑමක් වී ඇත.

1990 එල්ටීටීය විසින් පිටුවහල් කිරීමෙන් පසු අවතැන්වූවන් මන්නාරම, යාපනය සහ මුලතිව් ප්‍රදේශවලින් පැමිණ පදිංචි විය. මෙසේ පදිංචිවූ වැඩිදෙනා මුස්ලිම් ජනයායි. සිංහල හා දෙමළ සංක්‍රමණිකයන් 1995 වර්ෂයේ යුද්ධය නිසා පුත්තලමට පැමිණ පදිංචි වූහ. එල්ටීටීය විසින් මුස්ලිම් ජනයා පිටුවහල් කිරීම සැලසුම් සහගතව සිදුකළ නිසා ඉතා කෙටි කාල සීමාවක් තුළ සත්කාරක දිස්ත්‍රික්කවලට ඉතා විශාල සංක්‍රමණිකයන් පිරිසක් පිළිගැනීමට සිදුවිය.

මෙම අධ්‍යයනයට තොරතුරු සැපයූවන්ට අනුව, මෙම සංක්‍රමණිකයන් පැමිණීමත් සමග ප්‍රදේශයට පැමිණි සංවර්ධනය පිළිබඳ සංවිධාන අවතැන්වූවන් ගැන පමණක් අවධානය යොමු කරන අතර බොහෝවිට ඔවුන්ගේ මැදිහත්වීම් වලදී අනෙකුත් ප්‍රදේශ සහ අවධානම් සහගත තත්ත්වයේ සිටින ජන කණ්ඩායම් පිළිබඳව අවධානයට යොමු නොකරයි. සාම කමිටුවල සාමාජිකයන් සමග කළ සමහර සම්මුඛ සාකච්ඡාවලදී මෙම කරුණ ඉස්මතු විය. ඔවුන්ට අනුව, විශේෂයෙන්ම අවතැන්වූවන් පුත්තලමට පැමිණීමෙන් පසු මුල් වසර කීපය තුළ බොහෝ ව්‍යාපෘති අවතැන්වූ ජනතාව සහ ඔවුන් ජීවත්වූ ප්‍රදේශවලට සීමා විය. ඔවුන්ගේ අදහසට අනුව, පුත්තලම ප්‍රදේශයේ තවත් භූමි ප්‍රදේශවලට සහ ජන කොටස්වලට තමන්ගේ සහය අවශ්‍ය බව මෙම ව්‍යාපෘති ආරම්භ කරන සංවිධාන දැනුවත් වී සිටිය යුතුය. පුත්තලම දිස්ත්‍රික්කයේ අභ්‍යන්තරයේ අනුරාධපුර දෙසට ඇති තනිවූ ප්‍රදේශවල ජනයාගේ ඉච්ඡාභංගත්වයේ සීමාවන් ඉක්මවා ගියහොත් එය තවත් ප්‍රචණ්ඩ ගැටුම් ඇති කිරීමකට හේතුවිය හැකිබව මොවුන් තවදුරටත් ප්‍රකාශ කළේය.

**වගුව 2.4 ආරම්භක දිස්ත්‍රික්ක අනුව සංක්‍රමණික ජනගහණය**




මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2004

## 2.5 අධ්‍යයන ක්‍රියාවලිය

අධ්‍යයන ක්‍රියාවලිය සංනිවේදන මූලධර්මවලට අනුකූලව සැකසුණු අතර, අධ්‍යයනයේ සොයාගැනීම් හැකිතාක් දුරට ප්‍රදේශයේ සංවිධානවලට ප්‍රයෝජනවත් වීමට වගබලා ගන්නා ලදි. අනාගතයේ විවිධ අවස්ථාවලදී එහි ප්‍රගතියේ සහ මතුවන ප්‍රතිඵල පිළිබඳ සවිස්තරාත්මක ප්‍රතිචාර ලබාදීමේ සහ ලබා ගැනීමේ ක්‍රියාමාලාවක් ද පවත්වා ගෙන යන ලදී. මෙම අධ්‍යයනයේ අවසන් ප්‍රතිඵල මෙම ප්‍රදේශයේ ආයතනවල ප්‍රයෝජනය සඳහා වේ.

**මූලික ක්ෂේත්‍ර පර්යේෂණ** -

මූලික වශයෙන් ක්ෂේත්‍ර සම්මුඛ සාකච්ඡාවලදී ප්‍රාදේශීය සංවිධානයක් වන විනිවිද සංවිධානය නියෝජිතයන්ට කථා කිරීමේ අවස්ථාව අධ්‍යයන කණ්ඩායමට ලැබිණ. මෙම අධ්‍යයනය මුලින්ම යෝජනා කරන ලද්දේ විනිවිද සංවිධානයේ ප්‍රධානියා විසිනි. මූලික තොරතුරු සපයන්නන් හඳුනාගැනීමටත් අධ්‍යයනයට අදාළ කරුණුවලට බලපාන දේශපාලන හා සාමාජයීය ලැදිකම් පිළිබඳ අධ්‍යයන කණ්ඩායමට මූලික අත්දැකීමක් ලබාගැනීමටත් මෙම ක්ෂේත්‍ර චාරිකා උපකාරී විය.

**"ස්නෝබෝලින්" ආයතන (Snowballing institutional - එක් එක් තොරතුරුදායකයන්ගෙන් ලබාගත් තොරතුරු අනුව ආයතන තෝරා ගැනීම), ප්‍රධාන තොරතුරුදායකයින් සහ කණ්ඩායම් සාකච්ඡා** -

අධ්‍යයන කණ්ඩායම ***'ස්නෝබෝලින්'*** නියැදි ක්‍රමය පාවිච්චි කර ප්‍රතිචාර දක්වන්නන් තෝරාගන්නා ලදි. පුත්තලමේ ගැටුම් පරිසරය අවබෝධ කර ගැනීම සඳහාත් ප්‍රධාන පාර්ශ්වකරුවන් හඳුනා ගැනීම සඳහාත් අධ්‍යයනයේ ඉදිරි කොටස් සඳහා පදනම සපයන, ගැටුම් රේඛාවල (සිද්ධීන්) පරාසය හඳුනා ගැනීම සඳහාත් ක්ෂේත්‍ර චාරිකා පහක් සිදු කෙරිණි.

**ගැටුම් රේඛාව සහ ගැටුම් පාර්ශ්ව හඳුනාගැනීම** -

ආයතන සහ මූලික පුද්ගලයන් සමග කළ සම්මුඛ සාකච්ඡා වලින් ලබාගත් දත්ත කේතාත්මක කර, එන් 6 (N6) ගුණාත්මක විශ්ලේෂණ මෘදුකාංගය යොදාගෙන විශ්ලේෂණය කරන ලදි. මෙම මූලික විශ්ලේෂණය යොදාගෙන, පර්යේෂණයේ දෙවන අදියරේදී වඩා ගැඹුරට හා විස්තරාත්මකව අධ්‍යයන කළහැකි ගැටුම් රේඛා 6ක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 4කින් හඳුනාගන්නා ලදි. මෙම විශ්ලේෂණයේදීම මෙම තෝරාගත් ගැටුම් සෑම එකක් සම්බන්ධයෙන්ම එම ගැටුම්වලට අදාළ සහ ඒවායේ ප්‍රතිඵල අත්විඳින පුද්ගලයන් සහ කණ්ඩායම්ද තෝරා ගැණින. මෙම අවස්ථාවේදීම, ගැටුමට සම්බන්ධ විවිධ කණ්ඩායම් විසින් යොදාගන්නා ලද විවිධ ගැටුම් නිරාකරණ යාන්ත්‍රණයන් සහ ව්‍යුහයන් හඳුනාගන්නා ලදි.

**ගැටුම් රේඛාමත පදනම්ව සාර්ථක නියැදි සෑදීම (Purposive Sampling) -**

අධ්‍යයනයේ දෙවන අදියරේදී පුද්ගල සම්මුඛ සාකච්ඡා සහ කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා යොදාගෙන තෝරාගත් ගැටුම් රේඛා 6 වඩා විස්තරාත්මකව අධ්‍යයනය කරන ලදි. මෙම අවස්ථාවේ නියැදි රාමුව සකස් කරන ලදදේ, සෑම ගැටුම් රේඛාවකටම අදාළව ලබාගත හැකි උපරිම පර්යාලෝකයන් ප්‍රමාණයක් ලැබෙන අයුරිනි.

නියැදි සැකිල්ල

වගුව 1.7 නියැදි රාමුව

| ගැටුම් රේඛාව | තොරතුරු සපයන්නන් | නියැදිය |
|---|---|---|
| 1. නාගවිල්ලු-ත්‍රී වීලර් නැවතුම් පොළ | සිංහල ත්‍රී වීලර් රියදුරන්<br>මුස්ලිම් ත්‍රී වීලර් රියදුරන්<br>මුස්ලිම් පල්ලි කමිටුව<br>ප්‍රජාමූලික සංවිධාන නියෝජිතයන්<br>මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා 1<br>ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා 1<br>ප්‍රධාන තොරතුරු දායකයා 1<br>ප්‍රධාන තොරතුරු දායකයා 1<br>ප්‍රධාන තොරතුරු දායකයා 1 |
| 2. පලාවි භූමි | බෞද්ධ භික්ෂූන් වහන්සේ<br>ඉඩම් හිමියා<br>පන්සල් කමිටුව (දායක සභාව)<br>ඉඩම් මිලදීගත් අවතැන්වූවන්<br>මුස්ලිම් පල්ලියේ නායකතුමා (සාම කමිටුව)<br>මුස්ලිම් වෙළෙන්ඳන් | ප්‍රධන තොරතුර දායකයා 1<br>ප්‍රධාන තොරතුරු දායකයා 1<br>ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා 1<br>තනිපුද්ගල සම්මුඛ සාකච්ඡා 2<br>ප්‍රධාන තොරතුරු දායකයා 1<br>තනි පුද්ගල සම්මුඛ සාකච්ඡා 1 |
| 3. සුසානභූමිය-සිරිමාපුර | මුස්ලිම් ප්‍රජාව<br>කතෝලික ප්‍රජාව<br>බෞද්ධ ප්‍රජව<br>රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන් | තනි පුද්ගල සම්මුඛ සාකච්ඡා 3<br>තනි පුද්ගල සම්මුඛ සාකච්ඡා 3<br>තනි පුද්ගල සම්මුඛ සාකච්ඡා 3<br>ප්‍රධාන තොරතුරු දායකයා 1 |
| 4. සායනය-නොරොච්චෝලේ | රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන්<br>දේශීය මුස්ලිම් ප්‍රජාව<br>අවතැන්වූවන්<br>මහජන සෞඛ්‍ය පරීක්ෂක | ප්‍රධාන තොරතුරු දායකයා 1<br>තනි පුද්ගල සම්මුඛ සාකච්ඡා 3<br>තනි පුද්ගල සම්මුඛ සාකච්ඡා 3<br>ප්‍රධාන තොරතුරු දායකයා 1 |
| 5. උඩප්පු කෝවිල්-පල්ලි ඉඩම | කෝවිලේ පූසාරි<br>කෝවිලේ භාරකරුවන්<br>පල්ලියේ පියතුමන්<br>පල්ලි කමිටුව | ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා 1<br>ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා 1<br>ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා 1<br>ප්‍රධාන තොරතුරු දායකයා 1 |

**ද්විතීය දත්ත සමීක්ෂණය**

අධ්‍යනය ක්‍රියාවලියේ කොටසක් ලෙස ජාතික හා දිස්ත්‍රික්ක මට්ටමේ සංඛ්‍යාන සාරාංශ, මාධ්‍ය වාර්තා, ප්‍රකාශිත අධ්‍යයනයන් සහ මානව අයිතීන් පිළිබඳ ආයතන වාර්තා වැනි අදාළ ද්වීතික දත්ත සමාලෝචනය කරන ලදි. මෙම මූලාශ්‍රවලින් ලබාගත් තොරතුරු දිස්ත්‍රික්කයේ සමාජ-ආර්ථික සහ ජනවිකාශනය පිළිබඳ පසුබිම් ලබාගැනීමට උපකාරී විය. මෙය තෝරාගත් ගැටුම් රේඛා 6 සන්දර්භානුගත කිරීමට ද අධ්‍යයන කණ්ඩායමට රුකුලක් විය. තවද මෙම ද්වීතික දත්ත ගැටුම් මෙන්ම එයට අදාළ ජනයාගේ ප්‍රතිචාරයන් විශ්ලේෂණය කිරීමට ද පිටිවහලක් වෙයි.

**සමාරම්භක විශ්ලේෂණය**

මෙම විශ්ලේෂණයේදී මූලික පර්යේෂණයේ පළමු හා දෙවන අදියරවලදී ලබාගත් දත්ත හා ද්වීතික දත්ත සමීක්ෂණයෙන් ලබාගත් තොරතුරු සංයෝග කරන ලදි. මෙය, ප්‍රජා සංවිධාන ගැටුම් කළමණාකරණයේදී ලබාගත් අත්දැකීම් සහ පාඩම් උකහා ගැනීමට භාවිතා කෙරිණි. තොරතුරු හුවමාරු කරගැනීමේ වැඩමුළු පවත්වා, මෙම පාඩම්, පළමු හා දෙවන අදියරවලදී හඳුනාගත් අධ්‍යයන සහකරුවන් සමග බෙදා හදා ගන්නා ලදි.

**පළමු තොරතුරු හුවමාරු වැඩමුළුව (First Sharing Workshop)**

පළමු තොරතුරු හුවමාරු වැඩමුළුව පහත අරමුණු ඇතිව පවත්වන ලදි.

- ආයතනික මට්ටමේ ප්‍රතිචාර දක්වන්නන්, අධ්‍යයනයේ කොටස්කරුවන් සමග සොයාගැනීම් බෙදා හදා ගැනීමට
- ප්‍රතිචාර දක්වන්නන්ගෙන් මූලික ප්‍රතිචාර ලබාගෙන අධ්‍යයනයේ මූලික සොයාගැනීම් වඩා සියුම්ව සකස් කිරීමට
- ඉහත දැනුම, ප්‍රදේශයේ සංවර්ධනය සංවිධානවල න්‍යාය පත්‍රවලට ඇතුළත් කිරීමට

වැඩමුළුව අවසානයේ, මූලික පර්යේෂණය සම්පූර්කයක් විය හැකි, තවදුරටත් ගවේෂණය කළ යුතු ක්ෂේත්‍ර හා කරුණු සහභාගීවූවන් විසින් යෝජනා කරන ලදී. දේශපාලන බලය ඉතාම වැදගත් හරස්කඩ කරුණක් ලෙස යෝජනා වූ අතර, සංක්‍රමණ රටාවන්ගේ ඉතිහාසය අධ්‍යයනය කිරීමට ද යෝජනා විය. පුත්තලම දිස්ත්‍රික්කයේ විශේෂිත සන්දර්භය සැලකිල්ලට ගෙන, ගැටුම් තත්ත්වයකදී හෝ ආරවුලකදී එහි ප්‍රතිඵල වෙනත් ජන කොටස්වලට වඩා වෙනස් ආකාරයට මුහුණදෙන, අවදානම් සහගත තත්ත්වයේ සිටින ජන කොටස් 3ක් ද මෙහිදී හඳුනා ගැණිනි.

**අමතර අධ්‍යයනයන්**

පුත්තලමේ පැවැත්වූ මූලික අධ්‍යයනයේ සොයාගැනීම් හුවමාරු කරගැනීමේ පළමු වැඩමුළුවෙන් පසුව, පාර්ශ්වකරුවන් විසින් පහත සඳහන් ක්ෂේත්‍ර වැඩිදුර අධ්‍යයනය සඳහා යෝජනා කරන ලදි. මෙම අධ්‍යයනයේ අපගේ පාර්ශ්වකරුවකු වන, විනිවිඳ සංවිධානය ප්‍රධාන අධ්‍යයනයේ සොයා ගැනීම්වලට ආධාරකයක් වන ලෙස මෙම අමතර අධ්‍යයනයන් සිදු කිරීමේ වගකීම බාරගත්තේය. මෙසේ අමතර අධ්‍යයනයන් කළ තේමාවන් වන්නේ;

- දේශපාලන බලය
- ඓතිහාසික කාලසීමාවක් තුළ පුත්තලම ප්‍රදේශයේ ජන සංක්‍රමණ

- අවදානම් සහගත තත්තවයේ සිටින ජන කොටස්
    - කාන්තා මූලික කුටුම්භයන්
    - ඍතුමය සංක්‍රමණයේ යෙදෙන සාම්ප්‍රදායික ධීවරයන්
    - මව්වරුන් විදේශගතවීම සහ එයින් අදාළ කුටුම්භයන්ට සිදුවන බලපෑම

CEPA ආයතනය, විනිවිද සංවිධානය සමග සමූපදේශයෙන් අමතර අධ්‍යයනයට අවශ්‍ය මෙවලම් සහ නියැදීන් සංවර්ධනය කරන ලදි. මීට අමතරව පර්යේෂණ විධික්‍රම සහ මෙවලම් භාවිතය පිළිබඳ කෙටි පුහුණුවක් විනිවිද ආයතනයේ පර්යේෂණ සහකරුවන්ට ලබාදෙන ලදි.

අමතර අධ්‍යයනයේ දත්ත එකතු කිරීම සහ විශ්ලේෂණය විනිවිද ආයතනයේ වගකීම විය.

**දෙවන තොරතුරු හුවමාරු වැඩමුළුව**

මෙම වැඩමුළුවේ අරමුණ වූයේ;

- සොයාගත් තොරතුරුවල ගුණාත්මකභාවය වැඩිකිරීම.
- දිස්ත්‍රික්කයේ සිටින ඍජු පාර්ශ්වකරුවන් ගෙන් එහා ගිය පුළුල් සභාවකට සොයා ගැනීම ඉදිරිපත් කිරීම.

ඒ අනුව මෙම වැඩමුළුව, මෙතෙක් පර්යේෂණයට සම්බන්ධ වූ පාර්ශ්වකරුවන්ගෙන් එහා ගිය වඩා පුළුල් පාර්ශ්වකරුවන් රැසක් එකට එක්කර සංවාදයට දිස්ත්‍රික්ක මට්ටමේ කරුණු දක්වා ගෙන ගියේය. මෙමගින් ව්‍යාපෘතියේ ප්‍රතිරූපය පවත්වා ගැනීමටත් දිස්ත්‍රික්කයේ වඩා පුළුල් ජන කොටසකගේ පිළිගැනීම ඇතිකර ගැනීමටත් හැකිවිය.

මෙම වැඩමුළුවේ ඉදිරිපත් වූ සමහර යෝජනා වලින් අධ්‍යයන කණ්ඩායම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාම පිළිබඳ ඇතිකරගෙන සිටි මූලික අදහස්වලට ද බලපෑමක් එල්ලවිය. විශේෂයෙන්ම, ප්‍රාදේශීය පාර්ශ්වකරුවන් විසින් පුහුණු වැඩසටහන් පැවැත්වීමේ සාපේක්ෂ නිරර්ථකත්වය මතුකරන ලදි. මෙ මගින් ව්‍යාපෘතියේ අවසන් අදියරේ අංගයන් පිළිබඳ නැවත ඇගයීමක් කිරීමට පෙළඹවූ අතර මෙහි ප්‍රතික්‍රියාවක් ලෙස විධිමත් පුහුණුවීම් වලින් වෙනස්ව, ව්‍යුහාත්මක බවින් අඩු සංනිවේදනය හා හැකියා වර්ධනය අරමුණු කරගත් අභ්‍යාසයකට යොමුවිය.

## 3. මූලික පද

### ගැටුම

මෙම අධ්‍යයනය පරීක්ෂා කිරීමට අපේක්ෂා කරන සංකීර්ණ සමාජ පරිසරය තුළ ගැටුම පැවතිණි. නිවුන් කරුණු වන සාමය ඇති කිරීම සහ සාමය පවත්වා ගැනීම යන කරුණු ගවේෂණය කිරීම වෙනුවෙන් සිද්ධීන් අවස්ථාවන් මෙම සංකීර්ණ සමාජ පරිසරයෙන් තෝරා ගන්නා ලදි.

එකිනෙකාට පරස්පර විරෝධී අරමුණු ඇති හෝ ඇතැයි සිතන (Working with conflict, 2000) පාර්ශ්ව දෙකක් හෝ ඊට වැඩි ගණනක් (තනි පුද්ගල හෝ කණ්ඩායම්) අතර සම්බන්ධය ලෙස බොහෝ අවස්ථාවල ගැටුම නිර්වචනය කෙරේ. මෙම නිර්වචනය මගින් ගැටුම් ඇතිවීමට හේතුව පරස්පර විරෝධී අරමුණු පිළිබඳ සංජානනයන්ය යන අදහසට ද ඉඩ තබයි. ඒ අනුව මෙම අධ්‍යයනයේ සඳහන්, තරමක් දුරට හෝ නිරාකරණය කරා යොමු වූ ගැටුම්වල මෙම සංජානනයන් ඍජුවම හා තීරණාත්මක ලෙස තෝරා බේරාගෙන තිබේ.

කණ්ඩායම් දෙකම එකම සම්පත් වෙනුවෙන් තරග කරන සමාජ තත්ත්වයක් ලෙසට ද බොහෝ අවස්ථාවල ගැටුම නිර්වචනය කරයි (Wallensteen, 2002). මෙම අධ්‍යයනය, එම ඉතා සරල සහ ද්විත්ව නිර්වචනයට සංකීර්ණ මට්ටමක් එකතු කරයි. මෙම ප්‍රත්‍යෙක අධ්‍යයනය (Case Study) මගින් පෙන්වා දෙන පරිදි ගැටුම්, බොහෝවිට සම්පත් සඳහා වන තරගකාරීත්වයන් ආරම්භ වී ඇත. නමුත් ඇතැම්විට ද්විත්ව තරගකාරීත්වය සමාජයේ අනෙකුත් විවාදශීලී කරුණු ලෙස සැලකෙන ජාතිකත්වය හෝ ආගම හෝ වැනි දේට සම්බන්ධ වී හෝ ඒවා තුළින් ප්‍රකාශයට පත්වී, මූලිකව තිබූ ද්විත්ව තරගකාරීත්වය ආමන්ත්‍රණයට සහ නිරාකරණයට අපහසු තත්ත්වයක් ඇති කරයි.

ගැටුම් නිසැකයෙන්ම ඍණාත්මක නොවේ. එය සමහර අවස්ථාවල, හානිදායක සහ එදිරිවාදී සමාජ සම්බන්ධතා වඩා සුබදායී සම්බන්ධතා බවට පත්කර ගැනීමේ ඉඩ ප්‍රස්ථා උදාකරයි. මෙය තීරණය වන්නේ ගැටුමට සම්බන්ධ පාර්ශ්ව සහ එයට පරිබාහිර කණ්ඩායම් අදාළ සමාජ තත්ත්වය වෙනසක් ඇති කිරීම සඳහා උපයෝගී කරගන්නේ ද නැද්ද යන පදනම මතයි. වොලන්ස්ටීන් පවා මෙම අදහස අනුමත කරමින් මෙසේ කියා ඇත. 'තරගකාරී උවමනා එපාකම් නැත. සෑමවිටකම ගැටුම් හරහා සුබදායී සමාජ වෙනස්කම් මතුවිය හැක' පුත්තලම ප්‍රදේශයේ ගැටුම් පිළිබඳ සිදුවීම් තුළින් පෙනෙන්නේ, මෙසේ සුබදායී සමාජ වෙනස්කම් ඇති කිරීමට සහ ආතතීන්ට හේතුවන සමාජ තත්ත්වයන් වෙනස් කිරීමට සුදුසු බොහෝ ඉඩ ප්‍රස්තා මෙහි ඇති බවයි. නමුත් මෙවැනි අවස්ථාවලින් වැඩිකොටසක් සුබදායී වෙනස්කම් ඇති කිරීම සඳහා යොදා නොගැනේ.

### ප්‍රතිචාර

ගැටුම් තත්ත්වයකට ප්‍රතිචාර දැක්වීමේ විවිධාකාර ගතික පිවිසුම් ඇති අතර එවැනි තත්ත්වයන් මතුකරන අනේකවිධ කොන්දේසීන් ද ඇත. මෙසේ ගැටුම් තත්ත්වකට ප්‍රතිචාර දැක්වීමේ විවිධ ක්‍රම හැඳින්වීම සඳහා නොයෙක් පද පරාසයක් ද ක්‍රමානුකූලව වර්ධනය වී ඇත. එනම්, ගැටුම් වැළැක්වීම, ගැටුම් බේරුම්කිරීම, ගැටුම් සමථනය, ගැටුම් නිරාකරණය සහ ගැටුම් විපරිවර්තනය.

ගැටුම් වැළැක්වීම යටතේ ප්‍රචණ්ඩකාරී ගැටුම් තත්ත්වයන් ඇතිවීම වැළැක්වීම අරමුණු කෙරේ. සාමකාමී ගිවිසුමකට එළැඹීමෙන් මෙම ප්‍රචණ්ඩකාරී ගැටුම් තත්ත්වයන් ඉවත් වූ විට එය ගැටුම් බේරුම්කරණය ලෙස හැඳින්වේ. ගැටුමට සම්බන්ධ පාර්ශ්වයන්ට සුබදායී හැසිරීම්වලට පොළඹවා අනාගතයේදී ඇතිවිය හැකි ගැටුම් වැළැක්විය හැකි හෝ සීමා කරගත හැකි නම්, එය ගැටුම් කළමණාකරණයයි. ගැටුමට මූලික වූ ප්‍රශ්න විසඳා ගැටුමට මැදිහත් වූ සතුරු පාර්ශ්ව අතර දිගුකල් පවතින බැඳීමක් ඇති

කිරීම ගැටුම් නිරාකරණයවේ. අවසාන වශයෙන්, ගැටුම් විපරිවර්තනය ගැටුමට මුල් වූ පුළුල් සමාජ දේශපාලනමය හේතුන්වලට විසඳුම් ලබාදී යුද්ධයට යොදාගත් නිශේධනාත්මක බලය සාධනීය සමාජ දේශපාලන වෙනසක් කරා යොදාගැනීමට අපේක්ෂා කරයි (Working with Conflict, 2000).

මෙම අධ්‍යයනය මගින් හඳාරණ සිදුවීම් හෝ ගැටුම් රේඛා (සිද්ධීන්) 6හිදී විවිධ පාර්ශ්ව ගැටුම් වැළැක්වීම, ගැටුම් නිරාකරණය, කළමණාකරණය, බේරුම්කරණය යොදාගෙන ඇත. මෙම වාර්තාවේ ගැටුම් විශ්ලේෂණය සහ ගැටුම් නිරාකරණ කොටසේදී මේ පිළිබඳ වඩා විස්තරාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කෙරේ. ගැටුම් විපරිවර්තනය මෙම ගැටුම් සිද්ධීන්වලට අදාළව හෝ තොරතුරු ලබාගැනීමේ දී මතුනොවීමට හේතු වූයේ මේ අධ්‍යයනයට අදාළ ගැටුම් අවශ්‍යතරම් පුළුල් නොවීම හා තීව්‍ර නොවීම නිසා විය හැක.

**අධ්‍යයන නිර්වචන**

මෙම අධ්‍යයනයේදී ගැටුම නිර්වචනය කර ඇත්තේ, සමාජ ප්‍රචණ්ඩත්වයට වර්ධනය විය හැකි සමාජ ආතතීන් වශයෙනි. ප්‍රත්‍යෙක අධ්‍යයනයන් තීරණය කිරීමේදී මෙම නිර්වචනය උපකාරී විය. ඉතා ඉහළ ආතතියෙන් යුතු, තරගකාරී අතෘප්තිමත් සමාජ වාතාවරණයන් තුළදී මෙම අධ්‍යයනය සිදුවිය. අධ්‍යයනයට තෝරාගත් ප්‍රත්‍යෙක අධ්‍යයනයන් පුත්තලමේ පමණක් සිදුවන ගැටුම් තත්ත්වයන් නොව; එම ගැටුම් තත්ත්වයන් අධ්‍යයන සමාජ වාතාවරණයේ ඇති ප්‍රතිචාර ක්‍රම රාශියක් අහඹු සහ සහායක හේතුන් හා නිරාකරණයේ විවිධ පියවර රැසක් ඉස්මතු කිරීමට උපකාරී විය.

සමාජ ප්‍රචණ්ඩත්වය අවම කරගැනීම සහ ආතතීන් අඩු කර ගැනීමට උපකාරී වන ක්‍රියාවන් 'ප්‍රතික්‍රියා' ලෙස නිර්වචනය කෙරේ. මෙහිදී ප්‍රතික්‍රියා යන පදය ගැටුම් විපරිවර්තනය හැර ගැටුම මත යෙදෙන අනෙක් සියළුම මට්ටමේ කාර්යයන් සඳහා භාවිතා කෙරේ. නිහිත ස්වාර්ථයන් ගැටුම් විපරිවර්තනයට ඉඩ සලසයි ද ගැටුමේ පාර්ශ්වකරුවන්ට එසේ කිරීමට හැකියාවක් ඇත් ද සහ ගැටුමේ ඇලී ගැලී එයින් පැවැත්මක් ඇති කරගත් පාර්ශ්වකරුවන්ට එය වෙනස් කිරීමේ උවමනාවක් ඇතැ'යි යන සැකයක් ද ඇත. මෙම අධ්‍යයනයේදී ලබාගත් ප්‍රතිචාර ගැටුම් විපරිවර්තනය තෙක් නොගොස්, ගැටුම් නිරාකරණයට ගැටුම් වැලැක්වීමට සහ ගැටුම් කළමණාකරණයට පමණක් යොමු වූයේ සමහරවිට මෙවැනි සීමාවන් නිසා විය හැක.

ඉහත නිර්වචන දෙකම සකස්වූයේ, මෙම අධ්‍යයනයේ ප්‍රාරම්භක අදියරේදී, මූලික තොරතුරු සපයන්නන් සහ ආයතන සමග සම්මුඛ සාකච්ඡා පවත්වද්දීය. මෙම අධ්‍යයනය දැනුවත් කිරීමටත් ගැටුම් රේඛා 6 සහ ඉදිරි විමර්ශනවලට ප්‍රතිචාර හඳුනාගැනීමටත් මෙම නිර්වචන පිටිවහලක් විය.

## 4. ගැටුම් පරිසරය

මෙම අධ්‍යයනය පුත්තලමේ ගැටුම් අවස්ථා 6ක් අධ්‍යයනය කරයි. මේවා තෝරා ගන්නා ලද්දේ ඒවායේ විවිධත්වයත්, ඒවා පවතින අවධිය සහ සම්බන්ධ පාර්ශ්වකරුවන්ගේ විවිධත්වයත් සැලකිල්ලට ගැනීමෙනි. මෙම ගැටුම් සහ ගැටුම්වලට ලැබුණු ප්‍රතිචාර, මෙම අධ්‍යයනයේ අරමුණු වන ගැටුම් සඳහා ප්‍රජා මට්ටමේ විසඳුම් හඳුනාගැනීමටත් එමගින් ගැටුම්වලට සම්බන්ධ වී සිටින වෙනත් ප්‍රජාවන්ට ප්‍රයෝජනයක් වීමටත් සහයක් වෙතැ'යි අපේක්ෂා කෙරේ. මෙම ගැටුම් තත්ත්වයන් පැවතියේ, තවත් බොහෝ සංකීර්ණ සමාජ ආතතීන් පැවති, ඒවා හරඹ කරගත්, මතුපිටට යටින් පවතින එකිනෙකට සම්බන්ධ ගැටුම් තත්ත්වයන් ජාලයක් සහිත පුළුල් සමාජ පරිසරයක් තුළයි.

තෝරාගත් ගැටුම් සිද්ධීන් වලින් සිරිමාපුර සුසාන භූමිය සම්බන්ධ ජන කොට්ඨාශ 3 අතරම එදිරිවාදිකම් මතුකළ ගැටුම් සිද්ධිය ඊට අදාළ ජන කොට්ඨාශ තුන අතරම ආතතීන් වැඩිකරන ගැටුමක් ලෙස හඳුනාගන්නා ලදි. මෙම සිදුවීමෙදී මුස්ලිම් අවතැන්වූවන් මෙම පළාතට පැමිණෙන තුරු සුසාන භූමියේ අයිතිය බෞද්ධයන්ට හා කතෝලිකයන්ට පමණක් වෙන්වී තිබිණ. මුස්ලිම් අවතැන්වූවන් ද සුසාන භූමියේ කොටසක් ඉල්ලා සිටි විට අනෙකුත් ජන කොට්ඨාශ දෙක අතර අසම්මතියක් ඇති වී එය සමාජ ආතතියක් ඇති කිරීම දක්වා පැතිරිණි.

නොරොච්චෝලේ හි සායන සිද්ධිය මුස්ලිම් පල්ලියට අයත් ගොඩනැගිල්ලක සායනයක් පැවැත්වීම මත පදනම් වී ඇත. සායනයට එන ජනතාවගෙන් ඇතිවන අවහිරතා නිසා පල්ලියේ යාඥා කටයුතු ක්‍රමානුකූලව පවත්වා ගැනීමට පමණක් නොව මද්‍රාසා – පාසැල් ළමුන්ට කුරාණය ඉගැන්වීමේ පංති පැවැත්වීමට ද අවහිරයක් වී ඇති බව පල්ලි කමිටුවේ හැඟීමයි. අවතැන්වූවන්ගේ පැමිණීමත් සමග සායනයට එන ජනතාවගේ ප්‍රමාණය බලාපොරොත්තු නොවූ ලෙස ඉහළ යාමෙන් මුස්ලිම් පල්ලි ගොඩනැගිල්ලේ සායනය පැවැත්වීම ගැටළුවක් වී ඇත.

> 'හැම සිකුරාදාම මේ ප්‍රදේශයේ සෙනග පිරෙනවා. වඳින්නයි, පාසලටයි, සායනයටයි මිනිස්සු එන්නේ එකම තැනට. විශේෂයෙන්ම කාන්තාවන්ට මේ නිසා කරදයි. මේ නිසා ජාතිභේදවාදී ආතතීන් ඇතිවෙනවා – මොකද මේ ප්‍රශ්නය පේන්නේ අවතැන්වූවන් සහ පළාතේ ජනතාව අතර ප්‍රශ්නයක් විධියටයි'
> (ගැ, 32, නොරොච්චොලෙයි)

මෙසේ පල්ලිය තුළ සායනය පැවැත්වීම නිසා බාධා කිරීම සිදුවන්නේ මද්‍රාසා පංති පැවැත්වීමට විතරක් නෙවෙයි, එයින් සායනයට එන රෝගීන්ටත් බාධා ඇතිවෙනවා. සායනයට එන ජනයා නිසා පල්ලි පරිශ්‍රමය වඩා සංකීර්ණ වෙනවා විතරක් නොවෙයි, 'කිළිටි'ත් වෙනවා. මෙය පල්ලි කමිටුවට ප්‍රශ්නයක් වන්නේ, ආගමික ස්ථානයක් ලෙස පල්ලිය පිරිසිදුව සහ ක්‍රමානුකූලව පවත්වා ගැනීම ඉතා වැදගත් නිසයි. සායනය ඇති කලේ ගැබිණි මව්වරුන් සහ කාන්තාවන් වෙනුවෙන් වුවද පල්ලියේ සෙනග පිරී සිටින විට ඔවුන්ට ද සායනයට පැමිණීම දුෂ්කරවේ.

නාගවිල්ලුවේ, සිංහල සහ මුස්ලිම් ත්‍රීවිලර් රියදුරු කණ්ඩායම් 2ක් අතර, ත්‍රීවිලර් නැවතුම් ස්ථානයක් පිළිබඳ මතභේදයක් ඇතිවිය. මෙම මතභේදය ප්‍රචණ්ඩත්වය දක්වා පිටාරයාමෙන් අවට පලාතේම විශාල ආතතියක් ඇතිවිය.

> 'අවතැන්වූවන් පලාතේ සිංහල ත්‍රීවිලර් රියදුරන්ට පල්ලිය ඉදිරියේ ත්‍රීවිලර් නැවැත්වීමට ඉඩ දුන්නේ නැහැ. මෙයින් අවතැන්වූවන් සහ සත්කාරක ප්‍රජාව අතර ගැටුම් තත්ත්වයක් ඇති වී එය දින කීපයක් පුරාම පැවතුණා. ප්‍රශ්නය විසඳගන්න පොලීසිය මැදිහත් වුණා. එයාලා මේ පළාතේ අළුතින් පොලිස් මුරපොළක් දැම්මා. තවමත් මේ කණ්ඩායම් අතර නොඉවසුම් තත්ත්වයක් තියෙනවා'
>
> (ප්‍රධාන තොරතුරුදායකයා, ගැ, නාගවිල්ලුව)

උඩප්පු සිද්ධියේදී, හින්දු කෝවිල ඉදිකළ ඉඩම පිළිබඳව හින්දු ජනයා සහ කතෝලික ජනයා අතර ආරාවුල් තත්ත්වයක් ඇතිවිය. ප්‍රජාවන් දෙකටම අයත් තරුණ කණ්ඩායම් අතර මේ නිසා සට්ටන ඇතිවීමෙන් පළාතේ සමාජයට හා සමගියට බාධා ඇතිවිය.

> "පූනපිටිය ගම තියෙන්නේ අපේ ගමට කිලෝමීටර් භාගයක් දුරින්. සමහර තරුණයෝ අපේ ගමට ආවා මධ්‍යසාරත් අරගෙන. ඒ ගොල්ලෝ අපිට ගැහුවා. පරුෂ වචනයෙන් බැන්නා. නමුත් අපි ඔවුන්ට සාහසික වුනේ නැහැ"
>
> (ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා 1, උඩප්පු)

වනාතවල්ලුවේ ප්‍රධාන ගැටුමට ඇරඹුනේ ගඟේවාඩිය සහ සේරක්කුලිය යන ජන කොටස් දෙක අතර ධීවර කර්මාන්තයට ඇති වූ තරගකාරීත්වය නිසයි. මෙම කණ්ඩායම් දෙක තරමට නැතත්, එළුවන්කුලම ජනතාව ද මෙම ගැටුමට සම්බන්ධ වී ඇත.

> "ඒ කාලය තුළ එහේ (ගඟේවාඩි) පදිංචි වෙලා හිටිය අපේ මුස්ලිම් අයට මෙහෙට (එළුවන්කුලම) එන්න සිද්ධ උනා – ගඟේවාඩිය ප්‍රදේශයේ ධීවර කර්මාන්තයට සුදුසු නිසා, ක්‍රිස්තියානි පවුල් 50ක් විතර සේරක්කුලියේ පදිංචි වුනා. ඉතින් දැන් ඔවුන් මුස්ලිම් අයට මාළු අල්ලාගෙන දෙන්නේ නැහැ ඒ අය මේ පලාතෙම අය වෙලත්"
>
> (ප්‍රධාන තොරතුරුදායකයා, පි, වනාතවිල්ලුව)

## 4.1 ගැටුම් රේඛා - කුඩා ප්‍රත්‍යෙක අධ්‍යයනයන්

සවිත්තරාත්මකව අධ්‍යයනය කළ ගැටුම් තත්ත්වයන් ප්‍රත්‍යෙක අධ්‍යයනයන් ලෙස පහත දැක්වේ. මෙම සවිස්තරාත්මක අධ්‍යයනය, අවසාන විශ්ලේෂණයේදී, පුත්තලමේ සාමය ඇති කිරීම හා පවත්වා ගැනීම ගැන අන්තර් ගුණයක් ලබාගැනීමට උපකාරවේ.

**වනාතවිල්ලුව**

මෙම ආරවුල පිළිවෙලින් වනාතවිල්ලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සේරුක්කුලිය, ගඟේවාඩිය හා එළුවන්කුලම ප්‍රදේශවාසීන් අතර පවතී. මේ මුළු පලාතේම ජනතාව ධීවර කර්මාන්තයෙන් යැපෙන අතර ආරාවුලට හේතුව මින් එක් කණ්ඩායමක් විසින් අනෙක් කණ්ඩායම්වලට එක්තරා ප්‍රදේශයක මාළු ඇල්ලීමෙන් වැලැක්වීමයි.

ගඟේවාඩිය ධීවර කර්මානත්යට අදාළ ප්‍රධාන ස්ථානයක් වුවත් ප්‍රවේසම් වියයුතු ප්‍රදේශයක් ලෙස සැලකෙන අතර, එය විල්පත්තුව සීමාවේ අධි ආරක්ෂිත කලාපයට මායිම්ව ඇති, ආරක්ෂක මුරපොළක් ද සහතිව ඇති ප්‍රදේශයකි. 1986 වසරේදී ද්‍රවිඩ සන්නද්ධ සංවිධානයක් වන ප්ලොට් (PLOTE) සංවිධානයෙන් පහර දීමක් සිදු වී ඇති අතර, 1993, 1994, 1995 සහ 1996 වසරවල එල්ටීටීඊ පහරදීම් වලටත් ලක්විය. ප්ලොට් ප්‍රහාරයෙන් පසු සංචාරක ධීවරයන් ලෙස ප්‍රදේශයේ ජීවත් වූ බොහෝ දෙනා සේරක්කුලිය හා එළුවන්කුලමට මාරුවූහ. 1996දී සිදු වූ එල්ටීටීඊ ප්‍රහාරයේ වඩාත් තීව්‍ර වූ අතර ඉන් ගැමියන් 17 දෙනෙකු ජීවිතක්ෂයට පත්විය.

1986 ගඟේවාඩියෙන් පිටවීමට පෙර සේරක්කුලිය හා එළුවන්කුලම ධීවරයන් ගඟේවාඩිය මුහුදු සීමාවේ ධීවර කර්මාන්තයේ යෙදුනහ. මෙම ප්‍රදේශය මුදා නොගත් ප්‍රදේශවලට ඉතා කිට්ටු නිසා මාළු ඇල්ලීමට ඉඩ ඇත්තේ උදේ 5ත් සවස 6ත් අතර පමණි. දැනට ගංඟේවාඩිය ප්‍රදේශයේ,

සිංහල කතෝලික පවුල් 50-60 ක් ජීවත්වන අතර ඔවුන් සියල්ලන්ම හලාවත ප්‍රදේශයෙන් පැමිණි අයයි. ජීවනෝපාය මාර්ගය ලෙස එම කාන්තාවන් සහ පිරිමින් සියලු දෙනාම

මසුන් ඇල්ලීමේ නිරත වෙයි. සේරක්කුලියේ ද ප්‍රධාන වශයෙන්ම සිංහල කතෝලිකයන් ජීවත්වන අතර ඔවුන්ගේ ද සම්භවය හලාවත ප්‍රදේශයයි. මෙම ජනතාව සේරක්කුලියේ පරම්පරා ගණනාවක සිට ජීවත් වී ඇති අතර ධීවර කර්මාන්තයේ යෙදෙයි. එළුවන්කුලම ප්‍රධාන වශයෙන් මුස්ලිම් වන අතර, සමහර ගොවිතැන් කටයුතුවලින් උදව්වක් ලැබුණ ද ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය ධීවර කර්මාන්තයි.

සේරක්කුලිය ජනතාවට අනුව, ඔවුන් කලපුවේ ඉස්සන් ඇල්ලීමේ යෙදුණු අතර ගංගේවාඩිය ජනතාව කලාවැවේ ධීවර කර්මාන්තයේ යෙදුණහ. එල්ටීටීඊ ප්‍රහාරයෙන් පසුව සේරක්කුලිය ජනතාව ප්‍රදේශයෙන් පිට වූ පසු ඔවුන් ප්‍රදේශයේ මුහුදු සීමාවේ ධීවර කර්මාන්තය අරඹන ලදි. ගංගේවාඩිය ජනතාවට අනුව, ආරවුලකට තුඩු දී ඇත්තේ සේරක්කුලිය ධීවරයන් මාළුන් හෝ ඉස්සන් ගහණය විනාශවන සේ විශාල ලෙස ඇල්ලීමේ නිරත වීමයි.

සේරක්කුලිය ජනතාවට ගංගේවාඩිය මුහුදු සීමාවේ ධීවර කර්මාන්තයේ යෙදීමට අවසර නොදීම නිසා ඔවුන්ට ගංගේවාඩිය සීමාවෙන් එපිට මුහුදේ කිලෝ මීටර 15ක් පමණ යාත්‍රා කර මසුන් ඇල්ලීමට සිදු වී ඇත. රජය විසින් ගංගේවාඩිය කිට්ටුවෙන් ජැටියක් ඉදි කළත් මොවුන් එය භාවිතා නොකරයි. ගංගේවාඩිය ජනතාවගේ මතය වන්නේ, සේරක්කුලිය ජනයා මත්ස්‍ය කර්මාන්තයේ යෙදෙන්නේ එක්තරා කාල සීමාවක් පමණක් බව හා එම කාලයේදී ඔවුන් ගංගේවාඩියේ ජනතාවගේ මාළු දැල් විනාශ කර දැමූ බවයි. ගංගේවාඩිය ජනයා මේ තත්ත්වයට ප්‍රතිඋත්තරයක් ලෙස ඔවුන්ට ගංගේවාඩිය සීමාවේ කලපුවේ මත්ස්‍ය කර්මාන්තයට ඉඩ නොදෙන බවයි.

**නිරාකරණයට උත්සාහ කළ අවස්ථාව**


2006 නොවැම්බර් 13වන දින පුත්තලම ප්‍රදේශයේ සේවයේ යෙදී සිටි හමුදාවේ සහ පොලිසියේ නායකයනුත් නාවිකා හමුදා නිළධාරීනුත් දිසාපති සහ උප දිසාපතිවරයාත් එකතුව මෙම ගැටළුවලට විසඳුම් ලබාදෙන ලදි. මුහුදු පැත්තේ අක්කර 4 පමණ ඉඩ ප්‍රමාණයක් මාළු දැල් හා බෝට්ටු තැබීමට, මාළු ගොඩ බෑමට හා තොග අලෙවියටත් යොදා ගැනේ. දිසාපති අනෙකුත් නිළධාරීන් මෙම අක්කර 4ක ඉඩම බෝට්ටු සහ දැල් තබා ගැනීම, මාළු ගොඩ බෑම හා තොග අලෙවියටත් යොදා ගත හැකි වන සේ ජන කොටස් තුන අතර පහත සඳහන් ක්‍රමයට බෙදා දීමට තීරණය කරන ලදි.

එළුවන්කුලම - අක්කර 1
ගංගේවාඩිය - අක්කර 2
සේරක්කුලිය - අක්කර 1

නමුත් දේශපාලන ඇඟිලි ගැසීම් නිසා මෙය ප්‍රතිපක්ෂ ලෙස ක්‍රියාත්මක බවක් නොපෙනේ. සියළු පක්ෂවල දේශපාලඥයින් සමග ඉතා ශක්තිමත් සම්බන්ධකම් ඇතිබව පෙනේ. ගංගේවාඩියේ ජනතාව හමුදාව හා නාවික හමුදාව මෙන්ම, ඔවුන්ගේ ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ ද සහාය ඇතිව දිසාපතිගේ තීරණය ක්‍රියාත්මක වීම වැළැක්වීමට කටයුතු කරයි.

මෑතකදී එනම් 2007 වර්ෂයේදී, දිසාපති, උප දිසාපති සහ ජන කණ්ඩායම් තුනේම නියෝජිතයන් අතර සාකච්ඡාවක් පැවැත්විණ. එකඟතාවය වූයේ 1996 ගත් තීරණය ක්‍රියාත්මක කිරීමයි. නමුත් එය එසේ ක්‍රියාත්මකවේ ද නැද්ද යන සැකය දැනටමත් මතු වී තිබේ.

**2006 දී දිසාපති සමග ඇති කරගත් ගිවිසුමට අනුව, සකස් කරන ලද සැලසුම**




**නාගවල්ලි ත්‍රීරෝදරථ**

මෙම ආරවුල ඇරඹුනේ 2006 වර්ෂයේදී මුස්ලිම් සහ සිංහල ත්‍රීවිලර් රථ රියදුරන් නාගවල්ලි ප්‍රදේශයේ රථගාලක් සම්බන්ධයෙන් ඇතිකරගත් තරගකාරීත්වයක් හේතුවෙනි. මුස්ලිම් ත්‍රීවිලර් රියදුරන් රථගාල් කිරීම සඳහා පාවිච්චි කළ ස්ථානය, පළාතේ මුස්ලිම් පල්ලිය මායිමෙන් විරුද්ධ දිසාවේ, ප්‍රධාන පාරේ සිට මීටර් 75ක් 100ක් දුරින් පිහිටි අතුරු පාරක තිබුණි. සිංහල ත්‍රීවිලර් රථ රියදුරන්ගේ රථගාල පල්ලියේ විරුද්ධ දිසාවේ, මීටර් 50ක් පමණ දුරින් ප්‍රධාන පාරේ පිහිටා තිබුණි. සිංහල රියදුරන් පාවිච්චි කරන රථගාල අසල වෙළෙඳ සැලක් ඉදිකෙරෙමින් පැවති නිසා මෙම රියදුරන් ප්‍රාදේශීය සභාවෙන් (Town Council) තමන් සඳහා වෙනත් රථගාලක් ලබාදෙන ලෙස ඉල්ලන ලදි. මෙයට ප්‍රතිචාරයක් ලෙස, පල්ලිය ඉදිරිපිට ප්‍රධාන පාරේ ඉඩක් රථගාල සඳහා වෙන් කරන ලදි.

මෙසේ ඉඩ ලබා දීමෙන් පසු සිංහල රියදුරන්, පල්ලියට සමාන්තරව හා අතුරු පාර හරහා ගලන කාණුවක් කොන්ක්‍රීට් තට්ටුවලින් ආවරණය කර, රථ ගාල් කිරීම සඳහා පොළොව මට්ටම් කිරීමට සැලසුම් කරන ලදි. අලුත් රථගාල මුස්ලිම් පල්ලියට ඉතා කිට්ටු බැවින් එය රෝහල්, පාසැල් හෝ ආගමික ස්ථානවලට කිට්ටුව වාහන නතර කර තැබීම තහනම් කර පනවන ලද නීතියට  පටහැනි බව සැලකිල්ලට ගනිමින් මුස්ලිම් රියදුරෝ මෙයට විරුද්ධත්වය ප්‍රකාශ කළහ. මෙයට ප්‍රතිචාරයක් ලෙස, නීතියට අනුව ත්‍රීවිලර් රථගාල් 2ක් එකිනෙකට මීටර් 100ක් දුරින් නොසිට පවත්වා ගෙන යා නොහැකි බැවින් දැනට සිටින ස්ථානය අනුව අනෙක් කණ්ඩායමේ රථගාල තිබෙන්නේ මීටර් 75ක් පමණක් දුරින් නිසා කණ්ඩායම් 2ම නීතිය උල්ලංඝණය කරන බවට සිංහල රියදුරෝ චෝදනා කළහ.

ආගමික ස්ථානවලට ගෞරවාන්විතව සැලකිය යුතු බැවින් පල්ලියට ඉතා කිට්ටු ස්ථානයක රථගාල් කිරීමට තමන්ට නොහැකියැයි මුස්ලිම් රියදුරන් තවදුරටත් ප්‍රකාශ කරයි. අනෙක් කණ්ඩායම පල්ලියට කිට්ටු ස්ථානයෙන් රථගාල් කිරීමෙන් ආගමික කටයුතුවලට බාධා වන සේ ශබ්දය හා සංගීතය ඇසෙන්නට ඇති ඉඩ ගැන තමන් කණස්සල්ලට පවත්වන බවද මෙම රියදුරෝ ප්‍රකාශ කළහ.

මුස්ලිම් ත්‍රීවිලර් රියදුරන්ගේ විශ්වාසයට අනුව, අනෙක් කණ්ඩායම කලින් සිටි තැනින් ඉවත් වූයේ එහි පොලිස් මුරපොළක් ස්ථාපිත කිරීම නිසයි. නමුත් මෙම අධ්‍යයනයට තොරතුරු සැපයූ සමහර පුද්ගලයන්ට අනුව මෙම පොලිස් මුරපොළ පිහිටවනු ලැබුයේ රියදුරු කණ්ඩායම් දෙක අතර ගැටුම ආරම්භ වීමෙන් පසුවයි. මෙම අර්බුදයට පිළිතුරක් ලෙස සිංහල රියදුරන් ප්‍රකාශ කරන්නේ තම රථගාල ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කර ඇති බව සහ තමන් ඊට අදාළ ගාස්තු ගෙව බවයි.

දේශපාලනඥයින්, ප්‍රාදේශීය සභා සාමාජිකයන් හා පොලිසිය මෙම අර්බුදය විසඳීමට උත්සාහ කළත් එය සාර්ථක නොවීය. මුස්ලිම් රියදුරන්ට අනුව, අර්බුදයට විසඳුම, කණ්ඩායම් දෙකටම ප්‍රධාන බස් නැවතුමට යාබදව ත්‍රීවිල් රථ ගාල් කිරීම සඳහා ඉඩ ලබා දීමයි. අර්බුදය තවමත් පවතියි.

### නොරොච්චොලේ සායනය

නොරොච්චොලේ හී ඇන්ටෙනටෙල් සායනය, ගැටුමක් ආරම්භවීමට පෙර මැදිහත්වීමකින් වළක්වා ගැනීම පිළිබඳ උදාහරණයකි. දැනට පවතින සායනය, සිකුරාදා දිනවල පල්ලියේ පැවැත්විණ. මෙම ගොඩනැගිල්ලේම පාසැල් දරුවන්ට කුරාණය ඉගැන්වීමේ පංති පැවැත්විණි. අවතැන්වූවන් ප්‍රදේශයට පැමිණීමට පෙර මෙම සායනය වැඩි වශයෙන්ම කළේ පලාතේ මුස්ලිම් කාන්තාවන් විසිනි.

අවතැන්වූවන්ගේ පැමිණීමෙන් සායනය භාවිතා කරන්නන්ගේ සංඛ්‍යාව බලාපොරොත්තු නොවූ ලෙස ඉහළ ගියේය. සෙනඟ පිරී ඉතිරී ගිය සායනය කුරාණ පංති පැවැත්වීමට මෙන්ම පල්ලියේ සිකුරාදා ජුම්මා යාඥාවට ද බාධාවක් විය. මෙහි බාධා කිරීම් වල ප්‍රතිඵලයක් ලෙස පළාතේ මුල සිටම පදිංචි වී සිටි මුස්ලිම් ජාතිකයන් අවතැන්වූවන් නුරුස්සන තත්ත්වයට පත්වූ අතර, ඉස්ලාමීය සහන කමිටුවට (ISRC) සම්බන්ධ කාන්තා සංවිධාන ගණනාවක්ම මෙයට විසඳුමක් ලබාදෙන ලෙස ISRCයෙන් ඉල්ලා සිටියහ.

USAID ආයතනයෙන් ආධාර ලබාගෙන කෙයාර් ඉන්ටර්නැෂනල් (CARE International) ආයතනය සායනයක් සඳහා අළුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පහසුකම් සැලසීය. ISRC ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පල්ලිය ඉඩමේම, සම්පූර්ණයෙන්ම අනෙක් කොටස්වලින් වෙන්වූ ගොඩනැගිල්ලක් සායනය වෙනුවෙන් ඉදිකළහ. එතැන් සිට සායනයේ කටයුතු ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම් 3ට තවත් ගම් 5ක් ආවරණය වනසේ පැතිර ඇත. (පල්ලිවාසල්තුරෙයි, සම්මට්ටිවාඩි, වෙල්ලන්ගෙහි, පෙරිය සන්දික්කාරම් සහ අම්මාන්තොට්ටම්) අද සායනය පාවිච්චි කරන බොහෝ දෙනෙක් එය 'සාමයේ සලකුණ' ලෙස සලකයි.

පලාවියේ ගැටුමට හේතු වී ඇත්තේ එක ඉඩමකට අයිතිය ප්‍රකාශ කරන්නන් වැඩි ගණනක් සිටීමයි. මෙම අධ්‍යයනයේ කාල සීමාව තුළ මෙම සංකීර්ණ ගැටුම නොවිසඳී පැවතිණි. බොහෝ කණ්ඩායම්වල සම්බන්ධයත් ඉන් එක කණ්ඩායමක් නිල අධිකරණ ක්‍රියාවලියට සම්පත් දායකත්වය ලබාදීමත් තත්ත්වය තවත් සංකීරණ කිරීමට හේතුවිය.

අර්බුදයට පාත්‍ර වී ඇති ඉඩම අක්කර 29 ක් වූ අතර එය ව්‍යාපාරිකයන් තුන් දෙනෙක් විසින් මිලට ගෙන, කුඩා කට්ටිවලට කඩා අවතැන්වූවන් විකුණන ලද්දකි.

ව්‍යාපාරිකයන් තිදෙනෙක් එක්ව මිලටගත් මුළු ප්‍රමාණය අක්කර 29කට ආසන්න ඉඩම කොටස් කර ගැණුම්කරුවන් 170ත් 215ත් අතර පිරිසකට නැවත විකුණන ලදි. ඉඩමේ මිල පර්චසයක් රුපියල් 15,000ක් වූ අතර සියළුම ගැණුම්කරුවන්ට තම ඉඩම්වලට ඔප්පු ලබාදෙන ලදි.

මෙම ඉඩමේ අයිතිය පිළිබඳ නඩු කීපයක් යටතේ අභියෝග කර ඇත. මෑතකදී ඉහළ උසාවිය එක් කාණ්ඩයකට පක්ෂව, එනම් මුස්ලිම් ඉඩම් අයිතිකරුවන්ට පක්ෂව තීන්දුවක් දෙන ලදි. නමුත් අනෙක් පාර්ශ්වය, බෞද්ධ පන්සල සහ දායක සභාව මෙම තීන්දුවට විරුද්ධව ඉහළ උසාවියේ නැවත නඩුවක් ගොනු කර ඇත.

දායක සභාවට අනුව ප්‍රාදේශීය මැදිහත්කරණ කමිටුවක් වන සමථ මණ්ඩලය හරහාත් ප්‍රදේශයේ වැඩකරන රාජ්‍ය නොව සංවිධානයක මැදිහත් වීමෙනුත් මෙම අර්බුදයට විසඳුමක් ලබාගැනීමට උත්සාහ කළත් මුස්ලිම් ඉඩම් හිමියන් මේ විකල්ප ක්‍රම ගැන වැඩි උනන්දුවක් නොදක්වයි.

මුස්ලිම් ඉඩම් හිමියන්ට අනුව, ඉඩමට මුලින්ම අයිතිය තිබුනේ පුත්තලමෙන් පැමිණි පදිංචිකාරයෙකුටයි. නව අයිතිකරුවන් මෙම ඉඩම 1996දී මිලට ගත් අතර, ඔවුන්ට කට්ටි 10 $3/4$ 2, 2, 2 සහ අක්කර 12 බැගින්, කොටස් 5කට ඔප්පු ලබා දී ඇත. මෙයින් අයිතිය පිළිබඳව පන්සල විසින් අභියෝග කර ඇති එක අක්කර දෙකේ කොටසකට අමතරව, අනෙකුත් කොටස්වල අයිතිය පිළිබඳව ද උසාවිය ඉදිරියේ අභියෝග ඉදිරිපත් කර ඇත.

මෙම විසඳීමට තිබෙන නීතිමය අර්බුදය නිසා කිසිම පාර්ශ්වයකට ඉඩම පාවිච්චි කර නොහැකි වී ඇත. ඉඩම් අයිතිකරුවන් පවසන්නේ, දැනට ඉඩමේ ඇති බුදුරුව, ඉහළ උසාවියේ තීන්දුව දුන් සැණින්ම එහි තැන්පත් කළ එකක් බවයි. මීට අමතරව මෙම අර්බුදයට පාත්‍ර වී ඇති ඉඩමට යාබද ඉඩමේ සිටි, තමන්ට තමන්ගේ ඉඩමේ කිසිම ඉදිකිරීමක් නොකරන ලෙසට තර්ජන ඉදිරිපත් වී ඇතැ'යි පවසයි. පසුව, පහර දීමත් නිසා ඔහුගේ කඩ කාමරය සහ රු 200,000 පමණ වන බඩු විනාශ විය.

මෙම ඉඩම් හිමියා පවසන්නේ මෙම සිද්ධිය පන්සල සමග වන ඉඩම් ආරවුලට සම්බන්ධ බවයි. මුස්ලිම් ඉඩම් හිමියන්ට අනුව, පන්සලේ හාමුදුරුවන්, දේශපාලන න්‍යායය පත්‍රයකට වැඩ කරන පළාතේ තරුණ කණ්ඩායමක අනුබලයට යටත් වී සිටියි. ඔවුන් තවදුරටත් සිතන්නේ, පළාතේ සිංහල ජනයා එහි මුස්ලිම් ජනගහණයේ වැඩිවීම ගැන කණස්සල්ලට පත් වී සිටින බව හා මෙම ඉඩම් ආරාවුල, ප්‍රදේශයේ තවත් මුස්ලිම් අය පදිංචි වීම වැළැක්වීමට ගත් පියවරක් ලෙසයි.

දායක සභාවට අනුව, මුලින්ම මෙම ඉඩම හිස් ඉඩමක් වූ අතර එය ඉඩම් ලියාපදිංචි කිරීමේ කොමිසම යටතේ පැවතිණි. පසුව අවුරුදු 15කට පමණ ඉහත දී අක්කර 20ක

පමණ භූමියක පන්සල ඉදිකරන ලදි. කමිටුවේ සාමාජිකයන් විසින් ඉතිරි ඉඩම පන්සල ඉදිකිරීමෙන් පසුව ද පාවිච්චි කරන ලදි. මුල දී පළාතේ වැසියන් අනවසරයෙන් ඇතුල් වී ඉඩම ඉඩම් ලියාපදංචි කිරීමේ කොමිසමට අයිතිය සහ විශ්වාසය මත පන්සල ඉදිකරන ලදි.

මූලික තර්කය මොවුන් මෙම ඉඩම අවුරුදු 15කට වැඩි කාලයක් තිස්සේ භාවිතා කළ බවත් මුස්ලිම් ඉඩම් හිමියන් දැන් ඔවුන්ගේ ඉඩම් ඔප්පු මගින් ඔවුන්ට පැවරුණු අයිතිය තහවුරු කිරීමට සූදානම් වන බවයි. දායක සභාවේ වගඋත්තරකරුවන්ගේ චෝදනාව, එක් මුස්ලිම් පුද්ගලයෙක් ඉඩම් ලියාපදිංචි කිරීමේ කොමිසමට අයත් ඉඩම හොර ඔප්පු සාදා එය ඉහත සඳහන් මුස්ලිම් ව්‍යාපාරිකයන් 3දෙනාට විකිණීමෙන් පසු එම තිදෙනා එය නැවත කොටස් 215කට බෙදා යාපනයෙන් පැමිණි අවතැන්වූවන්ට විකුණු බවයි.

ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය සභාව, පොලිසිය සහ සමහර දේශපාලනඥයින් මැදිහත් වී මෙය නිරාකරණය කිරීමට උත්සාහ කළත් දැනට මෙම කරුණ උසාවි ක්‍රමයට ඉදිරිපත් වී ඇත.

**සිරිමාපුර සුසානභූමිය**

සිරිමාපුර ගම්මානය ප්‍රධාන වශයෙන්ම සිංහල කතෝලිකයන් සහ බෞද්ධයන් විසින් අවුරුදු 20ක 30ක සිට තම ජනාවාසය ලෙස පරිහරනය කරයි. 2002 වර්ෂයේදී සිට අවතැන්වූවන් මීට යාබඳ ඉඩමේ පදිංචි කරවා ඇත. මුලින්ම මෙම අවතැන්වූවන් ගලා ඒමට, පලාතේ මුල් පදිංචිකරුවන් විරෝධය පෑවද පසුව, කණ්ඩායම් දෙක අතර සාකච්ඡාවක් මගින් තත්ත්වය සමථ කෙරිණි. මෙයට ප්‍රධාන හේතුව නිවාස ණය දීමේදී, අවතැන්වූවන්ට පමණක් නොදී, සත්කාරක ප්‍රජාවේ අවශ්‍ය පුද්ගලයන්ට ණය මුදල් ලබාදීමයි.

වෙනත් ගමකින් පැමිණි සංවිධානාත්මක කණ්ඩායමක් විසින් සමහර අවතැන්වූවන්ගේ නිවාසවලට ගිනි තැබීමෙන් එක් සිද්ධියක් සිදුවිය. අවතැන්වූවන්ගේ පාර්ශ්වයේ වගඋත්තරකරුවන්ට අනුව මෙම සිද්ධියට දේශපාලනමය පෙළඹවීමක් ඇත. මෙම සිද්ධිය සුසාන භූමියේ සිද්ධියට අදාළ නැත.

අක්කර 2ක ඉඩමකින් යුක්ත සුසාන භූමිය බෞද්ධයන් සහ කතෝලිකයන් විසින් පරිහරණය කරන ලදි. අවතැන්වූවන්ගේ පැමිණීමෙන් පසු ඉඩකඩ පිළිබඳ තරගකාරීබවක් ඇතිවූයේ අවතැන්වූවන් විසින් පාවිච්චි කළ මුස්ලිම් සුසානභූමිය සැලකිය යුතු දුරකින් පිහිටා තිබීම නිසයි. මෙම තත්ත්වය ජන කණ්ඩායම් අතර ආතතියක් ඇති කිරීමට හේතුවූ අතරම, මියගිය පුද්ගලයකුගේ ඥාතීන්ට එම පුද්ගලයාගේ භූමදාන කටයුතු සිරිමාපුර සුසාන භූමියේ කිරීම වළක්වා ඇත.

මෙම සිද්ධියෙන් පසුව ජන නායකයින් හා ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධානයක් වන ග්‍රාමීය සංවර්ධන අරමුදලේ නියෝජිතයන් අතර සාකච්ඡාවක් ඇතිවිය. USAID ආයතනයේ ආධාර ඇතිව ග්‍රාමීය සංවර්ධන අරමුදල සුසානභූමිය කොටස් 3කට වෙන්කර කතෝලික, බෞද්ධ, හා මුස්ලිම් ජනකොටස්වලට වෙන් වෙන් ප්‍රදේශ ලබාදීමේදී වැඩපිළිවෙලකට යොමුවිය. ග්‍රාමීය සංවර්ධන අරමුදල මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කළේ සිරිමාපුර වැසියන් අතර සාමය සහ සහජීවනය නගා සිටුවීමේ අරමුණ ඇතිවයි.

මෙම ආරවුල පාරිප්පාදු ගමේ කණ්ඩායම් දෙකක් අතරයි. ආරවුලට ආසන්න හේතුව, කතෝලික තරුණ කණ්ඩායමක් නිසා කෝවිලේ යාබඳ ඉඩමේ සුරුවමක් තැබීමට දරණ ලද උත්සාහයකි. නීත්‍යානුකූල ලියකියවිලිවල අඩුපාඩුකම් නිසා මෙම ඉඩමේ අයිතිය පැහැදිලි නැහැ.

පාරිප්පාදු ගම පසුගිය වසර 20 තුල ජනාවාස වූයේ ප්‍රධාන වශයෙන්ම, උඩප්පු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් දෙමළ හින්දු ජනයා නිසයි. පාරිප්පාදු ජනයා ගම වටා ඇති මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදෙනන අතර, උඩප්පු ප්‍රදේශයේ ජනතාව ද මසුන් ඇල්ලීමට මෙම ප්‍රදේශයට පැමිණේ. මුලින්ම පාරිප්පාදුවල ධීවර පවුල් 10ක් පමණක් සිටි අතර, පසුව උඩප්පු ප්‍රදේශයේ සිට පාරිප්පාදුවේ ඇති හිස් ඉඩම්වලට ජනයා සංක්‍රමණය විය. මෙම අධ්‍යයනය කරන අවස්ථාව වනවිට පාරිප්පාදු ගමේ දෙමළ හින්දු පවුල් 150ත් 160ත් අතර ප්‍රමාණයක් ජීවත්විය.

පාරිප්පාදු ජනතාවට අනුව, ඔවුන් ඉඩම් ලියාපදිංචි කොමිසමේ ඉඩමක හින්දු කෝවිල ඉදිකල අතර, පසුකලෙක එනම් 2007දී මෙම භූමිය දේවාල බිම ලෙස සලකුණු කරන ලදි. කෝවිල ඉතා සරල ආකෘතියක් වූ අතර, මෑතක් වනතුරුම එනම් 2002, වසරේ ජනතාව එක්වී වඩා ස්ථිර ගොඩනැගිල්ලක් සෑදීම අරඹන තුරුම වහලයට අතු සෙවිල්ලා තිබිණ. පළාතේ ජනගහණය සීඝ්‍රයෙන් වර්ධනය වූ අතර, කෝවිල පාවිච්චි කරන පිරිස ද ඒ නිසා එන්න එන්නම වැඩිවිය.

පූනපිටිය ගම පාරිප්පාදු ගමට යාබඳව නමුත් වඩා ඇතුලට වන්නට පිහිටා ඇත. එම ප්‍රදේශයේ ප්‍රධාන පල්ලියට යාම සඳහා හැරෙන වංගුවේ කෝවිල පිහිටා ඇත. පූනපිටිය ගම්වාසීන් පවසන්නේ කෝවිල පිහිටි ඉඩම මුලින් තමන්ට අයත්ව තිබූ බව හා පෙර පාසැලක් ඉදිකිරීම සඳහා එය පාරිප්පාදු වැසියන්ට ලබාදුන් බවයි. පාරිප්පාදු වැසියන් පෙර පාසැල වෙනුවෙට අතු සෙවිලි කළ කෝවිලක් ඉදි කළ බවට ඔවුන් චෝදනා කරයි. දැන් පුනාපිටිය ජනයාට පල්ලියට හැරෙන වංගුව සනිටුහන් කරමින් එම ස්ථානයේ සුරුවමක් තිබීමට අවශ්‍ය වී ඇත.

ආරවුල ඇරඹුනේ, පූනපිටිය ජනයා සුරුවම ගොඩනැගීම සඳහා කෝවිල තිබෙන භූමිය මැනීමට යාමෙනි. පාරිප්පාදු ගමේ වැසියන් කෝවිල් බිම මැනුම් කටයුතු කිරීම ගැන පොලීසියට පැමිණිලි කර ඇත.

මෙම ආරවුල නිරාකරණය කිරීමට විවිධ උත්සාහයන් දරා ඇත. කෝවිලේ පූසාරිට අනුව, ප්‍රදේශයේ වැසියෙක් තමන්ගේ පෞද්ගලික ඉඩම කතෝලික පල්ලියට පරිත්‍යාග කර පූනපිටිය පදිංචිකරුවන් එහි සුරුවමක් ඉදිකල පසු මෙම ගැටුම අත්‍යවශ්‍යයෙන්ම නිමාවට පත්විය.

කණ්ඩායම් දෙකම ප්‍රකාශ කළේ සහකාර දිසාපති මෙම ගැටුමට විසඳුමක් සෙවීමට උත්සාහ කළ බවයි. පාරිප්පාදු වැසියන් ප්‍රකාශ කළේ, වෙනමම අඩි 10 × 10 ඉඩම් කොටසක් සුරුවම ඉදි කිරීම සඳහා පිළිගැන්වුවද පූනපිටිය කණ්ඩායම එම යෝජනාව ප්‍රතික්ෂේප කළ බවයි. ඔවුන්ට අනුව, සහකාර දිසාපති පාරිප්පාදු කණ්ඩායම සමග සාකච්ඡා කර 10 × 10 ඉඩම ලබාදීමට එකඟතාවයක් ඇති කරගත්තත් ප්‍රශ්නය නායකදේවගැති තුමා (bishop) සමග සාකච්ඡා කිරීමෙන් පසුව පූනපිටියේ ජනයා යෝජනාවට, තම නොසතුට පළ කර අර්බුදයට තුඩු දී ඇති ඉඩමෙන් හරි අඩක් තමන්ට අවශ්‍යබව ප්‍රකාශ කර ඇත. සහකාර දිසාපති සමග නැවත සාකච්ඡා කිරීමෙන් පසු ඔවුන්ට ඉඩමෙන් අඩක් ලබාදීමට එකඟ වුවත් තමන්ට විශේෂයෙන්ම පූජෝත්සව සමයේදී කෝවිල වටා ඉඩ කඩ අවශ්‍ය බව පවසමින් අනෙක් ජන කණ්ඩායම මෙම යෝජනාවට විරුද්ධ වී ඇත.

## 4.2 අන්තර්බන්ධන සිදුවීම් සහ ආධාරක සාධක

පුත්තලමේ ජන කොටස් අතර ගැටුම බොහෝවිට එකිනෙකට සම්බන්ධ වී ඇති අතර එක් තැනක තිබෙන ආතතිය බොහෝවිට තවත් තැන්වල ආතතීන් ඇති කරයි. එක් තැනක, ඇතිවෙන සිද්ධියකින්, තවත් ප්‍රදේශයක සමාදානයට බලපෑමක් ඇතිවීමේ ප්‍රවණතාවය අධ්‍යයනට අදාල ගැටුම් රේඛා 6හි සීමාවට පිටින් මතු වූ සහ අධ්‍යයනය කළ සිද්ධීන් ගණනාවකදී පුළුල් ලෙස නිරීක්ෂණය කළ හැකි විය.

> "2001දී, මදුරන්කුලිය ප්‍රදේශයේදී සිංහලයන් හා මුස්ලිම්වරුන් අතර ජාතිවාදි කැරළි කෝලාහල ඇතිවිය. මදුරන්කුලියේ මොනවාහරි දෙයක් වුණොත් ඔවුන් මෙසේ කැරළි කෝලාහල ඇති කර ගත්තා"
>
> (කාන්තා සංගමය, සිරිමාපුර සුසානභූමි සිද්ධිය)

සමහර අවස්ථාවල, මෙම ජන කණ්ඩායම් එකක දෙකටම අයත් තනි පුද්ගලයකුගේ ක්‍රියාවක් නිසාත් ජන කොටස් අතර කළකෝලාහල ඇතිවිය.

> "කුඹුක්කඩුව කොට්ඨාශයට අයත්, ජයරාජ පුරයේ බේබද්දන් හා හරක් හොරුන් රංචුවක් ඉන්නවා. 2001දී ඔවුන් මදුරන්කුලියේදී කෝලාහාලයකට සම්බන්ධ වූ අතර එහිදි ඔවුන්ගේ කණ්ඩායමේ නායකයාගේ අතක් කපා දමන ලදි. මෙය මදුරන්කුලියේ සිංහල හා මුස්ලිම් ජන කොටස් දෙක අතර ගැටුමකට හේතුවූ අතර, ප්‍රදේශයේ සිංහල කඩ රාශියකුත් මුස්ලිම් කඩ කීපයකුත් මේ නිසා විනාශ වුනා."
>
> (පි, 41, සිරිමාපුර)

බොහෝවිට සම්පත්වලට හෝ ප්‍රතිලාභවලට ඇති තරගකාරීත්වය මත අන්‍යෝන්‍යතාවයන් හෝ වෙනස්කම් මතුවන අතර එය ප්‍රචණ්ඩත්වය හා අන්තර්හිත ගැටුම් දක්වා වර්ධනය වෙයි. මෙම ආර්ථික ප්‍රශ්න, දේශපාලනීකරණය හා ජාතිවාදී බවට පත් වී ඒවා ජන කණ්ඩායම් අතර, ආතතීන් ලෙස ප්‍රකාශවේ.

> "2001ට පෙර, සායනය ක්‍රියාත්මක වුනේ පල්ලියට අයිති ගොඩනැගිල්ලක. පල්ලිය මද්‍රාසා පන්තිවලටත් පාවිච්චි වුණා. සායනය ඇරියේ සිකුරාදා විතරයි. පල්ලියේ යාඥාව තියෙන්නෙත් එදාටමයි. සෑම සිකුරාදාවකම පල්ලියේ සෙනඟ පිරුණා; සායනයට එන අයගෙන්, යාඥාවට එන අයගෙන් සහ පන්තිවලට එන අයගෙන්. මෙයින් කාන්තාවන් වඩාත්ම පීඩාවට පත්වුණා. මේ නිසා මිනිස්සු තුළ තරමක නුරුස්සන ගතියක් තිබුණා. විශේෂයෙන්ම මුස්ලිම් අය තුළ ආරවුල ඇතිවුනේ අවතැන්වූවන් සහ සත්කාරක ජනතාව අතර ඇතිවූවක් විදිහටයි."
>
> (ගැ, 32, නොරොච්චොලේ)

> "මීගමුවෙන් ආපු සිංහල ක්‍රිස්ත්‍රියානි පවුල් 50ක් 60ක් විතර ඉන්නවා. ගැණු මිනිස්සු දෙගොල්ලන්ම මූලික වශයෙන් කරන්නේ මාළු ඇල්ලීමයි. ඔවුන් තමන්ගේ පවුල් නඩත්තු කරන්නේ ධීවර කර්මාන්තයෙන්. පිට අයත් මෙහි මාළු අල්ලනවා. එළුවන්කුලම හා සේරුක්කුලිය ජනතාව හැර එළුවන්කුලම ජනතාවට මාළු අල්ලන්න ඔවුන් ඉඩ දෙන්නේ නැහැ, දිසාපති අවසාන තීන්දුවත් දුන්නට පසේසේ."
>
> (ප්‍රධාන තොරතුරුදායකයා, පි, වනාතවිල්ලුව)

සමහර ගැටුම් සිද්ධීන් ඇතිවූයේ දිස්ත්‍රික්ක මට්ටමේ හෝ ජාතික මට්ටමේ ඇතිවූ දේශපාලන සිද්ධීන්වලට ප්‍රතිචාරයක් ලෙස හෝ ඒවායේ බලපෑම නිසාවෙනි. වනාතවිල්ලුවේ, මුස්ලිම් ධීවරයන් ගඟේවාඩියේ ජීවත් වූ අතර ඔවුන්ට එම ප්‍රදේශයෙන් ඉවත්වීමට සිදුවූයේ සමීපයේ ඇති නාවික හමුදා කඳවුරට එල්ල

වූ ප්‍රහාරයක් නිසාවෙනි. ඔවුන් පිට වූ විට ඔවුන්ට වඩා නාවික හමුදාව සමග හොඳ සම්බන්ධතාවක් ඇති ජන කණ්ඩායමක්, ඔවුන්ගේ ධීවර ප්‍රදේශ පාවිච්චියට ගනිමින් මහා පරිමාණ දේශපාලනමය සිදුවීම් මගින් ඇති කළ සම්පත් මත පදනම් වූ ගැටුමකට මඟ පෑදුවේය.

> "ගඟේවාඩිය ප්‍රදේශයේ නාවික හමුදා කඳවුරක් තිබුණා. 1980 ප්ලොට් සංවිධානය කැම්ප් එකට පහර දුන්නා. ඒ කාල සීමාවෙදි එහේ පදිංචිවෙලා හිටිය අපේ මුස්ලිම්වරුන්ට අවතැන් වෙලා මෙහෙට එන්න සිද්ධ වුණා."
>
> (ප්‍රධාන තොරතුරුදායකයා, පි, වනාතවිල්ලුව)

තෝරාගත් ප්‍රධාන ගැටුම් රේඛා හය හැරුණුවිට, දිස්ත්‍රික්කයේ සමහර ගැටුම් ඉතා ප්‍රචණ්ඩකාරී සිද්ධීන්ට මුලපුරා ඇත. ජන කණ්ඩායම් අතර ආතතීන් පැතිර ගොස්, ඒවා අන්තගාමී තත්ත්වයන් යටතේ ප්‍රකාශිත වී ඇත.

> "2006 වසරේදී සිද්ධියක් වුනා, පොලිසිය වාහනයකට නවත්තන්න කිව්වාම වාහනය නැවැත්තුවේ නැහැ. පොලිසිය වෙඩි තිබ්බා. මේක ප්‍රදේශයේ ලොකු ආතතියක් ඇති කරන්න හේතුවුණා. මිනිස්සු පාරේ යන මගීන්ට සහ වාහනවලට බාධා කරමින්, ටයර් පුච්චමින්, පාර වසා දමමින්, උද්ඝෝෂණය කරන්න පටන් ගත්තා"
>
> "මාස කීපයකට කළින් අපි මේ පලාතේදී කුණුවෙමින් තිබූ මිනියක් සොයාගත්තා. ඒක හොඳටම දිරාපත් වෙලා අඳුනගන්නවත් බෑ. පොලීසියටත් බැරිවුනා මේ අපරාධයට වගකිවයුත්තා සොයා ගන්න."
>
> (ප්‍රධාන තොරතුරුදායකයා, ගැ, වනාතවිල්ලුව)
>
> "පුත්තලම ප්‍රදේශයේ මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියාවලට දීර්ඝ ඉතිහාසයක ඇත. 1976දී මුස්ලිම් අවතැන්වූවන් ප්‍රදේශයේ පදිංචිවීමට පටන් ගනිද්දී, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මෙවැනි තත්ත්වයක් සිදුවීමක් සිදුවිය. සිමෙන්ති වැඩපොළකදී මුස්ලිම් කණ්ඩායමක් විසින් සිංහල වැඩකරුවකුට පහර දීමෙන් පසුව, සිංහල සත්කාරක ජනතාවගේ විරෝධය දුරදිගගොස් එය ප්‍රචණ්ඩත්වය දක්වා පැතිරිණි."
>
> '1990 වසරේදී සිංහල හා මුස්ලිම් කණ්ඩායම් අතර ගැටුම් ඇතිවුණා. මේකට හේතුව සිමෙන්ති කර්මාන්ත ශාලාවක වැඩකළ සිංහල සේවකයෙකුට මුස්ලිම් කණ්ඩායමක් පහරදීම, කෝලිත හාමුදුරුවන්ගේ මූලිකත්වයෙන් ඇති වූ බලවේගයක් මඟින් මේ පහර දුන් මුස්ලිම්වරුන්ට ඒ අය සිටි ඉඩම්වලින් නෙරපා හැරියා'.
>
> (පි, 62, සිරිමාපුර)

මෙම අධ්‍යයනය සිදු වුණේ, සමහර අවස්ථාවල ආතතීන් දිගු කලක් පැවතුණු, ප්‍රතිවිරෝධී ආතතීන් සහ සම්බන්ධතාවයන් දීර්ඝ කාලීන විශාල තත්ත්වයේ ජනවාර්ගික ගැටුම් බවට පත් කරන, සංකීර්ණ පසුබිමක් තුළයි. පුත්තලමේ සාපේක්ෂ සාර්ථකත්වයට පදනම ප්‍රජාමූලික යාන්ත්‍රණයන් තුළින් මෙම ආතතීන් සහ ප්‍රචණ්ඩත්වයන් පැතිරයාම සීමාකර ගැනීමයි.

## 4.3 ගැටුමට ප්‍රතික්‍රියා දැක්වීම

සුසාන භූමිය හා සම්බන්ධ සිද්ධියේදී පක්ෂග්‍රාහී නොවුනු ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධානයක් මැදිහත් වීමෙන් (ග්‍රාමීය සංවර්ධන පදනම), ගැටුමට සම්බන්ධ පාර්ශ්වයන් සුසාන භූමිය මුස්ලිම් අවතැන් වූවන් සමග ද බෙදා ගැනීමට එකඟ විය. මෙම ගැටුමේදී තුන්වන පාර්ශ්වයක මැදිහත්වීම ගැටුම් නිරාකරණයට හේතුවිය. නමුත් මෙය අනෙකුත් සමාන ගැටුම් සිද්ධීන් වලදීත් සැමවිටම සාර්ථක වන්නක් නොවේ.

"මුකුත් ලොකු ප්‍රශ්න නැහැ, නමුත් ජනාසාස් (අවමංගල්‍යයන්) තියෙන වෙලාවට අපි අපහසුතාවලට මුහුණ දෙනවා. අපේ දුව මැරුණු වෙලාවෙත් එහෙමයි. අපිට ඇයව භූමදාන කරන්න බැරිවුණා, මුස්ලිම් අයටම වෙන්වූ කනත්තක් නැති නිසා. ප්‍රදේශයේ ජනතාව අපට මේ කනත්ත පාවිච්චි කරන්න දුන්නේ නැහැ. අපිට ග්‍රාමීය සංවර්ධන පදනමේ චෝල්ටර් මහත්තයාට කථා කළා. ඉන් පස්සේ සාම කමිටුවේ රැස්වීමක් පැවැත්වුනා. ඇමතිවරයෙක් සහ මන්ත්‍රීවරයෙක් මේකට සම්බන්ධ වෙලා අවසානයේ මෙය ඒ දෙගොල්ලන් අතර ගැටුමක් බවට පත්වුනා. අවසානයේ ප්‍රශ්නය විසඳුනේ ග්‍රාමීය සංවර්ධන පදනම, අපට ප්‍රශ්නය විසඳගන්න උදව් කලා."

(ගැ, 39, සිරිමාපුර)

නොරොච්චොලේ සායනය පිළිබඳ ආරවුලේදී මුස්ලිම් සහනාධාර කමිටුව සහ USAID මැදිහත්වී, පල්ලියෙන් පිටත අළුත් සායනයක් ඉදි කරන ලදි. ගැටුමට හේතුව, පොදු ඉඩක් සහ සම්පත් බෙදා හදා ගැනීමේදී ඇති වූ අපහසුතා නිසා, අලුත් සායනයකට පහසුකම් ලැබීමෙන් ගැටුමට අදාළ ගතිකයන් වෙනස් වී, තත්ත්වය බල රහිත කරන ලදි.

"අවසානයේ මිනිස්සු ISRC එකට සහ පල්ලියට තම පැමිණිලි ඉදිරිපත් කළා. මේ නිසා ISRC එකට සහ පල්ලියට තම පැමිණිලි ඉදිරිපත් කළා. මේ නිසා ISRC එක තත්ත්වය තේරුම් අරගෙන, සායනය පල්ලියෙන් එළියේ තැනකට ගන්න සැලසුම් කළා. අවසානයේ එය පල්ලියට යාබද අළුත් තැනකට ගෙනිච්චා USAID මේකට ආධාර කළා. එතැන් සිට මිනිස්සු මේ සායනය පාවිච්චි කරනවා, ඒත් අපිට තවම මේකට දොස්තරවරයකු ගන්න බැරිවුණා. අපි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමාත් එක්ක මේ ගැන වාර ගණනාවකදීම කථා කළා. නමුත් තවමත් මේ ගැටළුවට විසඳුමක් නැහැ."

(ගැ, 32, නොරොච්චොලේ )

සමහර ගැටුම්වලට ප්‍රතික්‍රියා ලෙස සාම කමිටු පිහිටුවා ඇත. මෙම කමිටු පලාතේ ආගමික සහ සිවිල් නායකයින් ගෙන් සමන්විත වේ. ඔවුන්ට අර්බුදයට සම්බන්ධ පුද්ගලයනගේ ගෞරවයක් ඇති අතර, ගැටුම් ප්‍රශ්නවලට මැදිහත් වී ඒවා නිරාකරණය කිරීමේ යම් සාර්ථකත්වයක් මේ අය පෙන්වා ඇත.

"අපව නීතිඥයන්ට ඇමතිවරුන්ට හා වෙනත් අපේ ප්‍රශ්න හා ගැටළුවලට අවශ්‍ය උපදෙස් ලබාගැනීම පුද්ගලයන් සමග සම්බන්ධ කරවීම වැනි විවිධ අයුරින් සාම කමිටු සාමාජිකයන් අපට උදව් කරලා තියෙනවා."

(ප්‍රධාන තොරතුරුදායකයා, පි, පලාවි)

සමහරවිට අර්බුදයකට විසඳුම් එතරම් පැහැදිලි නැති අතර, එය පුද්ගලයෙකුගේ හෝ කණ්ඩායමකගේ අසාමාන්‍ය ක්‍රියාවක් මත යැපෙයි. උදාහරණයක් ලෙස, උඩප්පු සිද්ධිය අවසානයේ විසඳුනේ, දිගින් දිගටම ඇදුණු සාකච්ඡා වලින් පසුව, අර්බුදයට සම්බන්ධ එක් පාර්ශ්වයකට දානපතියෙකු විසින් ඉඩමක් පරිත්‍යාග කිරීමෙනි.

"දිසාපති, උඩප්පු කෝවිලේ භාරකාර මණ්ඩලය, පල්ලියේ පියතුමා, පාරිප්පාදූ ගම් කමිටුව මේ පිළිබඳ සාකච්ඡා පැවැත්වුවා. නමුත් එයින් එකකින්වත් විසඳුමක් ලැබුනේ නැහැ."


(ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා 1, උඩප්පු)

"ආගමික නායකයින් මැදිහත් වුනා මේකට විසඳුමක් සොයාගෙන, නමුත් ප්‍රශ්නය විසඳුනේ සාමාන්‍ය මිනිසෙකුගේ මැදිහත් වීමෙන්, ඔහු ඔහුගේ පෞද්ගලික ඉඩම සුරුවම ඉදිකරන්න ලබාදුන්නා."

(ප්‍රධාන තොරතුරුදායකයා, පි, උඩප්පු)

ගැටුම්වල ප්‍රමාණය සහ ඒවාට දියහැකි විසඳුම්වල පරාසය මෙම අධ්‍යයනයට පසුබිම සපයයි. මෙයින් සමාජ වාතාවරණයේ ඇති සංකීර්ණත්වයක් ගැටුම සහ විසඳුම අතර අන්තර් සම්බන්ධතාවයක් හඳුන්වා දෙනු ලැබේ.

## 5. පුත්තලමේ ගැටුම, ගතිකයන්, ආධාරක සාධක සහ හරස්කඩ පැතුරුණු ප්‍රශ්න




රූප සටහන 5.1 ආරවුල අධ්‍යනය කළ වර්ග

### 5.1 ගැටුම් / ආරවුල් වර්ග

ප්‍රධාන ගැටුම් වර්ග 2ක් අනාගතයේදී හඳුනාගැනිණි. ඒවා නම්, ජන කොටස් අතර ආරවුල් සහ පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම් සහ ආයතන අතර ගැටුම් වේ. මෙම ගැටුම්වලින් වැඩි කොටසක්, මුලදී සම්පත් සඳහා වන තරගකාරීත්වය මත ආරම්භ වී ඇත.

**අන්තර්-වාර්ගික ආරවුල් ජනවර්ග** දෙකක් හෝ **ආගමික කණ්ඩායම්** දෙකක් හෝ එකිනෙකට සමාන හෝ වෙනස් **අනන්‍යතාවයන්** ඇති ජනකොටස් දෙකක් අතර ඇතිවිය හැකිය. දෙවන වර්ගයේදී ගැටුම් ඇතිවෙන්නේ **පුද්ගලයින් හෝ පුද්ගල කණ්ඩායමක් හෝ ආයතනයන්** අතරයි.

නාගවිල්ලුවේ ත්‍රීරෝද රථ ගාලට සම්බන්ධ ආරාවුලට සිංහල හා මුස්ලිම් ජනවර්ගිකත්වයන් සම්බන්ධ විය. උඩප්පුවේ ගැටුමට ආගමික කණ්ඩායම් දෙකක්, එනම් හින්දු හා කතෝලික කණ්ඩායම්, හින්දු කෝවිලේ ඉඩම හා කතෝලික සුරුවම තැබීමේ ඉඩකඩ මත සම්බන්ධ විය. සිරිමාපුරයේදී බෞද්ධ හා කතෝලික ආගමික කණ්ඩායම් සුසාන භූමියේ ඉඩම නිසා මුස්ලිම් කණ්ඩායම සමග ගැටුමට මැදිවිය.

නොරොච්චොලේ හි ගැටුම, මුස්ලිම් පල්ලිය ඉඩමේ ඇති සායනය පාවිච්චි කිරීම මත ඇරඹුණු අතර, එය මුස්ලිම් ජාතීන් අතරම වුවත් ප්‍රදේශයේ මුස්ලිම් සහ අවතැන් වූ මුස්ලිම් යන අනන්‍යතාවයන් දෙකක් අතර ගැටුමක් විය.

එකම අනන්‍යතාවයක් හා එකම ජනවාර්ගික පදනමක් ඇති කණ්ඩායම් අතර ද ගැටුම් ඇතිවිය හැක. උදාහරණයක් ලෙස වනාතවිල්ලුවේ ගැටුමට සම්බන්ධ ගඟේවාඩිය හා සේරක්කුලිය කණ්ඩායම් ගත හැක. මේ කණ්ඩායම් දෙකම සිංහල කතෝලික ධීවරයන් වේ. ආරවුල ඇරඹුනේ මාළු ඇල්ලීමට ඇති ප්‍රදේශය සම්බන්ධයෙනි. මෙයට හේතුව, එක් කණ්ඩායමක් විසින් එම ප්‍රදේශයට පැමිණීමට අනෙක් කණ්ඩායමට ඉඩ නොදීමයි.

පලාවියේ ඉඩමක් සම්බන්ධ ගැටුම, පුද්ගලයන් හා ආයතන අතර ගැටුමකට උදාහරණයකි. ඉඩම පුත්තලමේ සිටින ඉඩම් හිමිකරුගෙන් මිලට ගත් පුද්ගලයන් ඊට අයිතිවාසිකම් කියන අතර, පන්සල සහ පන්සල් කමිටුව වාද කරන්නේ, තමන් අවුරුදු 12කටත් වඩා පරිහරණය කළ, ඉඩම් ලියාපදිංචි කිරීමේ කොමිසමට අයත් ඉඩම මෙම පුද්ගලයන් අනවසරයෙන් භාවිතා කරන බවයි. මෙම ගැටුම් සිද්ධිය අන්තර්-ආගමික සහ ජනවාර්ගික කෝණයකින් බැලීමට ද ඉඩ ප්‍රස්ථා ඇත. ගැටුමට සම්බන්ධ පුද්ගලයන්ගේ ඉඩම මිලට ගත් මුස්ලිම්වරුන් මුස්ලිම් බව හා බෞද්ධ පන්සල සහ එහි කමිටුවේ බෞද්ධ බව යන අනන්‍යතාවයන් මෙම ගැටුම දුරදිග ගෙනයාමට දායක විය.

## 5.2 වර්ධනයේ සහ නිරාකරණයේ විවිධ අවස්ථා

සමහර ගැටුම් පැවතුනේ කෙටිකාලයකට වුවත් තවත් සමහර ගැටුම් නිරාකාරණයකින් තොරව වසර ගණන් පැවතුණු බව පැහැදිලිය. ගැටුමක පැවැත්ම තීරණය වන්නේ, ප්‍රශ්නයට අදාල විෂය, ගැටුමේ සංකීර්ණත්වය, ගැටුම් වර්ගය, ගැටුමට සම්බන්ධ පාර්ශ්ව සහ නිරාකරණය සඳහා මැදිහත් වන ප්‍රාදේශීය කණ්ඩායම්වල හැකියාවන් මතයි.

කෙටි කාලයක් පමණක් පැවතුණු ගැටුම් නිරාකරණය වී ඇත්තේ විවිධ පුද්ගලයන්ගේ හෝ ආයතනවල මැදිහත් වීමෙනි. දැනට පවතින, ප්‍රාදේශීය ආයතනවලට හැකියාවක් ඇතිවිට, අළුතින් මතුවන ප්‍රශ්න සහ සංකීර්ණත්වයෙන් අඩු අර්බුද වැඩි කරදරයකින් තොරව නිරාකරණය කර ගත හැක. අධ්‍යයනය කළ ගැටුම් රේඛා/සිද්ධීන්වලට  අනුව මෙවැනි ගැටුම්වලට මැදිහත් වන පාර්ශ්වයන්ට ගැටුම් නිරාකරණයට උවමනාවක් ඇති අතර ඒ වෙනුවෙන් අවශ්‍ය පමණට සම්පත් ද ඇත. සමහර ආයතන මැදිහත් වී ඇත්තේ, එය එම ආයතනවල ආයතනික වරපත්‍රයට අනුකූලව බැවිනි.

නොරොච්චොලේ හී ගැටුම ISRC හි මැදිහත්වීමෙන් නිරාකරණය කෙරිණි. ප්‍රශ්නය අනෙකුත් ගැටුම්වලට සාපේක්ෂව සංකීර්ණත්‍වයෙන් අඩු වූ අතර සුළු අපහසුකම් මැද නිරාකරණය කරගත හැකිවිය. මෙයට සම්බන්ධ ආරාවුල්කරුවන් ප්‍රදේශයේ මුස්ලිම් ජනයා සහ අවතැන් වූ මුස්ලිම් ජනයායි. ගැටුමට සම්බන්ධ පාර්ශ්ව ගණන අඩුවීමට ද නිරාකරණය පහසුවීමට හේතුවකි. පළාතේ රාජ්‍ය නොවන සංවිධානයක් වන ISRC, USAID ආයතනයේ අනුග්‍රහය ඇතිව, සම්පත් මූලික කරගෙන පලාතේ ඇතිවන ගැටුම් හඳුනාගෙන එම සම්පත් ලබාදී ගැටුම් තත්ත්වයන් කළමණාකරණය කරගැනීමට උත්සාහ කරයි. සමහර අවස්ථාව පළාතේ සංවර්ධන කටයුතු කරන ආයතන මැදිහත් වී, සම්පත්වල සීමිත බව නිසා හෝ සම්පත් නිසා අර්බුද ඇති වී ඇති තත්ත්වයන් වලදී සේවාවන් වැඩි දියුණු කිරීම හෝ තවත් සම්පත් ලබාදීම මගින් ගැටුම් නිරාකරණය කර ඇත. මුස්ලිම් ජනයා සුසාන භූමිය පාවිච්චි කිරීම පිළිබඳව, සිරිමාපුරහි ඇතිවූ අර්බුදයේදී පළාතේ රාජ්‍ය නොවන සංවිධානයක් වන ග්‍රාමීය සංවර්ධන පදනම මැදිහත් වී සුසාන භූමිය කොටස් කර සිංහල, දෙමළ, මුස්ලිම් කණ්ඩායම්වල පාවිච්චියට බෙදා දෙන ලදි. තම සාමය ගොඩනැංවීමේ ව්‍යාපෘතියක් හරහා USAID මේ වෙනුවෙන් සම්පත් ලබා දුන්නේය.

සමහර ගැටුම් දිගුකාලයක් පවති. තවත් තවත් කණ්ඩායම් සම්බන්ධවීමෙන් ඒවා සංකීර්ණත්වයෙන් ද දිගින් දිගටම වැඩිවේ. උදාහරණයක් ලෙස වනාතවිල්ලුවේ මාළු ඇල්ලීමේ ප්‍රදේශය පිළිබඳ ගැටුම නිරාකරණය නොවීමට, ඊට සම්බන්ධ පාර්ශ්වයන් ගණන වැඩිවීම බලපායි. එහි ගැටුම් ප්‍රජාවන් 3ක් ඇත. ගඟේවාඩිය සහ සෙරක්කුලිය ප්‍රජාවන් ගැටුමේ මූලික පාර්ශ්වයන් වුවත්, එළුවන්කුලම නැමැති ජන කණ්ඩායම් නියෝජනය කරන දේශපාලඥයන් ද මෙයට සම්බන්ධ වීමෙන් සංකීර්ණත්වය තවත් වැඩිකර ඇත. ගැටුමට සම්බන්ධ වීමෙන් සංකීර්ණත්වය තවත් වැඩිකර ඇත. ගැටුම පවතින කාල සීමාව තීරණය වීමට ද අර්බුදයට මූලික වූ කරුණේ සංවේදීභාවය ද බලපාන බවක් පෙනේ. උදාහරණයක් ලෙස, ගැටුමක් සම්පත් මත පදනම් වී ආගමික හෝ ජාතිකත්ව කණ්ඩායම් දෙකක් අතර සිදු වේ නම්, ආයතන හා පුද්ගලයන්ට දැනෙන්නේ, එයම මැදිහත් වීමට අසීරු බව හා එය නිරාකරණයට පලාතේ ආයතනයන්ට ඇති හැකියාව මද බවයි. බොහෝවිට මෙවැනි අර්බුද විධිමත් නීතිමය ක්‍රියාවලියට

අයත් පොලිසිය හා උසාවිය වැනි ආයතනවල සහාය පතයි. නිරාකරණය නොවී මෙවැනි අර්බුද දීර්ඝ කාලීනව පැවතීමට ද මෙය එක් හේතුවකි.

## 5.3 තීව්‍රතාවයේ පරාසය

ගැටුමක වර්ගය අනුව එහි තීව්‍රතාවය වෙනස්වේ. මෙම අධ්‍යයනයේදී විවිධ විචලනය වන තීව්‍රතාවයන්ගෙන් යුතු ගැටුම් ගණනාවක් හමුවිය. අධ්‍යයනය කළ සියළුම ගැටුම් ප්‍රචණ්ඩත්වය දක්වා වර්ධනය වී නැත. සමහර ගැටුම් සම්බන්ධ පාර්ශ්වයන් අනුව හෝ අදාළ හේතූන් අනුව හෝ තීව්‍රතාවයට පත්ව නැත. මිනිසුන්ගේ සිත්තුළ ජීවත්වන, ප්‍රකාශ නොකළ 'නොපෙනන' ගැටුම් ප්‍රචණ්ඩත්වයට හේතු විය හැක. නොරොච්චෝලේ හී අධ්‍යයන කළ සායනය පාවිච්චි කිරීමට අදාළ ගැටුම බොහෝ දුරට 'නොපෙනී' පැවති අතර කිසිම ප්‍රචණ්ඩත්වයකට මඟ පැදුවේ නැත. සීමිත සම්පත් පුත්තලමට පැමිණි අවතැන්වූවන් සමග අවුරුදු 10කටත් වැඩි කාලයක් බෙදාගැනීමට සිදුවීම නිසා 'සත්කාරක' ප්‍රජාව තුළ ඉච්ඡාභංගත්වයක් සහ ප්‍රකෝපනයක් පිළිබඳ හැඟීමක් ඇති වී තිබේ. මෙය වෙනත් අර්බුද තත්ත්වයකට ගොදුරු වී වෙනස් හදිසි ප්‍රතිඵල ඇතිකරන්නට හෝ වෙනත් අර්බුදයකට මූලාරම්භය වීමට ද පුළුවන.

> "සත්කාරක ප්‍රජාව හිතන්නේ, අවතැන්වූවන්ගේ පැමිණීම නිසා තමන්ට ලැබීමට තිබූ රැකියා අවස්ථා හා රජයේ රැකියා නැති වූ බවයි."
>
> (ගැ, 22, නොරොච්චොලේ)

සමහර ගැටුම් පෙනෙන්නට එළියට මතු වී තිබුණත්, ඒවා ප්‍රචණ්ඩත්වයට හේතුවෙලා නැහැ. සිරිමාපුර ගැටුම, ගැටුමට සම්බන්ධ ජනකොටස් අතර ආතතිය ඇති කළත් එය ප්‍රචණ්ඩකාරී අවධියකට ළඟාවීමට පෙර මැදිහත් වූ බැවින්, එහි ප්‍රතිඵලයක් ලෙස කිසිම ප්‍රචණ්ඩත්වයක් සිද්ධවුනේ නැත.

ගැටුම් ප්‍රචණ්ඩත්වය දක්වා වර්ධනය වීමට එක් හේතුවක් නම්, අදාළ ගැටළු ඉතා විවාදශීලි වීම හා වගකිවයුතු ආයතන වලින් ඒවා නිරාකරණය නොකිරීමයි. සමහර අවස්ථාවල ගැටළු නිරාකරණය කරගැනීමට ඇති නොහැකියාව නිසා ඇතිවන ඉච්ඡාභංගත්වය පුද්ගලයින් ප්‍රචණ්ඩත්වයට පෙළැඹවිය හැක. ගැටුමට සම්බන්ධ පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට, එය බේරුම් කිරීමට මැදහත් වන පුද්ගලයන් හෝ ආයතනවල පක්ෂග්‍රාහී බවක් දැනුනොත් එයින් ද ප්‍රචණ්ඩත්වය ඇතිවිය හැක. නාගවිල්ලුවේ ත්‍රීවිලර් ගැටුම ප්‍රචණ්ඩකාරී වූයේ අදාළ කණ්ඩායම් දෙකටම ඊට සම්බන්ධ වූ මැදහත්කරුවන් පිළිගැනීමට නොහැකි වීම නිසයි. මුස්ලිම් ජනයා, සිංහල ජනයා නියෝජනය කරන ආයතන ඔවුන්ට පක්ෂග්‍රාහී බව විශ්වාස කළ අතර සිංහල ජනයා ද එසේම මුස්ලිම් පැත්ත ගැන සැක කළහ. මේ තත්ත්වය ප්‍රචණ්ඩත්වයට මඟ පෑදූ අතර අවසානයේ පොලිසිය මැදිහත් වී පොලිස් මුරපොළක් ඇති කළහ. භෞතික ප්‍රචණ්ඩත්වය පැවතීම, නිරන්තරයෙන්ම අර්බුදය වඩා තීව්‍ර කිරීමට හේතුවේ. මෙවැනි ප්‍රචණ්ඩත්වයන් පුද්ගලයන්ගේ හා සමාජයට අයත් භෞතික වස්තූන් විනාශ කිරීමටත් සමහර අවස්ථාවල ජීවිත පවා විනාශ කිරීමට හේතුවේ.

## 5.4 ගැටුම්වල සංකීර්ණත්වය

සාමාන්‍යයෙන් මෙම අධ්‍යයනයේදී අවධානය යොමුකළ ගැටුම්වලට සම්බන්ධ පාර්ශ්වයන්, ප්‍රශ්න හා න්‍යායය පත්‍රයන් වැනි අංශවලින් ඉතා විශාල සංකීර්ණත්වයක් ඇත. ගැටුමක සංකීර්ණත්වයට අනිවාර්යයෙන්ම ඊට සම්බන්ධ පාර්ශ්ව ගණන බලපායි. අධ්‍යයන කළ බොහෝ ගැටුම්වලට සම්බන්ධ කණ්ඩායම් දෙකක් පමණක් වුවත් ඊට වැඩි ප්‍රමාණයක් සම්බන්ධ අවස්ථා ද ඇත. වනාතවිල්ලු ගැටුමට පාර්ශ්ව 3ක් සම්බන්ධයි. (ගඟේවාඩිය, සේරක්කුලිය හා එළුවන්කුලම ජනකොටස්). ගැටුමට ඍජුවම

සම්බන්ධ නැති පාර්ශ්වකරුවන් පවා සමහර අවස්ථාවල ඉතා ගැඹුරින් සම්බන්ධවන අවස්ථා තිබේ. තවත් අවස්ථාවල ගැටුමට සම්බන්ධ නැති පාර්ශ්වයන් මැදිහත් වීමෙන් ගැටුම් තත්ත්වයන් තවදුරටත් වැඩිකළ හැකිය. ඔවුන්ට වෙනස් න්‍යාය පත්‍රයක් ඇති අතර, ගැටුම් තත්ත්වය තමන්ට අවශ්‍ය ලෙස හසුරුවා තමන්ගේ යහපත වෙනුවෙන් සමහර අවස්ථාවල විසඳුමක් ලැබීම වැලැක්වීමට ද ඉඩ ඇත. නාගවිල්ලු ගැටුම උදාහරණයක් ලෙස කාලයත් සමග බොහෝ නොවැදගත් පාර්ශ්වයන් සම්බන්ධවීමෙන් වඩා සංකීර්ණ වී ඇත. සංවර්ධන ආයතනවල මැදිහත් වීම, ආගමික සංවිධාන, දේශපාලඥයින්, පොලිසිය හා ජන නායකයින් තත්ත්වය තවත් බරපතල තත්ත්වයකට පත් කරයි. දේශපාලඥයින් වරින් වර ප්‍රදේශයට පැමිණ එක් පාර්ශ්වයකට පමණක් පොරොන්දු දෙමින් ගැටළු නිරාකරණයට උත්සාහ කරයි.

> "ඇමතිවරුන් හා මන්ත්‍රීවරුන් බොහෝ පිරිසක් සම්බන්ධවීම නිසා මේ ගැටුම් විශාල වශයෙන් දේශපාලනීකරණය වී තිබේ."
>
> (ප්‍රධාන තොරතුරුදායකයා, පි, නාගවිල්ලුව)

ආරවුලට සම්බන්ධවන පාර්ශ්වකරුවන්ගේ අකාරය හා ස්වාභාවය, ගැටුමේ ස්වාභාවය මත වෙනස් වෙයි. සීමිත සේවාවන්මත ඇති වූ තරගකාරීත්වය පදනම් කරගත් ගැටුමක් නම්, ඒ සඳහා ප්‍රදේශයේ වැඩකරන සංවර්ධනය ආයතනවලට සම්බන්ධ විය හැකිය. නොරොච්චොලේ සායනය සම්බන්ධයෙන් මතු වූ ආරවුලට ISRS ආයතන සම්බන්ධ වීම උදාහරණයක් ලෙස දැක්විය හැකිය. නමුත්, ආරවුල ජනවර්ග දෙකක් හෝ ආගමික කණ්ඩායම් දෙකක් අතර නම්, ඊට බොහෝ පාර්ශ්වයන් ඉතාමත් ඉක්මණින් සම්බන්ධ වන අතර, එමගින් ගැටුම විසඳීමට ඇති හැකියාව වඩාත් සංකීර්ණ විය හැකිය. හින්දු කෝවිල අසල සුරුවමක් තැබීමට කතෝලිකයන් දැරූ උත්සාහය උඩප්පුවේ ගැටුමක් බවට පත්විය. දෙපාර්ශ්වය අතර පවතින සමාජ ඇගැයුම් හා විශ්වාසයන් ආරවුල හා සම්බන්ධ කළ විට, අදාළ ගැටුම විසඳීම වඩාත් අපහසු කරවයි. මෙම පාර්ශ්වයන් ප්‍රතිචාර දක්වන්නේ වෙනස් ආකාරයෙන්ය; ප්‍රශ්නය විසඳීමට ගන්නා සමහර උත්සාහයන් එම ප්‍රශ්නයේ තත්ත්වය තීව්‍ර කිරීමට හේතුවිය හැක. මෙවැනි තත්ත්වයන් වලදී අදාල ආගමික ආයතන හා පුද්ගලයන් ඊට මැදිහත් වෙයි.

> "ග්‍රාම සේවකට, ප්‍රාදේශීය ලේකම්ට, උප දිසාපතිට, දිසාපතිට, ඇමතිවරුන්ට හා මන්ත්‍රීවරුන්ට අපි මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් දැනුම් දුන්නා, නමුත් කිසිම විසඳුමක් ලැබුනේ නැහැ."
>
> (ප්‍රධාන තොරතුරුදායකයා, පි, නාගවිල්ලුව)

සිංහල හා මුස්ලිම් ජනතාව අතර ආරවුල හටගත් අවස්ථාවේ, එයට මුස්ලිම් පල්ලි කමිටුවේ නායකයින් හා පන්සල් කමිටුවේ නායකයින් සම්බන්ධ වුණේ, මුලින්ම මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඔවුන්ට තොරතුරු දැන්වූ නිසයි. පාර්ශ්ව දෙක අතර සංවාදයක් ඇති කිරීමට පහසුකම් සලසමින් මෙම ආයතන හා පුද්ගලයන් ආරවුල විසඳීමට මැදිහත් විය.

ගැටුම ප්‍රචණ්ඩ තත්ත්වයට පත් වූ විට, පොලිසිය මැදිහත් වී තවදුරටත් ප්‍රචණ්ඩවීම වළක්වයි. මෙය තාවකාලික විසඳුමක් ලෙස පෙනී ගියත්, තත්ත්වය නරක අතට හැරීම වැළැක්වීමට මූලික වන වැදගත් පියවරකි.

ස්වාභාවික සම්පත්, ප්‍රතිලාභ, ජීවනෝපායන් මත පදනම් වූ තරගකාරීත්වය නිසා ඇතිවෙන ගැටුම්වලට රජයේ නිළධාරීන් සම්බන්ධ වෙයි. විවිධ ජන කණ්ඩායම්වල ජීවනෝපාය මාර්ගවලට භෞතික සීමා මායිම් ලකුණු කිරීමෙන් විසඳුම් සැපයීමට ඔවුහු උත්සාහ කරති. වනාතවිල්ලුවේ, මුහුදු වෙරළේ බෝට්ටු තබාගැනීමේ ඉඩකඩ සම්බන්ධ ආරවුලට දිසාපති හා උප දිසාපති සම්බන්ධ වී තමන්ගේ බලාධිකාරය පාවිච්චි කර, ගැටුම් පාර්ශ්වයන් 3ට සීමා ලකුණ කර දෙන ලදි. උඩප්පුවේ කතෝලික ප්‍රජාවට සුරුවම තැනීමට ඉඩමක් පිරිනැමීමෙන් ගැටුමට විසඳුමක් ලබාදීමට මූන්දලම උප දිසාපති උත්සාහ කළේය.

සමහර ගැටුම් සම්බන්ධයෙන්, අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන සහ ඔවුන්ගේ දේශීය නියෝජිතයන් ද වැදගත් භූමිකාවක් ඉටු කරයි. ප්‍රාදේශීය රාජ්‍ය නොවන ආයතන, නව යටිතල පහසුකම් සැපයීමට මූල්‍යමය ආධාර ලබාදීම හෝ පවතින දුක්ගැනවිලි සමනය කිරීමට අධාර කිරීම මගින් ගැටුම්වලට මැදිහත් වෙයි. උදාහරණයක් ලෙස, USAID ආයතනය, ග්‍රාමීය සංවර්ධන පදනමට හා ISRC ආයතනයට ආධාර සැපයීමෙන් සිරිමාපුර ගැටුම හා නොරොච්චොලේ ගැටුම විසඳීමට මැදිහත් වීම දැක්විය හැකිය. ආරවුල පොදු දේපල මත පදනම් වූ විට හා සංකීර්ණ නොවූ විට, මෙවැනි මැදිහත්වීම් ගැටුම් විසඳීමට මඟ පෙන්වයි.

උතුරින් පලවා හැරීම නිසා, අවතැන්වූවන් පැමිණීමට පටන් ගැනීමත් සමගම අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන, කෙටි කාලීන හදිසි සහන ක්‍රියාකාරම් කිරීමට පටන් ගත්තේය. ප්‍රාදේශීය සත්කාරක ප්‍රජාව, ආධාර ව්‍යාපෘතීන් හා වැඩසටහන්වලින් බැහැර කිරීම නිසා, තරගය හා ප්‍රතිවිරෝධය දිගු කාලයත් තිස්සේ මේ කණ්ඩායම් අතර පවතින අතර, රාජ්‍ය නොවන සංවිධානවලට ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට සිදු වී ඇත. සත්කාරක ප්‍රජාව හා අවතැන්වූවන් අතර ආතතියක් ඇති කිරීමට මේ බැහැරකිරීම හේතුවී ඇත. මෙම ආතතීන් සම්බන්ධයෙන් ක්‍රමානුකූලව පරීක්‍ෂා කිරීමෙන් පෙනී යන්නේ අවතැන්වූවන්ට වඩා, සත්කාරක ප්‍රජාව තුළ අවධානමට ලක්විය හැකි පිරිස් සිටින බවයි. මෑතකදී, අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන සත්කාරක ප්‍රජාවට උපකාර කිරීමට අවධානය යොමුකර ඇත්තේ මේ හේතුව නිසාය.

> "අවතැන්වූවන් පැමිණීමට පෙර මෙහේ එකම රාජ්‍ය නොවන සංවිධානයක්වත් තිබුණේ නැහැ. මෙහේ සිංහල හා මුස්ලිම් ජනතාව අතර ප්‍රශ්න තිබුණෙත් නැහැ. දැන් මෙහේ දේශීය හා අවතැන්වූ මුස්ලිම්වරුන් අතරත් ප්‍රශ්න. අවතැන්වූවන්ගේ පැමිණීම, මුල් පදිංචිකරුවන් වූ සිංහල හා මුස්ලිම් ජනතාවට අවාසියක් වුණා. අවතැන්වූවන්ගේ හොඳ ජීවනමට්ටමක් තියෙනවා. ඒගොල්ලන්ට වාහනත් තියෙනවා, ඉඩම්වලට ඔප්පුත් තියෙනවා. නමුත් මුල් පදිංචිකරුවන් තාමත් ඔවුන් හිටපු තත්ත්වයේමයි."
>
> (ප්‍රධාන තොරතුරුදායකයා, පි, පලවි)

## 5.5 හරස්කඩ ගැටළු

මෙතෙක් අධ්‍යයනය කළ ගැටුම් සම්බන්ධයෙන් පොදු බවක් හෝ සමාන බවක් ඇති සිද්ධි පහතින් දැක්වේ. මෙම සිද්ධි පුත්තලමේ පවතින ගැටුම් පරිසරය විග්‍රහ කරන අතර දිස්ත්‍රික්කයේ ඇති වෙනත් ගැටුම් පසුබිමෙහි ඇති හේතු වශයෙන්ද ඒවා දැක්විය හැකිය. ගැටුම් විසඳීමට දරන ප්‍රයත්නවලට මෙම සිද්ධි වෙනස් ආකාරයක ප්‍රතිමාන ලෙස බලපායි.

*අනන්‍යතාවය*

පුළුල් ඇසකින් බලන කල මෙම අධ්‍යයනයෙන් හෙළි වූයේ, 'අනන්‍යතාවය' යන සංකල්පය ගැටුම් හටගැනීමේ සිට ගැටුම් නිරාකරණය දක්වා බොහෝ සෙයින් බලපාන බවයි. 'අනන්‍යතාවය' යන සංකල්පය සම්බන්ධයෙන් වඩා ජනප්‍රිය ප්‍රවේශ දෙකක් පවතී. ඉන් පළමුවැන්න, තමන් ස්ථිර වශයෙන් සමූහයකට අයත්වීම හා පොදු ජීව විද්‍යාත්මක ලක්‍ෂණ තිබීම පොදු මුතුන් මිත්තන් සිටීම යන විෂය මූල මිණුම් දඬුවලින් මිණිය හැකිවීම. දෙවැන්න, ගොඩනැගුනේ අනන්‍යතාවය යනු සමාජ නිර්මාණයක්ය යන මතවාදයෙනි. එනම්, අනන්‍යතාවය ගොඩනැගුණේ මූලික වශයෙන් යම් යම් හැඩ ලක්‍ෂණ දේශපාලනික තෝරාගැනීමෙනි. මේ ප්‍රවේශ දෙක අතර විවිධ විකල්ප ප්‍රවේශයන් හඳුනාගත හැකිවේ. විකල්ප ප්‍රවේශයක් ලෙස මෙම අධ්‍යයනයෙන් 'අනන්‍යතාවය' යන්න හඳුනා ගැනුණේ නිතර වෙනස්වන විවිධ සමාජ අත්දැකීම් හමුවේ වෙනස්වෙමින් ඉදිරියට ඇදෙන්නක් ලෙසිනි. මේ අන්දමින් බලන කල 'අනන්‍යතාවයේ' මූලික ලක්‍ෂණයක් වනුයේ, එය 'ස්ථිතික' හෝ 'ස්ථිර' එකක් නොව එය අවශ්‍යතාවය

අනුව වෙනස්වන බවයි. ඇතැම් අවස්ථාවලදී අනන්‍යතාවයන් වෙනස් වන සමාජ අත්දැකීම් අනුව අළුතින් නිර්මාණය වන බව මෙම අධ්‍යයනය විසින් සොයා ගන්නා ලදි.

"1990දී අපි පළමුවෙන් මෙතැනට පැමිණිවිට අපිට සැම තැනම විසිරී සිටියෙමු. එම අවස්ථාවේදී මන්නාරමෙන් පැමිණ සිට අවතැන්වූවන් එකතු කරගෙන මෙම ස්ථානය සොයා ගත්තෙමු. කැලෑව කපා බිම සකස්කර ගෙවල් සාදා අද පවතින තත්ත්වයට මෙම ප්‍රජාව ගොඩ නැගුවෙමු. එම නිසා, මින් ඉහතදී කවුරුවත් දැන් නොසිටි මේ ස්ථානය එරුක්කලම්පිටිය-නාගවිල්ලු යනුවෙන් නම් කළා."

(ප්‍රධාන තොරතුරුදායකයා, පි, නාගවිල්ලු)

සමහර අවස්ථාවල මෙම අධ්‍යයනයේ 'අනන්‍යතාවය' යන්න විස්තර කර ඇත්තේ, සමූහයකට අයත්, පොදු උරුමයකට හෝ ඉතිහාසයකට නෑකම් කියන සිද්ධාන්තයක් ලෙසිනි. එහෙත්, මෙම පොදු උරුමය හෝ ඉතිහාසය විවිධ අවස්ථාවල වෙනස් ආකාරයකට පෙනී යයි. ප්‍රජා සමූහය තුළම විවිධ අනන්‍යතා තිබෙනු දුටුවෙමු. ආගම් අතර වාර්ගික වෙනස්කම් නිදසුන් ලෙස ගතහොත් අවතැන්වූ මුස්ලිම් ජනතාව හා 'දේශීය' (මුලින් පදිංචි වී සිටි) මුස්ලිම්වරුන් අතර වෙනස්කම් තිබිණ.

"ඔවුන් මුස්ලිම්වරුන් වුවද සෑහෙන ප්‍රමාණයක සංස්කෘතික විවිධතා අප හා අවතැන්වූවන් අතර තිබිණ."

(පි, 50, නොරොච්චොලෙයි)

අවතැන්වූවන්ගේ අත්දැකීම් වෙනස් බව වෘත්තීකයන්ගේ මාර්ගෝපකරණය 2004 (Practitioner's Kit 2004) නම් CHA ප්‍රකාශනය මගින් සොයාගෙන ඇත. සමස්ථයක් වශයෙන් ගත්විට, ඔවුන් සිටි භූමියෙන් පන්නා දමා දිවි ගලවා ගැනීමට සැලැස්වූ පොදු අත්දැකීම් තිබුණ ද ඔවුන් සිටි භූගෝලීය ප්‍රදේශය, වාර්ගිකත්වය, දේශීය ජනගහණය හා අනෙකුත් සාධක අනුව, ඔවුන් මුහුන දුන් තත්ත්වයන් විවිධ වුණා[2]. මෙම අදහස බොහෝ දුරට අධ්‍යයනයෙන් ද සනාථ විය. අවතැන් වූ ප්‍රජාව තුළ ඔවුන්ගේ මුල් භූමිය අනුව බෙදීම් තිබුණි. සම්පත් බෙදාගැනීමේ දී හා එක් කණ්ඩායමකට පමණක් ප්‍රවේශ විය හැකි සමාජ සම්බන්ධතා ජාල තිබීම තුළින් මෙම වෙනස්කම් දැකිය හැකි විය.

"යාපනයේ අවතැන්වූවන්ට, ඔවුන්ගේම කියා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නොසිටියේය. නමුත් මන්නාරමේ අවතැන්වූවන්ට මන්ත්‍රීවරයෙක් සිටියේය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ඔවුන් සැමට වගකිව යුතු වුවද, ඔහුගේ වැඩි අවධානය ලැබුනේ මන්නාරමෙන් පැමිණි අයටය."

(පි, 60, සිරිමාපුර)

"පුද්ගලයින් නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය යාපනයේ හා මන්නාරමේ අවතැන්වූවන්ට දෙවිධියකට සළකයි. මන්නාරමේ අවතැන්වූවන් දියුණු තත්ත්වයක සිටින බව කාටත් පෙනී යයි."

(පි, 60, සිරිමාපුර)

අනන්‍යතාවය පාවිච්චි කළ ආකාරයෙන්, එය ඉදිරියට ගෙන යාමත් සිත් ගන්නා සුළුය. ඇතැම් අවස්ථාවක අනන්‍යතාවයේ වැදගත්කම මතුවන්නේ ඔවුන්හට තර්ජන එල්ලවන විට හෝ එක් කණ්ඩායමකට අයත්වීම ඵලදායක අවස්ථාවලදීය. එකම අනන්‍යතාවය, අවස්ථාවට අනුව ඇතැමෙකුට වාසි ගෙන දෙන අතර තවත් සමහරෙකුට අවාසි ගෙන දෙයි.

2 Practitioner's Kit for Return, Resettlement, Rehabilitation and Development by CHA and the Brookings-SAIS project in Internal Displacement (2004).

අනන්‍යතාවය බලය හා බැඳී පවතියි. සමහර පසුබිම්වලදී අනන්‍යතාවය වැදගත් වන්නේ, ඔහුට හෝ ඇයට එම ප්‍රදේශයේ බලය තිබේනම් හෝ යම් සිද්ධියක් සම්බන්ධ බලයක් ඇත්නම් පමණි. පාර්ශ්වයක් හෝ පාර්ශ්ව කිහිපයක් අතර ගැටුම් පවතිනවිට, සංඛ්‍යානමය වශයෙන් පාර්ශ්වයකට ඇති බලය තීරණාත්මකවේ.

එක් අනන්‍යතා කණ්ඩායමකට ඔබ අයත්වීමේ වැදගත්කම වන්නේ, ඔබට ප්‍රවේශ විය හැකි සමාජ සම්බන්ධතා ජාලයේ කොටස්කරුවකු වීමට ඔබට පුළුවන් වීමයි. මේ තත්ත්වය ගම්‍යමාන සියදහස් ගණනකින් තිබිය හැක. සාමාන්‍ය සන්දර්භය තුළ කෙනෙකුට, ගැටුමකදී හෝ ආරවුල් තත්ත්වයකදී ඒවා නිරාකරණය කරගැනීමට සමාජ සම්බන්ධතා වැදගත්වේ. එනම්, වඩා බලවත් පාර්ශ්වය ඔබ වෙනුවෙන් ඉදිරිපත් වන්නේ නම්, එකී ආරවුල ඔබට වාසි සහගත අයුරින් විසඳා ගැනීමට පුළුවන.

එහිදී, ප්‍රතිචාර දැක්වූවන්ගේ අදහස අනුව, අවතැන්වූවන් අතර සිදුවී *'සංස්කෘතික මිශ්‍රවීම'* නිසා සාධනීය හා නිශේධාත්මක ප්‍රතිඵල ලැබී තිබේ. අවතැන්වූ ජනයා හා දේශීය මුස්ලිම්වරුන් අතර සිදුවී තිබෙන අන්තර් විවාහයන් නිසා ගොඩනැගුණු අළුත් සම්බන්ධතා කරනකොට ගෙන දෙපාර්ශ්වය අතර පරතරය අඩුවී තිබේ. සාධනීය තත්ත්වයක් ඇතිවීමට දෙවැනි නිදසුන වන්නේ, සිංහල ප්‍රජාව අවතැන් වූ ප්‍රජාව සම්මිශ්‍රණය වීමයි. අවතැන්වූවන්, පළමු වතාවට මේ ප්‍රදේශයට පැමිණි අවස්ථාවේ ගැටුම් ඇතිවූයේ සිංහල භාෂාව කථා කිරීමට නොහැකිවීමේ හේතුවෙනි. ඔවුන් සිංහල බස හැසිරීමට දැන ගැනීමත් සමග එම ගැටුම් අඩුවිය.

සංස්කෘතික වශයෙන් ප්‍රජාව මිශ්‍රවීමෙන් අහිතකර ප්‍රතිඵල ඇතිවේයැයි ඇතැම්හු නිගමනය කළහ. ගමේ මුස්ලිම්වරු විශ්වාස කරන පරිදි අවතැන්වූවන් අතර දෑවැදි ක්‍රමය, ගමේ මුල් බැස ගත්තේ මේ සංස්කෘතික මිශ්‍රවීම නිසා විය හැකිය.

> "ඔවුන් අප මෙන්ම මුස්ලිම්වරු වුවද අප හා ඔවුන් අතර සෑහෙන දුරට සංස්කෘතික වෙනස්කම් පවතියි. ඔවුන් පැමිණෙන්නට ප්‍රථම පුත්තලමේ දෑවැදි ක්‍රමයක් තිබුණේ නැත. අද අපගේ ප්‍රජාව තුළ ද ඔවුන් නිසා දෑවැදි ක්‍රමය මුල් බැස ගෙන ඇත."
>
> (පි, 51, නොරොච්චොලේ)

***ඉඩම්***

ඉඩම් ප්‍රශ්නය වැදගත් වන්නේ මෙහි සිදුවන සියළු ගැටුම් පිටුපස ඇත්තේ ඉඩම් ලබාගැනීමට ඇති තරගයයි. පුත්තලමේ ඉඩම් විශාල වශයෙන් ප්‍රයෝජනයට ගෙන නැත. හේතුව ජන හීන වීම සහ කෘෂිකාර්මික කටයුතුවලට එම ඉඩම්වල පිහිටීම නුසුදුසු වීමයි. පිටින් තාවකාලිකව පැමිණෙන ජනතාවට නැවතීමට වාසස්ථාන හා කෘෂිකර්මාන්තයට ඉඩම් ලබාදී තිබුණි.

> "දේශීය මුස්ලිම්වරුන් අතර නවසාමඩු ප්‍රදේශයේ කෘෂිකර්මය සඳහා ඉඩම් බෙදා දී ඇත. එක පවුලකට අක්කරයක ඉඩමක් ලැබුණ ද එය අපට ප්‍රමාණවත් නොවීය. ඉඩම වගාකිරීමට යන වියදම සරිලන ආදායමක් ලැබුනේ නැත. දෙවනුව, අලි ඇතුන්ගෙන් කරදර පැමිණියේය. මේ නිසා අප නොගත් ඉඩම් වනාතවිල්ලුවෙන් හා කරතිව් වලින් පැමිණි 300 දෙනාට ලබා දෙන ලදි."
>
> (ඉලක්කගත කණ්ඩායම් 1, වනාතවිල්ලු)

අවතැන්වූවන් පැමිණීමට පෙර පුත්තලමේ ඉඩම් සංසන්ධනාත්මකව අඩු මිලකට ගත හැකි විය. නමුත් ඔවුන්ගේ පැමිණීමෙන් ඉඩම් පරිහරණ ක්‍රම හා ඉඩම්වල වටිනාකම වෙනස්විය. මුලදී අවතැනවූවන්ට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අයත් ඉඩම් බෙදාදෙන ලදි. පසුව පුද්ගලික ඉඩම් හිමියන්ගෙන් විශාල ඉඩම් ප්‍රමාණයක් ලබාගෙන ඔවුන් අතර බෙදා දෙන ලදි.

'මෙම ඉඩම් හිස් ඉඩම් වූ නමුත් දැන් මන්ත්‍රීවරයා අවතැන්වූවන් වෙනුවෙන් නිවාස 700ක් සාදා දී ඇත'.
(ඉලක්කගත කණ්ඩායම්, පලාවි)

'පසුගිය කාලය හා සසඳනවිට පුත්තලමේ ජනගහණය වැඩිවී තිබේ. ඡන්ද නාම ලයිස්තුව අනුව, මෙහි සිංහල බෞද්ධ බහුතරය 78%ක් විය. අද අවතැන්වූ පවුල් විශාල සංඛ්‍යාවක් සිටිති. ඔවුන්ගේ කඳවුරක පවුල් 200ක් සිටිති. මෙහි තවත් නිවාස 700ක් සෑදීමට යෝජනා වී තිබේ'.
(ප්‍රධාන තොරතුරුදායකයා, පි, පලාවි)

අවතැන්වූවන් පුත්තලමේ ස්ථිර වාසස්ථාන සාදාගැනීමෙන් පසුව එහි සිටින මුස්ලිම් හා සිංහල ජනයාගෙන් ඉඩම් මිලට ගත්හ. ඔවුන්ට නැවත තම ගම්බිම්වලට යා නොහැකි බව අවබෝධවීමෙන් පසුව, ඔවුන්ගේ ඉතුරුම්, ස්වර්ණාභරණ හා වෙළෙඳාමෙන් උපයාගත් ධනය වැය කොට පළාතේ ඉඩම් මිලට ගත්හ. මෙසේ ඉඩම්වලට ඉල්ලුම වැඩිවීමත් සමග ඉඩම් මිලද සීඝ්‍රයෙන් ඉහළ යන්නට විය.

'මුලදී මෙම ඉඩම්වලට ඉහළ මිලක් ලැබුණේ නැත. අවතැන්වූවන්ගේ පැමිණීමෙන් ඉඩම්වලට තිබූ ඉල්ලුම කොතෙක් වැඩි වී ද යත් රුපියල් ලක්ෂ කීපයක් නැතුව කුඩා බිම් කඩක්වත් මිලට ගත නොහැකි තත්ත්වයක් උදාවී තිබේ'.
(ප්‍රධාන තොරතුරුදායකයා, පලාවි)

'අපි එක පවුලකට පර්චස් 20ක් විකුණුවෙමු. පර්චස් 10, රුපියල් 15,000ට විකුණූ නමුත් අද වනවිට එය, රුපියල් ලක්ෂ 2ක් වේ. අප හිතුවේ සියළු දෙනාම එකම ප්‍රදේශයක පදිංචි වීමටයි'.
(පි,50, පලාවි )

වත්මන් තත්ත්වය අවුලෙන් අවුලට පත්වී තිබෙන්නේ පවුලේ එක් එක් සාමාජිකයින්ට වැඩි වැඩියෙන් ඉඩම් අවශ්‍ය වීමත් සමගිනි. මේ තත්ත්වය පෙන්නුම් කරන්නේ ප්‍රශ්නය පුපුරා යැමට පෙර රජය පුත්තලමේ ඉඩම් පරිහරණය පිළිබඳ යම් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු බවයි.

'වගා කටයුතු හා පදිංචියට ඇති ඉඩම් ප්‍රමාණය අඩුවෙමින් පවතියි. මෙම ප්‍රශ්නය ප්‍රදේශයක ජනතාව හා අවතැන්වූවන් දෙපාර්ශ්වයටම බලපානු ඇත. නිවාස සාදා ගැනීමට අවතැන්වූවන්ට ලැබෙන්නේ පර්චස් 10ක බිම් කඩකි. දැන් තම දරුවන්ට ඉඩම් බෙදා දීමේදී කුඩා බිම් කැබැල්ල තව තවත් කැබලි බවට පත්වේ'.
(පි, 51, නොරොච්චොලේ)

'මෙම පලාවි ඉඩම මාගේ ඥාතියෙකු වන සාලි සමග මිලට ගත්තේ 1977දීය. එය මිලදී ගත්තේ කාරණා දෙකක් හේතුකොටගෙනය. මට දියණියන් දෙදෙනෙකු සිටියි. අනාගතයේදී ඔවුන්ට දෑවැදි දිය යුතුය. අනෙක් කාරණය අවතැන්වූ පුද්ගලයන්ට එක ප්‍රදේශයක ජීවත්වීමට ඉඩ සලසා දීමයි'.
(පි, 52, පලාවි)

'මේ වනවිට පොදු පහසුකම් පාවිච්චි කිරීමේදී ප්‍රදේශවාසීන් හා අවතැන්වූවන් අතර සුළු අමනාපකම් ඇතිවී තිබේ. ආලන්කුඩා හා පල්ලිවසල්තුරෙයි යන ප්‍රදේශවල වගා ඉඩම් සීමා වී ඇත්තේ ජනගහණය වැඩි වී ඉඩම් පරිහරණය වැඩිවීම නිසයි. ඉදිරි අවුරුදු 10 තුළ මේ ප්‍රශ්නය උග්‍රවනු ඇත. මෙවැනි ගැටළුවලට විසඳුම් සෙවීම දුෂ්කරයි'.
(ගැ, 22, නොරොච්චොලෙයි )

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අයත් ඉඩම් අවතැන්වූවන් විසින් බලහත්කාරයෙන් අල්ලා ගැනීම, විශේෂයෙන් සිංහල ප්‍රදේශවාසීහු අවිශ්වාසයෙන් යුතුව බලා සිටිති.

'ඉඩම් මුල් කරගෙන පුත්තලමේ බොහෝ ප්‍රශ්න මතුවෙමින් තිබේ. ඇතැම්හු රජයේ ඉඩම් බුල්ඩෝසර් කර සකස් කර ගනිති. කිසිවෙකු ඊට මැදිහත් නොවුණ හොත් එහි අවතැන්වූවෝ පදිංචි වෙති. එක් අමාත්‍යවරයෙක් ද මේ ආකාරයෙන් ඉඩම් අල්ලා ගනී. මේ තත්ත්වයට පොලිසිය ඍජුවම මැදිහත් වී වගකිව යුතුය. නමුත් ඔවුහු අල්ලස් ගෙන ගැටළුව නිරාකරණය නොකරති.
(ප්‍රධාන තොරතුරුදායකයා, පි, පලාවි)

'අනෙකුත් ගම් සමග මේ ආකාරයේ ගැටුම් පවතින්නේ නැත. අවතැන්වූවන් පැමිණිවිට සිංහලයන්ට අයත් ඉඩම් රජයට ගෙන අවතැන් කඳවුරු සෑදීම නිසා යම් ප්‍රශ්න තිබුණි. නමුත් සිංහල ජනතාවට වෙනත් ප්‍රදේශයකින් ඉඩම් ලබාදීමෙන් අනතුරුව ප්‍රශ්නය විසඳී ඇත.'
(ගැ, 39, සිරිමාපුර)

සමස්තයක් වශයෙන් ගත්කළ රජයෙන් ඉඩම් අත්පත් කොටගෙන අවතැන්වූවන්ට ලබාදුන්න ද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අයත් ඉඩම් ඔවුන් අත්පත් කරගත්ත ද ප්‍රදේශවාසීන්ගෙන් ඉඩම් මිලට ගත්ත ද තමන්ගේ ඉඩම් සියල්ල ඔවුන් ගන්නා බවට හැඟීමක් සිංහල ජනතාවගේ සිත් තුළ ඇත.

'අපගේ ගම වටා මුස්ලිම් ගම්මාන ඇත. මේ ප්‍රදේශය ඔවුන්ගේ අධිරාජ්‍යයයි. ඔවුන් මුලින් පැමිණියේ අවතැන්වූවන්ගේ කඳවුරුවලටයි. ඊළගට පළාතේ ඉඩම් මිලට ගත්හ. මේ පළාතේ ජනතාව ඔවුන්ගේ ඉඩම් කොටස් කර වාරිකව ගෙවන පරිදි විකුණති. මේ නිසා ගැටළුවලට මුහුණ දෙන්නේත් දුක් කරදර විඳින්නේත් අපමය. ඔවුන් පරිහරනය කරන්නේ අපගේ සම්පත්ය. මේ ගැන කිසිවෙකුට පැවසීමට ඉඩක් නොමැත. එසේ පැවසුවද අවසානයේ වැරැද්ද අපගේ වනු ඇත.'
(ඉලක්කගත කණ්ඩායම්, පලාවි)

'යුද්ධය අවසන් වී සාමය ළගා වුවද ඔවුන් නැවත ඔවුනගේ ගම්බිම්වලට නොයනු ඇත. ඔවුන්ට මේ ප්‍රදේශයේත් ඔවුන්ගේ මුල් පදිංචි ප්‍රදේශයේත් ඉඩම් ඇත. ඒත් අපට අපගේ ඉඩම් අහිමිවේ. ඔවුහු අපගේ ඉඩම් ටිකෙන් ටික අල්ලා ගනිති.'.
(ඉලක්කගත කණ්ඩායම්, පලාවි)

අවතැන්වූවන් ඉඩම් විශාල වශයෙන් මිලට ගෙන, ඔවුන්ගේ සාමූහික අනන්‍යතාවය පවත්වා ගනිමින් සමූහ වශයෙන් මේ ප්‍රදේශයේ පදිංචි වෙති.

'1990 දී අපිව (පවුල් 4300) යාපනයෙන් පිටමං කරන ලදි. මුලදී කොළඹට හා මීගමුවේ ප්‍රදේශවලට අපි ගියෙමු. 1990 සිට 1996 දක්වා මෙසේ පදිංචි වී සිටිමු. 1996 දී අෂ්රොෆ් මහතාගේ නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ අපි පවුල් 300ක් පලාවි ප්‍රදේශයට පැමිණියෙමු. එසේ කළේ යාපනයේ අනන්‍යතාවය නිසාය.'
(ප්‍රධාන තොරතුරුදායකයා, පි, පලාවි)

ඉඩම් සංවර්ධනය නොකර අවතැන්වූවන් පදිංචි වීම හෝ පදිංචි කරවීම සුදුසු නැත. ඔවුන් නිවාස තනාගන්නා විටදී හා දියපාරවල් ඔස්සේ පදිංචි වන විට ගැටළු මතුවේ. දැනටමත් ගංවතුර ගැලීම මේ පළාතේ බරපතල ප්‍රශ්නයකි. ජනගහණය වැඩිවීම සමඟ මේ ගැටළුව තව තවත් උග්‍රවනු ඇත.

'අප පළමුවෙන් මෙහි පැමිණෙනවිට මෙමම ප්‍රදේශය මහා කැලයකි. අවතැන්වූවන් මේ ඉඩම් නොගත්තානම් වෙන කිසිවෙකු ඒවා ලබාගනීවි' යැයි මම නොසිතමි. මේ ඉඩමට

ඇතුළු වීමට දින ගණනාවක් මුළුල්ලේ කැලෑව එළි කිරීමට අපට සිදුවිය.'
(ගැ, 22, සිරිමාපුර)

*බලය*

පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රජාමට්ටමෙන් පවතින ගැටුම් කොතරම් සංකීර්ණ ද බලයෙන් අනූනදැ'යි මෙම අධ්‍යයනයෙන් හෙළි කරයි. බලය පාවිච්චි කිරීම එතරම් සංවේදී නොවූනද රිදුම් ගෙන දෙන්නක් යැයි පවතින ගැටුම් දෙස බලනවිට පෙනී යයි. එක් ජන කණ්ඩායමට වාසි සැලසෙන පරිදි අන්‍යයන් ආමන්ත්‍රණය නොකර සිදුකරන වෙනස්කම් නිතර සිදුවේ. මෙය වඩාත් දක්කනට ලැබෙන්නේ ගම්වලට හා පොදු ස්ථානවලට අළුත් නම් ලබාදීම නිසාය. නම් හැමවිටම අනන්‍යතාවය හා බැඳී පවතී. පොදු ස්ථානවල නම් වෙනස්කිරීම දිස්ත්‍රික්කයේ අනෙක් ජාතීන්ගේ හදවතට දැනේ. මෙසේ අළුතින් නම් කරන පොදු ස්ථාන අවුරුදු ගණනාවක් තිස්සේ අනෙකුත් ජාතීන් වෙනත් නමකින් දැන සිටිය ස්ථානයන්ය.

'මේ ප්‍රදේශ සියල්ල අවතැන්වූවන් පදිංචිව සිටි ඒවා, දැන් ඔවුන් මෙහි නම *ඉරුක්කලම්පිටි* නමින් වෙනස් කරලා තියෙනවා. මෙහි මුල් නම *නාගවිල්ලු*. ඔවුහු මන්නාරමේ හෝ යාපනේ නම් වෙනස්කිරීමට අපිට ඉඩදේවිද? ඔවුන්ට පුත්තලමේ හා මන්නාරමේ ගෙවල්, දේපල තියෙනවා. මේ ප්‍රදේශ ගැන සොයා බැලීමට ඔවුන්ගේ ඥාතීන් හා මිතුරන් පැමිණෙනවා. එය අපගේ පැවැත්මට තර්ජනයක්.'
(ප්‍රධාන තොරතුරුදායකයා,ගැ, නාගවිල්ලු)

'මේ ප්‍රදේශයේ ගම්වලට අළුත් නම් ලබාදීම නිසා *ප්‍රියාකුලම* දැන් හඳුන්වන්නේ *ඉජ්ජිරාක්කුලම* ලෙසයි. නාගවිල්ලු යන පැරණි ගමට මුස්ලිම් නමක් දී නාමපුවරු අටවා තිබේ. දුම්රිය ස්ථානයේ නම් පවා වෙනස්කර තිබේ'.
(ඉලක්කගත කණ්ඩායම්, පලාවි)

මේවා මෙසේ සිදුකරන්නේ ඇතැම් කණ්ඩායම්වල අනන්‍යතාවය තහවුරු කරමින් ඔවුන් දිස්ත්‍රික්කයට හඳුන්වා දුන් වෙනස පෙන්වීම උදෙසාය. දිස්ත්‍රික්කයේ බොහෝ දෙනා මෙම කණ්ඩායම් දකින්නේ පිටස්තරයින් ලෙසයි. මේ හේතුවෙන්, මෙම දෙපාර්ශ්වය අතර බොහෝ ගැටුම් හටගෙන තිබේ. මෙවැනි අර්බුදකාරී වාතාවරණයක් තුළ බලය පාවිච්චි කිරීම පුළුල්වුවද භයානකවුවද ප්‍රතිවිපාක අත්කර දෙනු ඇත.

මෙසේ බලය පාවිච්චි කිරීම පළාතේ දේශපාලන පරිසරය සමග බැඳී පවතී. ශ්‍රී ලංකාවේ ජාතීන් අතර පවත්නා ජාතිවාදී හැඟීම්, ඒවා දේශපාලනයට බලපාන ආකාරය, වෙනත් ප්‍රතිවිරුද්ධ ජාතිවාදී හැඟීම් යනාදිය ආරවුල් අවුල් සහගත තත්ත්වයකට පත්කොට තිබේ. මේ තත්ත්වය අභියෝගයට ලක් නොකළ යුතු නොවේ. මෙම සංකීර්ණ පරිසරය තුළ සිටින ක්‍රියාකාරීන්ට ඉන් දේශපාලන වාසි ගැනීමට නුපුළුවන. සාමයට බාධාකරමින් ප්‍රජාමට්ටමේ බෙදුම්වාදී ස්ථරයක් ගත යුතු නොවේ. මෙම ස්ථරයේ ගන්නා යහපත් ප්‍රයත්නවලට ඉහළ මට්ටමේ ක්‍රියාකාරීන් විසින් බාධා පමුණුවන්නේ නම් ඒවා ඵලදායී නොවනු ඇත.

සංකීර්ණවූවද බලයෙන් අනූනවූද පරිසරයක් තුළ ප්‍රජාමූල ගැටුම් කළමණාකරණයෙහි සාර්ථකත්වය හා අසාර්ථකත්වය මෙම අධ්‍යයනයෙන් සලකා බැලේ. මෙම අධ්‍යයනයේ සොයා ගැනීම් පාවිච්චි කොට ගැටුම් කළමණාකරණය පුත්තලමේ සෑම ස්ථරයකම සිටින ක්‍රියාකාරීන් විසින් කළ යුතු බව තීරණය වේ.

*දේශපාලනය හා දේශපාලන ක්‍රියාකාරිකයන්*

මෙහිදී ප්‍රතිචාර දැක්වූවන්ගේ වැඩි දෙනෙකු ගැටුම් නිරාකරණ ක්‍රියාවලිය තුළ දේශපාලනඥයාගේ කාර්යභාරය පිළිබඳව කරුණු දැක්වූහ. ඔවුන් විශ්වාස කළේ බලයේ සිටින දේශපාලනඥයින් සාමාන්‍ය ජනතාවගේ නියෝජිතයින් හැටියට යම් ප්‍රජා සමූහයකට සිදුවන තර්ජන පිළිබඳ අවම කරගැනීමට වගකීමක් දරණ බවයි. එමනිසා යම් ගැටුමකට හේතු වූ කරුණු පරීක්ෂාවට ලක්කර ඔවුන් ගැටුම් නිරාකරණය කිරීමට ඉදිරිපත් විය යුතු බවයි.

මේ සඳහා දේශපාලනඥයින් මැදිහත් වී ගත යුතු ක්‍රියාමාර්ග මෙම අධ්‍යයනය පහත දැක්වෙන අයුරින් හඳුනාගෙන ඇත;

- ගැටුම හා ගැටුමට පාදක වූ මූල හේතු හඳුනාගැනීම
- ගැටුම් පාර්ශ්වයේ නියෝජිතයෙකු වශයෙන්
- ගැටුමට පරිබාහිර මැදිහත්කරුවෙකු ලෙස
- ගැටුමට විසඳුම් ලබාදෙන්නෙක් ලෙස
- දෙපාශ්වයටම අයත් නැති පුද්ගලයෙක් ලෙස (අපක්ෂපාතී)

සැමගෙන් මතු වූ අදහස වූයේ පක්ෂය, ජනවර්ගය හෝ ආගම නොසලකා ගැටුම් නිරාකරණය කරගැනීමට අවංක චේතනාවක් දේශපානඥයින්ට තිබිය යුතු බවයි. තවද, ප්‍රතිචාර දැක්වූවන්ගේ අදහස වූයේ ගැටුමක් උග්‍රවීමට පළමුව එය සාර්ථකව විසඳාගැනීමට මැදිහත් විය යුතු බවයි. එක් දේශපාලන නියෝජිතයෙකු පැවසූයේ ඉතාම සුළු සිද්ධියක් මත ඇතිවෙන ගැටුමක් වුවද වාර්ගික ප්‍රචණ්ඩත්වයකට හෝ දේශපාලන ප්‍රචණ්ඩත්වයකට පරිවර්තනය වීමට ඉඩ ඇති බවයි. ප්‍රජා මට්ටමේ නියෝජිතයින් හා ආයතනවලින් පැමිණි නියෝජිතයන් සඳහන් කළේ දේශපාලනඥයින් පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා හෝ ඡන්ද ලබාගැනීමට හෝ ක්‍රියාකිරීමෙන් ගැටුම් උග්‍ර කරන බවයි. ජනතාවගේ ආගමික ව්‍යවහාර පිළිබඳ නොදැනුවත්කම නිසා ද ගැටුම් ඇතිවිය හැකිය.

ගැටුම් නිරාකරණ ක්‍රියාවලියට දේශපාලනඥයින් සම්බන්ධවෙන්නේ ප්‍රධාන වශයෙන් මැතිවරණ කාලය තුළ දේශපාලන ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙනි. (තමන්ගේ දේශාපාලන පක්ෂ තුළ හා අනෙක් දේශපාලන පක්ෂ සම්බන්ධ ප්‍රචණ්ඩත්වය) මුස්ලිම් හා සිංහල ප්‍රජාව අතර ඇතිවූ ගැටුම් විසඳීමට දේශපාලන නියෝජිතයෝ සහභාගී වූහ. ඉන් මතු වූ දේශපාලන ප්‍රචණ්ඩත්වය සාර්ථකව නිරාකරණය වුව ද මුස්ලිම් හා සිංහල ජන කණ්ඩායම් අතර ඇතිවූ වෙනත් ගැටුම් නිරාකරණයට කල්ගත වන්නේ දෙපාර්ශ්වය විවිධ පරිත්‍යාගයන් කිරීමට ඇති නොකැමැත්ත නිසාවෙන් හා මේ සිද්ධීන්වලට දෙපාර්ශ්වයේ බලගතු දේශපාලනඥයින් සම්බන්ධවීමේ හේතුවෙනි.

මෙවැනි ගැටුම් නිරාකරණය කරගැනීමට පහත දැක්වෙන උපායමාර්ග පාවිච්චි කරන ලදි:

- පෞද්ගලික අභිලාෂයන් පසෙකලා ගැටුම නිරාකරණය සඳහා අවංක චේතනාවෙන් යුතුව සාකච්ඡා ඇරඹීම
- පක්ෂ සාමාජිකයන්ට හා ආධාරකරුවන්ට ගැටුමෙහි ඇති දිගුකාලින අහිතකර විපාක පහදා දීම
- ගැටුමට තුඩුදුන් නිවැරදි කරුණු/තොරතුරු තදින් බලපාන අදහස් දරන්නන්ට හා එම අදහස් කණ්ඩායම් නොමඟ යැවීමට යොදා ගන්නන් වෙත සාර්ථකව විස්තර කිරීම
- නීතිමය පියවර ගැනීම. නිල වශයෙන් පොලිසියට කරුණු ඉදිරිපත් කිරීම, උසාවියට නඩු ඉදිරිපත් කිරීම
- ගැටුම උත්පාදනය වන ස්ථානයේදීම ඊට සම්බන්ධ පුද්ගලයින් හඳුනාගෙන සාකච්ඡාකොට එකඟතාවයකට පැමිණීම

## 5.6 සමාජ ආර්ථික තත්ත්වයන්

***ජීවනෝපායන්***

සීමාසහිත වූ සම්පත්වලට ඇති වූ තරගය සාමාන්‍ය තත්ත්වයට වඩා උග්‍ර වීමෙන් මිනිසුන්ගේ ජීවනෝපායේ වෙනස්කම් ඇතිවේ. 1990දී යාපනයේ හා මන්නාරමේ සිට එල්ටීටීඊ සංවිධානය විසින් පිටමං කළ අවතැන්වූ ජනතාව පුත්තලමට පැමිණි දින සිට ඔවුන් හා සත්කාරක ජනතාව අතර සම්පත් බෙදාගැනීමේදී වියවුල පුත්තලමේ අවතැන්වූවන්ට ඇතිවිය. රජය සම්පත් වෙන්කර තිබුණ ද ඒවා යැවෙන්නේ ඔවුන්ගේ මුල් පදිංචි ස්ථානවලටය. එමනිසා පුත්තලමේ සත්කාරක ජනතාව හා අවතැන්වූවන් විශේෂයෙන් සෞඛ්‍යය හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ සම්පත් ලබාගැනීමට තරගයක යෙදී සිටියි (IDMC 2007)[3].

මෙම අධ්‍යයනයෙන් පරීක්ෂා කරන ලද ගැටුම් බොහෝමයක් හට ගන්නේ ජීවනෝපායන් හා සීමිත සම්පත් සඳහා තරග වැදීම හේතුවෙනි. ප්‍රදේශයේ ජන සංඛ්‍යාව ඉහළ යෑමෙන් මෙම තරගය උත්සන්න වීමට හේතුවිය. උදාහරණයක් වශයෙන් ගතහොත් මුස්ලිම් හා සිංහලයන් අතර නාගවිල්ලුවේ ගැටුම හටගත්තේ ත්‍රීරෝද නවතා තැබීමේ ස්ථාන ලබාගැනීම සඳහායි.

අනෙකුත් දිස්ත්‍රික්ක සමග සැසඳීමේදී පුත්තලමට ස්වාභාවික සම්පත් හිඟවුවත් ජීවනෝපායන් රාශියක් ඇත. වැඩිදෙනා නිෂ්පාදන කර්මාන්තයේ හා කෘෂිකර්මයේ යෙදෙති. සැහෙන පිරිසක් තොග හා සිල්ලර වෙළෙඳාම ප්‍රධාන ජීවනෝපාය වශයෙන් කරති. පහත සඳහන් තොරතුරු පෙන්නුම් කරන්නේ දිස්ත්‍රික්කයේ දක්නට ලැබෙන රැකියා අවස්ථා වර්ගීකරණයයි. නාගරික ප්‍රදේශවල නිෂ්පාදන කර්මාන්තය දියුණු තත්ත්වයක් පෙන්නුම් කරන අතර ග්‍රාමීය ප්‍රදේශවල වැඩි දෙනා කෘෂිකර්මයේ හා ධීවර කර්මාන්තයේ යෙදී සිටිති. ජීවනෝපාය විධි භූගෝලීය තත්ත්වය මත වෙනස්කම් පෙන්නුම් කරයි. වෙරළාසන්නයේ ප්‍රධාන ජීවනෝපාය ධීවර කර්මාන්තයයි. රට අභ්‍යන්තරයේ ජීවත්වන්නෝ කෘෂිකර්මාන්තයේ නියැලෙති.

**වගුව 5.1 ප්‍රධාන කර්මාන්ත අනුව සේවා නියුක්ති ජන සංඛ්‍යාව**

| | |
|---|---|
| සියළුම කර්මාන්ත | 229,425 |
| නිෂ්පාදන | 46,120 |
| කෘෂිකර්මාන්තය හා දැව කර්මාන්තය | 41,485 |
| තොග සහ සිල්ලර වෙළෙඳාම | 28,534 |
| හඳුනාගත නොහැකි ප්‍රාථමික කර්මාන්ත | 21,180 |
| ධීවර කර්මාන්තය | 20,712 |
| රජයේ සේවා සහ ආරක්ෂක සේවා | 13,436 |
| ප්‍රවාහනය, පණිවුඩ හුවමාරුව හා ගබඩාකරණය | 12,724 |
| ඉදිකිරීම් ක්ෂේත්‍රය | 12,696 |

මූලාශ්‍රයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2001

මෙම පර්යේෂණය සිදුකළ ප්‍රදේශවල තිබුණු ප්‍රධාන රැකියා අවස්ථා ධීවර, කෘෂිකර්මය, සිල්ලර වෙළෙඳාම, රජයේ රැකියා සහ ඇඟළුම් කර්මාන්තයයි. සංක්‍රමණික රැකියා සඳහා යෑම පළාතේ රැකියා අවස්ථා නොමැති නිසා මෑතකදී ඇති වූ ප්‍රවණතාවයකි. මෙය නීත්‍යානුකූලව සිදුකරන ප්‍රාථමික මට්ටමේ කුසලතා අවශ්‍ය දෙයකි. ඇතැම් ප්‍රතිචාරවලින් නීති විරෝධි සංක්‍රමණ සිදුවන බව හෙළිදරව් විය.

3 බස්නාහිර පළාතේ අභ්‍යන්තරික වශයෙන් අවතැන්වූ පුද්ගලයන් හා ඔවුන්ට ආධාර කරන ජාත්‍යන්තර හා දේශීය නියෝජිතයන් සමග IDMC ආයතනය මගින් කළ සම්මුඛ සාකච්ඡාවල තොරතුරු, ජූනි සහ ජූලි 2007.

'සියළු දෙනාම පාහේ ගොවිතැන් කටයුතු නවතා, විදේශීය රැකියා සොයා යති. ඔවුන්ගේ ජීවිත පරදුවට තබමින් මාස ගණනක් මුහුදු තරණය කොට ඉතාලියට යති. මෙසේ ගිය ඇතැම් අවස්ථාවලදී ජීවිත අහිමි වූ අය ද වූහ. නමුත් එසේ යාමට හැකි වූ අය තමන්ගේ ජීවන තත්ත්වයන් ඉහළින් පවත්වා ගනිති. නීති යොදා සංක්‍රමණික අවස්ථා නවතා දැමීම එතරම් හොඳ දෙයක් නොවේ. රජය ජාත්‍යන්තර සම්බන්ධතා ආරක්ෂා කිරීමට මෙවැනි නීති ක්‍රියාත්මක කිරීම අපට තේරුම් ගැනීමට පුළුවන. එහෙත් නීති ක්‍රියාත්මක කිරීමේදී රජය මීට වඩා කාරුණික විය යුතුය. ඒ මක් නිසා ද යත් කිවහොත් සංක්‍රමණිකයන් ශ්‍රී ලංකාවේ සංවර්ධනයට බලපාන මුදල් බොහෝ ප්‍රමාණයක් එවන හෙයිනි'.
(ඉලක්කගත කණ්ඩායම්, උඩප්පු)

'මේ අතර ප්‍රදේශයේ කාන්තාවන් අඩක්ම රැකියාවල නිරතවෙති. ඒ නිවසේ පවතින ගැටළු හේතුවෙනි. මේ ප්‍රදේශයේ කාන්තාවෝ 20 දෙනෙකු ගෘහසේවිකාවන් ලෙස මැදපෙරදිග රැකියා කරති. තමන්ගේම ව්‍යාපාරික කටයුතුවල නිරතව සිටින කිහිප දෙනෙක් ද සිටියි.'
(ගැ, 35, නොරොච්චෝලේ)

ධීවර කර්මාන්තය දිස්ත්‍රික්කයේ බොහෝ මිනිසුන්ගේ ප්‍රධාන ජීවනෝපායයි. 5.1 වගුවේ සඳහන් කළ ආකාරයට පුත්තලමට 5වැනි විශාලම ආදායම් ගෙනන මාර්ගයයි. එම රැකියාවේ නිරතවන්නන් ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම, කලපුවේ මසුන් සහ ඉස්සන් ඇල්ලීමේ නිරත වෙති. වැඩිදෙනා දෛනික කුලියට සේවය කරන අතර, සමහරෙක් ධීවර යාත්‍රා හා දැල් මිළට ගැනීමට මුදල් යොදවා ඇත. ධීවර කර්මාන්තයට අද පවතින ප්‍රධාන බාධකය ආරක්ෂක හේතු මත ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමට සීමා පැනවීමයි. ජාතික මට්ටමේ ගැටළුව ගැටුම් පවතින ප්‍රදේශවල ජීවත්වන්නන්ගේ ජීවනෝපායට බාධා පමුණුවති. ඇතැම් වෙලාවක එල්ටීටීඊ ප්‍රහාර නිසා ධීවරයෝ මුහුදු යාමට බිය වෙති.

'මිනිස්සු වැඩිදෙනා ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම, ඉස්සන් නෙළා ගැනීම, වඩු වැඩවල හා මේසන් වැඩවල යෙදති.'
(ඉලක්කගත කණ්ඩායම් උඩප්පු)

'මේ අතර ප්‍රදේශයේ කාන්තාවන් අඩක්ම රැකියාවල නිරතවෙති. ඒ නිවසේ පවතින ගැටළු හේතුවෙනි. මේ ප්‍රදේශයේ කාන්තාවෝ 20 දෙනෙකු ගෘහසේවිකාවන් ලෙස මැදපෙරදිග රැකියා කරති. තමන්ගේම ව්‍යාපාරික කටයුතුවල නිරතව සිටින කිහිප දෙනෙක් ද සිටියි.'
(ගැ, 35, නොරොච්චෝලෙයි)

'අවුරුද්දක් පාසාම ධීවර කර්මාන්ත ක්ෂේත්‍රය තුළ මෙම අර්බුදය උත්සන්න වි ඇත. රාත්‍රී කාලයේ මුහුදු යෑම ආරක්ෂක හේතු නිසා කළ නොහැක. අනෙක් අතට රාත්‍රී කාලයේ එල්ටීටීඊ ප්‍රහාර ඇතිවීමට ඉඩ තිබේ. ඒ අතර ඉන්ධන මිල ඉතා ඉහළ යයි. මේ ප්‍රදේශයේ ධීවර කර්මාන්තය කරගෙන යාමට ඉඩ දෙන්නේ නම් ඉන්ධන වියදම් අඩු කර දිය යුතුවේ. මේ ප්‍රදේශයේ මුහුදු යාමට පාස් ක්‍රමයක් හඳුන්වා දී තිබේ. ඒ උදේ 5 සිට සවස 6 වනතෙක් පමණි. මේ ප්‍රදේශයේ ඉස්සන් සඳහා ඉහළ ඉල්ලුමක් පවතී'.
(ප්‍රධාන තොරතුරුදායකයා, පි, වනාතවිල්ලුව)

බොහෝ පවුල්වලට ආදායම් ගෙනන ප්‍රධාන ජීවනෝපාය කුලී වැඩය. මෙම රැකියාවලට අවශ්‍යවන කුසලතා ඉතා අඩු නිසා කුලී වැඩ සොයා ගැනීම පහසුවී තිබේ. මෙම කුලී වැඩ ලැබෙන්නේ ප්‍රදේශයේ පවතනි කෘෂිකර්මාන්තය හා කර්මාන්ත ආශ්‍රයෙනි. එම රැකියා එක් කාලයකට පමණක් සීමාවේ.

'අපි ප්‍රධාන වශයෙන් කරන්නේ කුලී වැඩය. මෙම වැඩවල ස්වාභාවය හා වර්ගය රැකියා අවස්ථා අනුව කාලයෙන් කාලයට වෙනස් වේ. සමහරු ස්වයං රැකියාවක් වශයෙන් කුලී කම්කරුවන් වශයෙන් ද සිමෙන්ති බ්ලොක් ගල් සාදති. ඇතමෙක් පොල්වතුවල සේවය

කරන අතර ටික දෙනෙක් රාජ්‍ය අංශයේ සේවයේ නිතර වෙති. සමහරුන් සතුව පවතින තමන්ගේ වතුවලින් ආදායම් ලබා ගනිති. තවත් අය ලුණු සංස්ථාවේ හා පෞද්ගලික ලුණු ලේවායන්වල කම්කරුවන් වශයෙන් සේවය කරති'.
(ඉලක්කගත කණ්ඩායම්, පලාවි)

දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ප්‍රදේශවල වැදගත් ජීවනෝපාය කෘෂිකර්මයයි. පොල් වගාව හැරුණුවිට, එළවළු, එැණු හා වී ගොවිතැන දක්නට ලැබේ. ගොවිතැනට අවශ්‍ය ජලය නොමැති වීමත් පස නිසරු වීමත් නිසා කෘෂිකර්මාන්තයෙන් ඉස්සන් වගාවට මාරුවීමක් දක්නට ලැබේ. මේ මාරුවීම නිසා තම ප්‍රජාවගෙන් ඈත් වී වෙනත් අතකට රැකියා සොයා යෑමක් දක්නට ලැබේ.

'අපට එැණු හා එළවළු තිබේ. ඒවා විකිණීමට වෙළෙඳ පොළට හෝ කොළඹට ගෙන යනවා. මෙහි ජීවත් වන බොහෝ අවතැන්වූවන්ට කඩ කාමර විශාල සංඛ්‍යාවක් තියෙනවා.'
(ගැ35, නොරොච්චොලෙයි)

'වැඩි දෙනෙකු එැණු වගාවේ, මිරිස් වගාවේ, දුම්කොළ වගාවේ හා ධීවර කර්මාන්තයේ නියැලී ඉන්නවා. මේ ජනගහණයෙන් සමාන සංඛ්‍යාවක් මේ ක්‍රියාකාරකම් දෙකෙහි නිරත වෙති. රජයේ සේවකයන් 4 හෝ 5ක් ද ඒ අතර සිටිති. ඇඟළුම් කර්මාන්තයේ නිරත වී මාරවිල හා හලාවත නගරවල ජීවත්වන තරුණ කාන්තාවෝ ද මේ අතර සිටිති. පිරිමින් කිහිප දෙනෙකු තම ප්‍රජාවගෙන් ඈත් වී කටයුතු කරන බව පෙනේ. තවත් පවුල් කීපයක් ඉස්සන් ගොවිපොළවල් අයිතිකරුවන්ය. තවත් අයෙකුට අක්කර 1/2-2 ක පොල් වතු හිමිය. එක් වාරයකට ඉන් පොල්ගෙඩි 300-500ක් කඩා ගැනීමට පුළුවන. ඔවුන් පොල් ලෙලි තැබීම ද කරති. මෙය කාලයෙන් කාලයට එන රැකියා අවස්ථාවකි. ඉතා දුප්පත් පවුල් අවුරුද්දකට වරක් මේ කටයුත්තේ නිරතවෙති'.
(ඉලක්කගත කණ්ඩායම් 2, උඩප්පු)

'ජල ප්‍රශ්නය නිසා අපගේ ප්‍රජාව ගොවිතැන් නොකරති. වාරි ජලයෙන් කෘෂිකර්මය කිරීමට නම් අසල ඇති පැරණි වැව පිළිසරණ කළ යුතුය. ඒ සඳහා රුපියල් ලක්ෂ 40-50 ක් අවශ්‍යවේ'.
(පි, 41, සිරිමාපුර)

*ජීවනෝපාය ක්‍රම වෙනස්වීම*

මේ පළාතේ පැවති ජීවනෝපායන් වර්ග හා ක්‍රම, අවතැන්වූවන්ගේ පැමිණීමත් සමඟ වෙනස් වූ බැව් පර්යේෂණ පවත්වනවිට පෙනෙන්නට තිබුණි. මුල් අදියරේදී මෙම වෙනස සාධනීය එකක් වූයේ ඔවුන් අළුත් ජීවනෝපා ක්‍රියාකාරකම්, තාක්‍ෂණය හා තම ප්‍රදේශවාසීන්ට හඳුන්වා දුන් හෙයිනි. නව උත්පාදන මාර්ග ප්‍රමාණයෙන් වැඩි වූ විට විවිධ කණ්ඩායම් එකිනෙකා සමග තරඟ වැදී ගැටුම් තත්ත්වයන් උදාවිය.

'අවතැන්වූවන් පැමිණීමෙන් පසු ප්‍රදේශවාසීන්ගේ ජීවනෝපායයන් වන ධීවර කර්මාන්තය සහ වෙළෙඳාම සම්බන්ධයෙන් තරග කරන තත්ත්වයක් නිර්මාණය විය. වගාවට හා පදිංචියට අවශ්‍ය භූමි ප්‍රමාණය එන්න එන්නම අඩුවෙමින් පවතී. මේ ප්‍රශ්නය දෙපාර්ශ්වයටම එකසේ බලපායි. අවතැන්වූවන්ගේ පදිංචියට ලැබුණු ඉඩම් පර්චස් 10 දැන්වන විට දරුවන්ගේ දෑවැද්දට දීම සඳහා කැබලි කරමින් සිටී'.
(පි, 51, නොරොච්චොලේ)

අමරසිරි ද සිල්වා පවසන පරිදි, අවතැන්වූවන් හා ප්‍රදේශවාලසීන් අතර ගැටුමට හේතු වූණේ පුත්තලමේ ලුණු නිෂ්පාදනයයි. පුත්තලමේ ලුණු ලේවාවල කුලී කම්කරුවන් ලෙස වැඩ කිරීමට අවතැන්වූවන් යොදාගැනේ. මෙවැනි කායික ශ්‍රමය වැයකිරීමට සිංහල කම්කරුවන්ට වඩා ඕනෑකමක් ඔවුනට ඇත.

මේ සඳහා ප්‍රදේශයේ ජීවත්වන සාම්ප්‍රදායකි සිංහල කම්කරුවන් සමග තරඟයක් මතුවී තිබේ. එම නිසා ලුණු ලේවාවල වැඩ කළ සම්ප්‍රදායික කම්කරුවන් හට රැකියා සොයා ගැනීම ප්‍රශ්නයක් වී තිබේ. පුත්තලමේ අවතැන්වූවන් දැන්වනවිට ප්‍රදේශවාසී ධීවරයන්ගේ අයිතීන් කඩකරමින් කලපුවේ හා මුහුදේ මසුන් අල්ලයි (අමරසිරි ද සිල්වා, 1995)[4].

ජීවනෝපායන් සඳහා කරන තරගයේදී අනන්‍යතාව පදනම් කරගත් විවිධ ජන කණ්ඩායම් අතර ගැටුම් නිර්මාණය වෙමින් තිබේ. මේ තත්ත්වය ස්වාභාවික සම්පත් පාදක කරගත් ජීවනෝපාය සම්බන්ධයෙන් හා විධිමත් රැකියා ක්ෂේත්‍රයේ විවිධ ආකාරයෙන් ඉස්මතුවේ. පුත්තලම දිස්ත්‍රික්කයේ රැකියා සඳහා අවශ්‍ය ස්වාභාවික සම්පත් ස්වාභාවයෙන්ම හීන ප්‍රදේශයකි. මෙම සීමාවන් මෙසේ පවතිද්දී, අවතැන්වූවන් පැමිණීම නිසා තිබෙන සීමිත සම්පත් සඳහා තරග වැදීම ආරම්භ විය. ප්‍රදේශයේ පවතින ජීවනෝපායයන් කරගෙන යාමට අවශ්‍ය ස්වාභාවික සම්පත්වලට ඇතැම් කණ්ඩායම් උරුමකම් කියති. මේ තත්ත්වය නිසා අනෙකුත් අයට එම සම්පත් භුක්ති විඳීම උගහටය. මෙම තත්ත්වය ප්‍රජාවන් අතර ගැටුම් ඇතිවීමට තුඩු දෙයි.

විධිමත් රැකියා ක්ෂේත්‍රයේ ගැටුම් හටගත්තේ දිස්ත්‍රික්ක තුළ පවතින රැකියා විශේෂයෙන් රාජ්‍ය අංශයේ රැකියා සීමිතය. එම නිසා ඒවා පිරවීමේදී විශාල තරගයක් ඇතිවේ. මෙම තත්ත්වය වඩාත් උග්‍ර වන්නේ මෙම තනතුරුවලට සුදුස්සන් තේරීමේදී බලයේ සිටින අය එක් ජන කණ්ඩායමකට වාසි සලසන බවට හැඟීමක් ඇතිවීමෙනි. නිදසුනක් වශයෙන් ගතහොත් රජයේ පරිපාලන තනතුරු හා ගුරු පුරප්පාඩු පිරවීමේදී ඉහත කී හැඟීම ජනයා අතර පවතියි. අවතැන්වූවන් පැමිණෙන විට සත්කාරක ජනසමාජයට අළුත් ජීවනෝපායන් හා විශේෂ තාක්‍ෂණ ක්‍රම රැගෙන ආහ. මොවුන්ගේ පැමිණීමෙන් අනතුරුව ප්‍රදේශයේ ගම් තුළ කුඩා ගම් ඇතිවිය. එසේ වූයේ අවතැන්වූවන් අළුත් වෙළඳාම් ක්‍රමවල නිරතවූ හෙයිනි. සත්කාරක ජනසමාජයට අවතැන්වූවන් හඳුන්වා දුන් නව ජීවනෝපායන් සමග තරග කිරීම උගහට විය. මෙම තත්ත්වය හේතුකොටගෙන අවතැන්වූවන් තමන්ගේ ජීවනෝපායන් හා සීමිත රැකියා අවස්ථාවලට තරග කරන බවට අදහසක් සත්කාරක සමාජයට ඇත.

අනෙක් අතට, අළුතින් පැමිණි අවතැන්වූවන් නිසා කුලී වැඩ වෙළෙඳ පොළේ මිළ ගණන් අඩුවන බවට ප්‍රදේශවාසීහු මැසිවිලි නගති. ප්‍රදේශයේ රැකියා අවස්ථා සීමිත නිසා ප්‍රදේශයේ පවතින කුලී ශ්‍රම සැපයුම වැඩි වී දෛනික කුලියේ අඩුවීමක් දක්නට ලැබේ. අවතැන්වූවන්ට රජයෙන් හා වෙනත් රාජ්‍ය-නොවන සුබසාධන කණ්ඩායම් වලින් ලැබෙන මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර, ආහාර ද්‍රව්‍ය සලාක හේතුවෙන් ඔවුනට අඩු කුලියට වැඩ කළ හැකි බවට ප්‍රදේශවාසීන් අතර මතයක් තිබේ.

> 'මේ හැරුණුවිට රැකියා අවස්ථා, ජලය, ප්‍රවාහණය යනාදිය පවා ගැටළු සහගත වී තිබේ. ප්‍රදේශවාසීන්ගේ දෛනික කුලිය රුපියල් 500 නම් අවතැන්වූවන් එය රුපියල් 200කට කරදීමට ඉදිරිපත්වේ. මෙසේ අඩු කුලියට ශ්‍රමය විකිණීම අවැතැන්වූවන්ට ප්‍රශ්නයක් නොවන්නේ ඔවුනට සහානාධාර ලැබෙන නිසාවෙනි. මේ තත්ත්වය යටතේ ඔවුනට ලැබෙන මුදලින් කොටසක් ඉතිරි කරගැනීමට පුළුවන.'
> (ප්‍රධාන තොරතුරුදායකහා, පි, පලාවි)

> 'අවතැන්වූවන් පැමිණීමෙන් උද්ගත වූ මූලික ගැටළුව රැකියා අර්බුදයයි. කාර්යාලවල රැකියා කරන බහුතරය මුස්ලිම්වරුන්ය. ප්‍රදේශවාසීන්ගේ රැකියා අවස්ථා මුස්ලිම් අවතැන්වූවන්ට ලැබී ඇත. රජය පවා ඔවුනට ප්‍රමුඛත්වය දෙන බව පෙනේ. කර්මාන්ත පුරයක් පටන්ගන්න මුල්ගල තබා ඇත. මේ තත්ත්වය අනාගතයේදී වෙනස්වේයැ'යි සිතිය නොහැක.'
> (ප්‍රධාන තොරතුරුදායකහා, පි, පලාවි)

---

4 De Silva, Amarasiri (2003), "Socio-political Implications of conflict related internal displacement in Sri Lanka."

රැකියා අවස්ථා සීමිතවන විට ඊට ඇති තරගය වැඩි වී මිනිසුන් වෙනත් ප්‍රදේශවලට අවධානය යොමු කරන බව පෙනේ. එවැනි අවස්ථාවල ඔවුහු ගම්පළාත්වලින් පිටව යති. වෙනත් ප්‍රදේශවලට යාම ශ්‍රී ලංකාව ඇතුළත හා රටින් පිටතට යාම තුළින් සිදුවේ. රට ඇතුළත් රැකියා සඳහා එහා මෙහා යාම එක්තරා අනන්‍යතා කණ්ඩායමක් සම්බන්ධවුවහොත් සැක උපදවයි. නිදසුනක් ලෙස, මසුන් ඇල්ලීමට දෙමළ ජනයා මුලතිව් ගියහොත් ප්‍රදේශවාසීහු සැක උපදවා ගනිති. කාන්තාවන් අතර ප්‍රචලිත හැඟීම වන්නේ විදේශගතවීමෙන් වැඩි ආදායමක් ලබා ගත හැකි බවයි.

*සේවාවන්*

අවතැන්වූවන්ගේ වාසස්ථාන බොහෝමයක් පිහිටුවා තිබෙන්නේ ප්‍රධාන මාර්ග හා කුඩා නගර ආශ්‍රිතවය. මොවුන් මේ ස්ථානවල පදිංචි පදිංචි කළේ අවතැන්වූවන්ට පක්ෂපාතී දේශපාලනඥයින් හා රාජ්‍ය නොවන සංවිධාන විසිනි. කාගේවත් පිහිටක් නොමැතිව තමන්ගේ ධනය රැගෙන පැමිණි අවතැන්වූවෝ ද මෙහි වෙති. මාර්ග පද්ධතියට හා නගරවලට ආසන්නයේ පදිංචි වීමෙන් ප්‍රවාහනය, සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම් වැනි සේවාවන්වලට ළඟාවීමට අවතැන්වූවන්ට හැකිවේ.

> 'අපව පදිංචි කළේ කොළඹ-පුත්තලම මහා මාර්ගයට සමීපවයි. එමනිසා සෞඛ්‍ය හා අධ්‍යාපනික පහසුකම් ලබාගැනීමට පුළුවනි. ඒ හොඳ ප්‍රවාහන සේවාවක් ඇති හෙයිනි. අප මුලින් පැමිණි අවස්ථාවේ සේවාවන් අද තරම් දියුණු වී තිබුනේ නැහැ'
> (පි 60, සිරිමාපුර)

> 'අපව පදිංචි වී සිටින්නේ ප්‍රධාන මාර්ගයට ආසන්නවයි. එම නිසා ප්‍රවාහන කටයුතු පහසු වී තිබේ. නමුත් ප්‍රවාහන ගාස්තු ඉතා වැඩියි. තවමත් එය වැඩිවෙමින් තිබේ. ප්‍රවාහන පහසුකම් නිසා අධ්‍යාපනය හා සෞඛ්‍ය පහසුකම් ලබාගත හැකිවේ.'
> (ප්‍රධාන තොරතුරුදායකයා, 50, සිරිමාපුර*)

සත්කාරක ප්‍රජාවගේ හැඟීම වන්නේ, අවතැන්වූවන්ට වඩා දුගී අය ප්‍රදේශයේ ජීවත් වුවද හොඳ සේවාවන් ලැබෙන්නේ අවතැන්වූවන්ට බවයි. කෙසේවූවද, නියමාකාරයෙන් සේවාවන් නොලබන අවතැන්වූවන්ගේ කඳවුරු තවමත් ඇත.

> 'තවමත් කඳවුරුවල ජීවත්වන අවතැන්වූවන් සිටිති. ඔවුනට සථිර ආදායම් මාර්ගයක් හෝ නිවාස, පානීය ජලය නොලැබේ.'
> (පි, 51, නොරොච්චොලෙයි)

> 'සේවාවන් සැපයීම යම් තරමකින් දියුණු වුවද පවතින සම්පත් ඌණතාවය තව තවත් උග්‍ර අතට හැරී ඇත්තේ අවතැන්වූවන්ගේ ඉල්ලුම නිසාය'.
> (පි, 51, නොරොච්චොලෙයි)

පළාතේ ඉඩම්වල මිල ඉහළ යාම සම්පත් ඌණතාවය පෙන්නුම් කරන වැදගත් සාධකයකි. එම ඉඩම් මිල ඉහළ යෑම හුදෙක් ඉල්ලුම් පාදක එකකි. මින් පෙනී යන්නේ, සැපයුම කොතෙක් සීමා වී ඇත්දැයි යන්නයි.

අවතැන්වූවන්ගේ වාසස්ථානවල ජීවත්වන අය බෝවෙන ලෙඩ රෝගවලට ගොදුරු වී නිතර රෝගී වෙති. වාසස්ථානවල ජලය බැසයාම හරිහැටි සිදු නොවන නිසා, ජල ගැලීම් සිදුවී සනීපාරක්ෂක ගැටළු මතු කරයි. වැසිකිළි හා ළිං එක ළඟ පිහිටා තිබීම නිසා ලෙඩ රෝග පැතිර යාම වැඩිවේ.

> 'ගෙවල් බොහෝමයක වැසිකිළි හා ළිං පිහිටා ඇත්තේ එකිනෙකට සමීපවයි. ඒ ඉඩම් පර්චස් 10ක අවශ්‍ය දුර ප්‍රමාණය තබාගත නොහැකිවීමෙනි.'
> (පි, 50, සිරිමාපුර)

අවතැන්වූවන් පැමිණීමෙන් පසුව අධ්‍යාපන සේවා දියුණු වුව ද එය සැමගේ අවශ්‍යතා සපුරන්නේද යන්න ප්‍රශ්නයකි. අවශ්‍ය ගුරුවරු සංඛ්‍යාව, ඉඩකඩ, පාසැල් සංඛ්‍යාව යන මේවා තවමත් කථාබහට ලක්වන කාරණායි.

> 'අධ්‍යාපනය පැත්තෙන් ගත්තොත් අපට තවමත් ගැටළු තියෙනවා. නිදසුනක් වශයෙන්, පාසැල් ගොඩනැගිලි ප්‍රමාණවත් නැහැ. ළමයින්ට අමතර ඉගැන්වීම් සඳහා දුර බැහැරට යායුතුයි. මේ පාසැල්වල විද්‍යා විෂය හා ගණිත විෂය ධාරා නැහැ.'
> (ගැ, 49, නොරොච්චොලෙයි)

තමන්ගේ අනන්‍යතාවය හා වාර්ගිකත්වය හේතුකොටගෙන රජයේ කටයුතුවලින් හා සංවර්ධනය කිරීමේ ආයතනවලින් තමන් කොන්කරන බව දැනෙන්නට පටන්ගෙන ඇත. රජයෙන් හා රාජ්‍ය නොවන සංවිධානවලින් මේ ප්‍රදේශවල සංවර්ධන කටයුතු සිදුවන්නේ සුළු වශයෙනි. පන්සල් කමිටු හා ආගමික නායකයින් තැණුනු දේශීය ව්‍යුහයන් එක් එක් පුද්ගලයන් සමග එක්වී යම් ප්‍රමාණයක සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කරති. වඩාත්ම බලපාන්නේ ප්‍රවාහන පහසුකම් නොමැති නිසා අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා ලබාගැනීමට නොහැකිවීමයි.

> 'මේ ප්‍රදේශයේ අල්ලන මසුන් දිවයිනපුරා බෙදා හරිති. නමුත් ඒ සඳහා ගමන් කළයුතු මාර්ගය පිළිසකර කර දෙන්නේ නැහැ. මුලින් මාර්ගය පිළිසකර කළේ අපියි. නමුත් දැන් අපි ඒ කාර්යය නවත්තලා දැම්මා. එය සිදුකිරීමෙන් අපි වෙහෙසට පත්වී සිටිමු. අපට විදුලිය ලැබී යන්තම් අවුරුද්දයි.'
> (ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා 2, උඩප්පු)

> 'ප්‍රවාහන පහසුකම් නොමැතිවීමෙන් දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වය පහත වැටී තිබේ. 5වැනි ශ්‍රේණියෙන් පසුව දරුවන්ට ඉගෙනගැනීමට පාසැලක් මෙහි නැහැ. වත්පොහෙසත්කම් ඇති අය ළමයින්ගේ අධ්‍යාපනය නිසාවෙන් ගමෙන් බැහැරව ජීවත් වෙති.'
> (ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා 2, උඩප්පු)

> 'මේ පාසැල්වලට රජයේ ගුරුවරුන් ලබා නොදෙන්නේ අපි සුළු ජන කණ්ඩායමක් නිසායි.'
> (ප්‍රධාන තොරතුරුදායකයා,පි, වනාතවිල්ලු)

## 5.7 අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ පුද්ගලයන් හා ගැටුම

1990 සිට අවුරුදු 17ට වැඩි කාලයක් 60,000ක් පමණ අවතැන්වූවන් පුත්තලමේ ජීවත්වේ. UNHCR ගණනය කොට ඇති ආකාරයට 1990දී පුත්තලමට අවතැනුවූවෝ 80,000 පැමිණියහ. 1995 වනවිට අවතැන්වූවන්ගේ ජනගහණය 52,555 දක්වා අඩුවී 2001/2002 වනවිට 81,707 දක්වා ඉහළ ගියේය. මේ මූලාශ්‍ර අනුව පුත්තලමේ ජීවත්වන අවතැන්වූ ජනගහණය ගැන විවිධ දත්ත ඉදිරිපත් වී තිබේ.[5]

එල්ටීටීඊ ය විසින් උතුරෙන් නෙරපා හරින ලද මුස්ලිම් ජනතාව මන්නාරම, මුලතිව්, කිලිනොච්චිය හා වවුනියාව යන දිස්ත්‍රික්කවලින් මෙහි පැමිණියහ. අවතැන්වූ ජනගහණයෙන් බහුතරය (72%) පැමිණියේ මන්නාරමෙනි. යාපනයෙන් 14%ක්, මුලතිව්වලින් 10%ක් හා කිලිනොච්චියෙන් 3%ක් ද මෙසේ පැමිණි අය අතර වූහ. වවුනියාවෙන් පැමිණි පවුල් ද ඒ අතර වූහ. 2004දී පැවැත්වූ සංගණනයෙන් සමීක්ෂණයට ලක්කරන ලද සැම කෙනෙක්ම (99%) පැවසුවේ වාර්ගික වශයෙන් ඔවුන් මුස්ලිම් වන බවයි. මේ අතර අවතැන් වූ සිංහල හා දෙමළ ජනයා සිටිය ද ඔවුන්ගේ ප්‍රතිශතය 1%ක් පමණ වේ (UNHCR 2006).

5 UNHCR වාර්තාව 1990, 1995, 2001.2002

වාර්තා කරන මූලාශ්‍ර අනුව පුත්තලමේ අවතැන්වූ ජනගහණය සුළු වශයෙන් වෙනස්වේ. UNHCR සංඛ්‍යාලේඛන අනුව 2006 වන විට අවතැන්වූ ජනගහණය 63,145කි. ද සිල්වා 2003 මැයි වාර්තාවේ සඳහන් වන පරිදි මන්නාරමෙන් පුත්තලමට පැමිණි මුස්ලිම්වරුන්ගේ සංඛ්‍යාව 66,200ක් වේ. දිස්ත්‍රික්කයේ මුළු ජනගහණයෙන් අවතැන්වූවන් 10%ක් නියෝජනය කරයි.

> **අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවන් පිළිබඳ නිර්වචනය**
>
> අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවන් යනු ආයුධ සන්නද්ධ ගැටුම්, ප්‍රචණ්ඩත්වය, මානව හිමිකම් කඩවීම්, ස්වාභාවික හා මානුෂීය ඛේදවාචක හේතුවෙන් ජාත්‍යන්තර රාජ්‍ය මායිම් කඩනොකොට තම වාසස්ථාන වලින් බලහත්කාරයෙන් පිටමංවීමට සිදුවූ ජනකොට්ඨාශයකි.
>
> එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවන් පිළිබඳ මූලධර්ම (1998)

**දිගින් දිගටම සිදුවන අවතැන්වීම්**

අවශ්‍යතාවය අනුව සිදු වූ කණ්ඩායමක් ලෙස, අවතැන්වූවන් හැඳින්විය හැකිය (ඔවුනට ක්ෂණික ආධාර අවශ්‍යවේ). දෙවැනුව, අවැතැන්වූවන් දැනට සිටින ස්ථානයේ තාවකාලිකව පදිංචි වී සිටිති (අවතැන්වූවන් පිළිබඳ සම්මේලන වාර්තාව, 2003). ඔවුන්ගේ පදිංචිය තාවකාලික වන්නේ, අළුත් පරිසරයෙන් මිදී කෙදිනක හෝ තම ගම් පළාත්වලට යාමට ඔවුන් බලාපොරොත්තු තබා සිටින හෙයිනි. තාවකාලික කඳවුරුවල ලැගුම්ගෙන, ඉඩම් හිමිකර ගැනීමට නොහැකිව, ජීවනෝපායන් නොමැතිව, සේවාවන් නොලැබී සිටින මොවුන්ගේ තත්ත්වය අන් අයට වඩා දුක්ඛිතය.

පුත්තලමේ ජීවත්වන අවතැන්වූවන් අවුරුදු 17ක් මෙසේ ජීවත් වෙති. ඔවුන් අවතැන්වූවන් යන්නෙන් යට කියන ලද තාවකාලිකව බවට අභියෝග කරති.

දිගින් දිගටම අවතැන් වී සිටීමට සිදුවීමෙන් අවතැන්වූවන්ට ක්ෂණික අවතැන්වූවන්ට වඩා ස්ථාවරභාවයක් ලැබී තිබේ. පුත්තලමේ අවුරුදු 17ක් ජීවත් වීමෙන් අවතැන්වූවන්ගෙන් සමාජයට ප්‍රමාණවත් වෙනස්කම් සිදු වී තිබේ. පුත්තලමේ ජීවත්වන අවතැන්වූවන් දෙස අවැතැන්වූවන් පිළිබඳ නිර්වචනයෙන් හෝ වෙනත් තාවකාලික අවතැන්වූවන් දෙස මෙන් බැලීමට නුපුළුවන.

2006 පැවැත්වූ UNHCR සමීක්ෂණයට අනුව පුත්තලමට පැමිණි අවතැන්වූවන්ට බහුතරය ක්‍රමාකාරයෙන් එම සමාජයට අනුගත වී සිටිති. අවතැන්වූ ජනගහණයෙන් 74%ක් පුත්තලමෙන් ඉඩම් මිලට ගෙන ඇත. 58%ක් පැවසුවේ ඔවුනට පුත්තලමේ නිවාස ඇති බවයි. මේවායින් පෙනී යන්නේ පුත්තලමේ අවතැන්වූවන් වෙනස් කණ්ඩායමක් බවයි. 2002-2006 සටන් විරාම කාලය තුළ අවතැන්වූවන් 735,000න් 418,500ක් තම මුල් වාසස්ථාන කරා ගියහ. තමන්ගේ මුල් පදිංචි ස්ථාන කරා යාමට තිබූ අවශ්‍යතාවය සටන් විරාම ගිවිසුම අහෝසිවීමත් සමග නතර විය. තරුණ අවතැන්වූවන් ආපසු යෑමට කැමැත්තක් නොදක්වනනේ ඔවුන් පුත්තලමේ පරිසරයට හා සංස්කෘතියට හුරු වී සිටි බැවිනි. මෙහි සිටි දිගු කාලය තුළදී ඔවුහු ප්‍රදේශවාසීන් සමග සම්බන්ධතා ඇති කරගෙන මේ සමාජයට අනුගත වී සිටිති. දේපල හිමිකම් හා ඔවුන් අතර සිදුවූ සමාජ වෙනස්කම් තුළින් මේ වෙනස දැකිය හැකිය. නිවාස හා ඉඩම් අත්පත් කරගනිමින්, අළුත් වෙළෙඳ ව්‍යාපාර ආරම්භ කරමින් පළාතට ඔවුන් අනුගත වී සිටින බව මෙම අධ්‍යයනයෙන් ද පෙනී යයි.

> 'ඔවුනට පුත්තලමේ හා මන්නාරමේ නිවාස හා දේපල ඇත.'
> (ප්‍රධාන තොරතුරුදායකයා, ගැ, නාගවිල්ලු)

සත්කාරක සමාජයට අනුගත වීම දෙපාර්ශ්වය තුළ සිදු වී සමාජයීය වෙනස්කම් තුළින් පෙනී යයි.

> 'මේ පළාතට අවතැන්වූවන් පැමිණෙන විට රැගෙන ආ රැකියාවලට අමතරව නව රැකියා ආරම්භ කළහ. ඔවුන්ගේ අධ්‍යාපන තත්ත්වය වැඩි දියුණු විය. මේ ප්‍රදේශයෙන් විශ්ව විද්‍යාලයට ඇතුළත්වන සිසුන්ගෙන් වැඩි දෙනා අවතැන්වූ සිසුන්ය. ඔවුන් තමන්ගේ ගම් ප්‍රදේශවල ජීවත්වූ කාලයේ මුස්ලිම් කාන්තාවන් ගෙදරින් පිටට නොපැමිණියහ. මේ පළාතට පැමිණීමෙන් පසුව සමාජශීලී වී සිටිති. ඊට අමතරව අවතැන්වූවන් හා ප්‍රදේශවාසීන් අතර අන්තර්-විවාහ පවා සිදුවේ. ඔවුන් තම ගම් ප්‍රදේශවල ජීවත්වූ විට ආශ්‍රය කළේ මුස්ලිම් අය සමග පමණි. රැකියා සීමිත විය. කෙසේ වුවද, මේ ප්‍රදේශයට පැමිණීමෙන් පසුව ඔවුහු මෙහි ජීවත්වන සෑම ජන කණ්ඩායමක් සමගම සම්බන්ධතා ගොඩනගාගෙන විවිධ මාදිලියේ රැකියාවල නිරතව සිටිති'
> (ප්‍රධාන තොරතුරුදායකයා, පුත්තලමේ රාජ්‍ය නොවන සංවිධානය)

අවතැන්වූවන් මෙසේ අනුගත වීම නිසා පුත්තලමේ පැවති මුස්ලිම් සංස්කෘතියට අවතැන්වූවන්ගේ සංස්කෘතික ව්‍යවහාරයන් බලපා ඇත. ඊට ඉහත දී අවතැන්වූවන් සහ සත්කාරක සමාජයේ සංස්කෘතික ව්‍යවහාරයන් අතර වෙනස්කම් තිබිණි. ආරම්භයේදී අවතැන්වූවන් ප්‍රදේශවාසී මුස්ලිම්වරුන් සමග ගණුදෙණු කරන විට යටකී සංස්කෘතික වෙනස්කම් නිසා ගැටළු ඇතිවී අවතැන්වූවන් සමග මිශ්‍ර වීම පවා ප්‍රතික්ෂේප විය. ක්‍රමයෙන් සිදුවූ අන්තර්-සම්බන්ධතා හා අන්තර්-විවාහ නිසා පාසැලේදීත් වෙළඳාමේත් එකතු වීමෙන් අළුත් සංස්කෘතික ලක්ෂණ බෙදා හදා ගත්හ.

අවතැන්වූවන්ගේ ඇඳුම් විලාසිතා, දෑවැදි දීම යනාදි ඇතැම් සංස්කෘතික ව්‍යවහාරයන් සත්කාරක සමාජයට ඇතුල් වී තිබේ. සත්කාරක සමාජයෙන් ලැබුණු තොරතුරු අනුව අවතැන්වූවන් පැමිණීමට පෙර දෑවැදි දීම, පුත්තලමේ මුස්ලිම්වරුන් අතර ප්‍රචලිත නොවීය. නමුත් අද එය පොදුවේ භාවිතා වේ.

ප්‍රදේශවාසීන් සමග සසඳන විට අවතැන්වූ ළමුන් අධ්‍යාපනයෙන් දක්ෂකම් පෙන්වති. ඔවුන් පැමිණීමට පෙර සත්කාරක සමාජයේ ගැහැණු දරුවන් ද්විතික අධ්‍යාපනය ලැබීමට නොගියහ. අවතැන්වූ දරුවන් ගැහැණු පිරිමි භේදයකින් තොරව තෘතීක අධ්‍යාපනය පවා නිමා කළහ. මේ තත්ත්වය සත්කාරක සමාජයේ ගැහැණු දරුවන්ගේ උසස් අධ්‍යාපනයට යහපත් සාධකයක් වී තිබේ.

අවතැන්වූවන් නිසා පුත්තලමේ මුස්ලිම් සම්ප්‍රදායන් වෙනස්විය. ඔවුන්ගේ ඇඳුම සහ හැසිරීම ප්‍රදේශවාසීන්ට වඩා වෙනස්ය. පිටස්තර අය පුත්තලමේ මිනිසුන් මොවුන් යැයි සිතුවද ඔවුන් පුත්තලමේ මුස්ලිම්වරු නොවෙති.

> 'ඔවුන් මුස්ලිම්වරුන් වුවද ඔවුන් හා අප අතර සෑහෙන සංස්කෘතික වෙනස්කම් තිබේ. මීට ඉහත දී පුත්තලමේ දෑවැදි ප්‍රශ්නයක් තිබුනේ නැත. නමුත් ඔවුන්ගේ සංස්කෘතිය නිසා දෑවැදි ප්‍රශ්නය අප අතරට පැමිණ තිබේ. ඔවුන් දෑවැද්ද ලබා ගැනීමට කේවල් කරති. අපි එසේ කරන්නේ නැහැ. කෙසේවුවද, දෑවැදි සංස්කෘතිය අපගේ ජන සමාජයට දැන් ඇතුළුවී තිබේ.'
> (පි, 51, නොරොච්චොලේ)

අවතැන්වූවන් ප්‍රදේශයට අනුගත වී සිටිය ද සත්කාරක සමාජ ඔවුන් සුවිශේෂ කණ්ඩායම් හැටියට සැලකන බවට හැඟීමක් පවතී. අවතැන්වූ අයව කොන් කිරීම සහ ඔවුන්ට වෙනස්කිරීම පවතින බව ඔවුහු සිතති. ඊට සරල නිදසුනකි, පාසැල්වල අවතැන්වූවන් වූ ළමුන් 'සරණාගතයින්' (අහති) යන නමින් හැඳින්වීම. තවත් අතකින් ඔවුන් වෙනස් කණ්ඩායමක් සේ සැලකීමට කැමැත්තක් ද දක්වති. ඒ දේශපාලන බලය, ආධාර ලබාගැනීම සහ පරිපාලනය යනාදිය ආශ්‍රයෙනි.

'මෙතරම් දිගු කාලයක් ගත වුවද අප තවමත් සරණාගතයින් විදිටයි මිනිසුන් සලකනේනේ. පාසැලේදී ගම්වාසී ගුරුවරු අපව අමතන්නේ අහති යන නමිනි.'
(ගැ, 39, සිරිමාපුර)

*නැවත පදිංචි කරවීමට පුත්තලම තෝරා ගැනීම*

1990/91 දී යාපනයෙන් හා මන්නාරමෙන් පිටමං කළ අවතැන්වූවන් විවිධ හේතූන් මත පුත්තලමට පැමිණියහ. ගොඩබිම් මාර්ගය අනාරක්ෂිත වීම හේතුවෙන් මන්නාරමෙන් පිටමං කළ වැඩි දෙනෙකු මුහුදු මාර්ගය ඔස්සේ කල්පිටියට ආහ. අනෙක් හේතුව, මන්නාරම් දිස්ත්‍රික්කයට පුත්තලම සමීප වීම සහ අවතැන් වීමට පෙර, පුත්තලම සමග වෙළෙඳ ගණුදෙණු තිබීමයි. එසේම, මන්නාරමේ ජීවත්වූවන්ට පුත්තලම වෙළෙඳ පොළ විය. ඔවුහු කෘෂිකාර්මික නිෂ්පාදන, ගොවිපළ සතුන් හා මසුන් විකුණා ගන්නේ පුත්තලමෙනි. මන්නාරමේ මිනිසුන්ට මුහුදු මාර්ගයෙන් හා ගොඩබිම් මාර්ගයෙන් පුත්තලමට පහසුවෙන් ළඟා වීමට හැකිවිය. පුත්තලම සමග ගණුදෙණු නොතිබූ අය පවා, තම ප්‍රජාව සමග පැමිණ පුත්තලමේ පදිංචි වූහ. පුත්තලම සමග තිබූ වෙළෙඳ ගණුදෙණුවලට වඩා ඔවුනට පුත්තලමේ පදිංචි වීම පහසු වූයේ, අවතැන්වූවන් වූ බොහොමයක් මුස්ලිම් වීම හා සත්කාරක සමාජයේ මුස්ලිම් පෙදෙස් තැනින් තැන තිබීම නිසාය. මේ තත්ත්වය නිසා සත්කාරක සමාජය සමග පොදු හැඟීමක් ඇති බවට ඔවුන්ට ඒත්තු ගියේය.

අවතැන්වූවන්ට පුත්තලම ආරක්ෂිත බවට හැඟීමක් ඇත. දිගු කලක සිට පැවත එන ආර්ථික ගණුදෙණු හා වාර්ගික-ආගමික අනන්‍යතාව යනාදිය පුත්තලම තෝරාගැනීමට මුල් වූ සෙසු සාධක විය. එම තෝරා ගැනීමට මුල් වු සෙසු සාධක වූයේ පුත්තලමේ අඩු ජනගහණයක් සිටීම හා ජීවන වියදම දැරිය හැකි මට්ටමක තිබීමත්ය.

'ඔවුන්ට ස්ථානයක් තෝරාගැනීමට වෙනත් විකල්ප නොතිබිණි. නමුත් අවතැන්වූවන් වීමට පෙර පුත්තලම සමග සම්බන්ධතා ගොඩනැගී තිබිණ. ඒ වෙළඳාම ආශ්‍රයෙනි. ඔවුහු මුල සිටම වී, මාළු හා සත්ව නිෂ්පාදන වෙළඳාම් කළේ පුත්තලමේදීය. මුස්ලිම්වරුන් වැඩි වශයෙන් ජීවත්වන වෙනත් ප්‍රදේශවලට වඩා පුත්තලම ඔවුන්ට ආසන්නය. එහි දුර කිලෝ මීටර 35ක් 40ක් පමණ වේ.'
(ප්‍රධාන තොරතුරුදායකයා, කෝවිල් පූජකවරයෙක්)

*ජීවන තත්ත්වයන්හි වෙනස්කම්*

බොහෝවිට අවතැන්වූවන් දුප්පතුන්ය. ඒ ඔවුන්ගේ ධනය රැගෙන යාමට ඉඩක් නොවූ හෙයිනි. ඇතැමෙක් පසු කලෙක, ඔවුන්ගේ වත්කම් විකුණා ආර්ථික වශයෙන් ස්ථාවර වූහ. තවත් සමරෙක් දිගටම දරිද්‍රතාවයෙන් පීඩා වින්දහ.

1990 දශකයේ අගභාගය වනතෙක් ඔවුන් ආපසු යන බලාපොරොත්තුවෙන් සුභසාධන කඳවුරුවල කල් ගෙවූහ. කඳවුරුවල තත්ත්වය මොවුන්ට සැමදා කල් ගෙවීමට හිතකර නොවීය. නැවත ගම් පළාත්වලට යාම ඉක්මණින් සිදු නොවන බව දැන ගැනීමෙන් අනතුරුව සුබසාධන කඳවුරු ක්‍රමයෙන් ස්ථිර නිවාස බවට පරිවර්තනය විය. ඇතැමෙක් පුත්තලමෙන් ඉඩම් ගත්හ. සමහර දෙනෙකුට දේශපාලනඥයින් සහ පළාත් පාලන ආයතන විසින් ඉඩම් ලබා දෙන ලදි. මෙසේ සෑම අවතැන්වූ පවුලකටම තමන්ගේ නිවසක් ඉදි කර ගැනීමට ඉඩම් පර්චස් 10 බැගින් ලබාදෙන ලදි. සුබසාධන මධ්‍යස්ථානවල ස්ථිර නිවාස වැඩි වීමට යටකී තත්ත්වය හෙතුවිය. අද වන විට බොහෝ සුබසාධන කඳවුරු තත්ත්වය උසස් වී, මනා නිවාස ඒකක ඉදි වී ජලය හා විදුලිය ලැබී සනීපාරක්ෂක කටයුතු දියුණු වී තිබේ. ඇතැම් කඳවුරු එසේ දියුණු වුවද තවත් සමහරක් අවම තත්ත්වයක පවතියි. පහසුකම් වලින් අනූන කඳවුරුවලට දේශපාලන අනුග්‍රහය ලැබී ඇති බව පෙනෙන්නට තිබේ. දේශපාලන අනුග්‍රහය ඇති අය ඉඩම් හා නිවාස

ලබාගැනීමට එම බලය පාවිච්චි කරති. එම දේශපාලන බලය, රජයේ හා රාජ්‍ය නොවන ආයතනවල ආධාර ලබාගැනීමට ද උපයෝගී කරගැනේ. සංසන්දනාත්මකව ගත්කල වැඩි අධ්‍යාපනයක් හා සමාජ සම්බන්ධතා ජාලයක් ඇති අය අන් අයට වඩා ඉතා ඉක්මණින් දියුණු වේ. මන්නාරමෙන් පැමිණි අවතැන්වූවන්ට යාපනයෙන් පැමිණි අයට වඩා දේශපාලන අනුග්‍රහය ලැබී ඇත.

දුප්පත්කම හා අවදානම්සහගත තත්ත්වයක් අවතැන්වූවන්ට තිබුණ ද සත්කාරක සමාජයේ එවැනිම දුප්පත් හා අවදානම්සහගත මිනිස්සු සිටිති. පුත්තලම මුල් කරගෙන ආරම්භ කර ඇති සංවර්ධන ව්‍යාපෘති බොහොමයක් අවධානය ලබා දෙන්නේ අවතැන්වූවන්ගේ අවශ්‍යතා සඳහාය. මෙම සීමිත අවධානය නිසා තමන් ද බාහිර ආධාර ලැබීමට සුදුස්සන් බව සිතන ප්‍රදේශයේ ජනතාව තුළ ආතතියක් ඇති කර තිබේ.

> 'රාජ්‍ය නොවන ආයතනවලින් 90%ක්ව සේවය කරන්නේ අවතැන්වූවන් වෙනුවෙනි. නමුත් ඒ සමානව කොන්කරන ලද දුප්පත් මිනිසුන් ප්‍රදේශයේ සිටිති. ඔවුන් නොසලකා හැර තිබේ.'
> (ප්‍රධාන තොරතුරුදායකයා, පුත්තලමේ රාජ්‍ය නොවන සංවිධානය)
>
> 'දැන් වනවිට අවතැන්වූවන් හා ප්‍රදේශවාසින් අතර විශාල ගැටුම් හටගන්නේ නැත. නමුත් තමන් රජයෙන්, රාජ්‍ය නොවන සංවිධාන හා ජාත්‍යන්තර සංවිධානවලින් වලින් කොන්කර ඇතිබව ප්‍රදේශවාසීහු සිතති. ඒ නිවාස, ආහාර සලාක හා ජීවනෝපාය ආධාර අවතැන්වූවන්ට පමණක් ලැබීම නිසාය. ප්‍රදේශවාසීන්ට එවැනි ආධාර නොලැබේ. මෙම තත්ත්තවය ප්‍රදේශවාසීන්ගේ ජීවන තත්ත්වය අවතැන්වූවන් වඩා පහත් බව පෙනී යයි.'
> (ප්‍රධාන තොරතුරුදායකහා,පි)

ද සිල්වා අනුව, 'පොහොසත් අවතැන්වූවන් පුත්තලම ප්‍රාදේශීය ලේකම් වසමේ නාගරික ප්‍රදේශයෙන් ඉඩම් හා නිවාස මිලට ගෙන තමන්ගේ වෙළඳාම සරුකරගෙන සිටිති. පොහොසතුන්ගේ දරුවන් නගරයේ දියුණු පාසැල් වලට යවති. මෙම ලේකම් කොට්ඨාශයේ යටිතල පහසුකම් වැඩියෙන් ලැබෙන්නේ ඔවුන්ටය. මෙම ධනවත් මුස්ලිම්වරු දේශපාලනමය හා ආර්ථිකමය වශයෙන් බලවන්තයෝ වෙති. නගරයේ දේශපාලන බලය තමන්ගේ අභිමතයට යොදා ගැනීමට ඔවුහු සමත් වෙති (ද සිල්වා, 1999)'

**සත්කාරක සමාජයේ ආකල්ප**

පසුගිය අවුරුදු 17 තුළ අවතැන්වූවන් පිළිබඳව ධාරක සමාජයේ ආකල්ප වෙනස් වූ ආකාරය දැනගැනීම සතුට දනවන්නකි. අවතැන්වූවන් මුලින් පැමිණි අවස්ථාවේ ක්ෂණික සහන ලබාදුන්නේ සත්කාරක සමාජයයි. සමහරුන් සුබසාධන මධ්‍යස්ථාන ඉදිකිරීමට තම ඉඩම් පවා පරිත්‍යාග කළහ. ප්‍රදේශවාසීන් අවතැන්වූවන්ට සැලකුවේ අවධානම් සහිත විශේෂිත වූ ජන කණ්ඩායමක් වශයෙනි. ඔවුන්ගේ පදිංචිය තාවකාලික නොවී ස්ථිර පදිංචියට සුදානම් වන අයුරු දුටුවිට සත්කාරක සමාජය ඔවුන් තවදුරටත් එහි රැඳී සිටීමට විරෝධය පෑහ.

ප්‍රදේශවාසීන් වැඩි දෙනෙක් අවතැන්වූවන් පුත්තලමේ පදිංචි වීම බලාපොරොත්තු නොවූහ. ඊට හේතු වූයේ පළාතේ සම්පත් මෙතරම් විශාල ජනකායක් සමග බෙදා ගැනීමට සිදු වූ හෙයිනි. මේ තත්ත්වය ඉඩම් ලබාගැනීමට, ජීවනෝපායන් සම්බන්ධයෙන්, රජයේ රැකියා, වැටුප්, සෞඛ්‍ය සහ අධ්‍යාපනය වැනි සේවා සම්බන්ධයෙන් උග්‍ර තරගයක් ඇතිවිය. ප්‍රතිචාර දක්වන්නන් වැඩිදෙනා සඳහන් කළේ විශ්ව විද්‍යාල සුදුසුකම් ලැබීමට ඇති තරගය සම්බන්ධයෙනි. පුත්තලම් දිස්ත්‍රික්කයට ලැබෙන විශ්ව විද්‍යාල කෝටාව දැන් ප්‍රදේශවාසීන් හා අවතැන්වූවන්ට බෙදාගැනීමට සිදු වූ ඇත. සත්කාරක සමාජය මේ තත්ත්වය තමන්ට අවාසි සහගත තත්ත්වයක් ලෙස දකියි.

එක් එක් අවස්ථාවලදී මේ තරගය ගැටුම්වලට හා ප්‍රචණ්ඩත්වයට මුල් වී ඇත. පුත්තලමේ මෙම විරුද්ධත්වය පවතිද්දී එය විවිධ කණ්ඩායම් දේශපාලන වාසියට පොළඹවා ගැනීමෙන් තත්ත්වය තවත් බැරෑරුම් කොට තිබේ. මේ තත්ත්වය සමනය කර ගැනීමට තවදුරටත් අවතැන්වූවන් වෙනුවෙන් සිදු කරන සංවර්ධන ව්‍යාපෘතිවලට හැකි වී නැත. ඔවුන්ගේ ව්‍යාපෘති ක්‍රියාවලිය අනම්‍ය එකකි.

> 'මේ වනතෙක් ප්‍රදේශයේ ප්‍රශ්න වැඩි වී නැත. ඔබ දන්නා පරිදි ජනවර්ග තුනම එකට ජීවත්වන එකම දිස්ත්‍රික්කය පුත්තලමයි. නමුත් එහි සම්පත් මුල්කරගත් ගැටුම් පවතී. නිදසුනක් ගත් විට, විශ්වවිද්‍යාල ප්‍රවේශ කෝටාව අසාධාරණයි. ඒ, හැමදෙනාම එකම දිස්ත්‍රික්කයට තරඟ වදින බැවිනි. පුත්තලමේ විශ්වවිද්‍යාලවලට ප්‍රවේශවන සංඛ්‍යාවේ ඉහළ යාමක් පෙන්නුම් කරන්නේ, වෙනත් දිස්ත්‍රික්ක වලින් පැමිණි අය සත්කාරක සමාජය සමග විභාගවලට පෙනී සිටින හෙයිනි. එය ප්‍රදේශවාසීන්ට අවාසි සහගත තත්ත්වයකි. හැමදෙනාම එකම ප්‍රතිශතය බෙදා ගනිති. '
> (ප්‍රධාන තොරතුරුදායකයා, පුත්තලමේ රාජ්‍ය නොවන සංවිධානය)

> 'විශ්වවිද්‍යාල අධ්‍යාපනය සලකා බැලුවහොත් දිස්ත්‍රික් කෝටාව තවමත් 1990 පැවති සංඛ්‍යාවයි. ඒ තත්ත්වය උඩ අවතැන්වූවන් සමග ප්‍රදේශවාසී ශිෂ්‍යයින්ට තරග වැදීමට සිදුවේ. අවතැන්වූවන් වූ සිසුන් සංඛ්‍යාවෙන් වැඩි අතර අධ්‍යාපනයෙන් ද ප්‍රදේශවාසී සිසුන්ට වඩා ඉහළින් සිටිති. මේ අනුව විශ්වවිද්‍යාවලට ඇතළුවන ප්‍රදේශවාසී සිසුන් ප්‍රමාණය පහත වැටී ඇත.'
> (ප්‍රධාන තොරතුරුදායකයා, පි)

> 'අපගේ අධ්‍යාපන සම්පත් ගතහොත් ඒවාද සූරාකන්නේ අවතැන්වූවන්ය. ඔවුන්ගේ පැමිණීම නිසා විශ්ව විද්‍යාලවලට ඇතුළුවීමට උග්‍ර තරගය නිරත වීමට අපට සිදුවේ. අවතැන්වූවන් වැඩි දෙනා, විශ්ව විද්‍යාලවලට තේරේයි. දිස්ත්‍රික්ක කෝටාව ඔවුන්ට හිතකර වී ඇත.'
> (ප්‍රධාන තොරතුරුදායකයා, මුස්ලිම් පූජකවරයෙක්)

මේ තත්ත්වය සම්බන්ධයෙන් අවතැන්වූවන් සිතන්නේ වෙනස් ආකාරයකටයි. වත්මන් අවතැන්වූ තත්ත්වය නිරාකරණයට රජයෙන් විසඳුමක් නොමැති හේතුවෙන් ඔවුන්ට රටේ ඕනෑම තැනක පදිංචිවීමට අයිතියක් ඇති බව ඔවුන්ගේ හැඟීමයි.

> 'සත්කාරක සමාජය සිතන්නේ ඔවුන්ට රැකියා, රජයේ රැකියා නැතිවෙන්නේ අවතැන්වූවන්ගේ පැමිණීම නිසා බවයි. එය අසාධාරණ යැයි සිතමි. මන්ද අප දි ජීවනෝපායක් කළ මනුෂ්‍ය කොට්ඨාශයක් නිසයි. එල්ටීටීඊ ය අපට අපගේ ගම් පළාත්වල ජීවත්වීමට ඉඩ නොදෙන්නේ නම් අප ජීවත් වන්නේ කොහේද? අපි සරණාගතයින් ලෙස සදාකාලිකව සිටිය යුතුද? අපට සාධාරණය ඉටුවිය යුතුය.'
> (ගැ, 32, නොරොච්චොලේ)

*පුත්තලමට අවතැන්වූවන් පැමිණීමෙන් ඇතිවූ බලපෑම*

ප්‍රතිචාරදැක්වූවන් වැඩිදෙනා පැවසුයේ අවතැන්වූවන්ගේ පැමිණීමෙන් පසු පළාත සීඝ්‍ර දියුණුවක් ලැබූ බවයි. යටිතල පහසුකම්, සේවා සැපයීම, ව්‍යවසාය සංවර්ධනය ආදියෙන් දියුණුවක් සිදුවෙනවා ඔවුහු දුටුහ. කෙසේ නමුත්, මේ දියුණුව වැඩිවෙන ජනගහණය රැකබලාගැනීමට ප්‍රමාණවත් නොවීය.

අවතැන්වූවන්ගේ ආයෝජන පළාතට විවිධ සහ ශක්තිමත් ආර්ථික පරිසරයක් උදාකර දීමට සමත්විය. ඉන් අවතැන්වූවන් මෙන්ම ප්‍රදේශවාසීන්ටද රැකියා අවස්ථා උදාවිය. නමුත් වෙළෙඳන්ට මුහුණ දීමට සිදු වූ තියුණු තරගය නිසා ඇතැම් අය සංවර්ධනයේ සාධනීය නොවන ලක්ෂණ දුටහ. වගාවට යට

නොකළ ඉඩම් රාශියක් අවතැන්වූවන් මිලට ගෙන ඵලදායී ලෙස යොදවමින් ඔවුන්ගේ ආර්ථික සම්පත් වැඩි දියුණු කරගත්හ.

'අවතැන්වූවන්, පුත්තලමට පැමිණි පසු පුත්තලම සංවර්ධනය වූයේ ඔවුහු එතෙක් ප්‍රයෝජනයට නොගෙන තිබූ ඉඩම්වල පාසැල්, ගොඩනැගිලි, වෙළඳ මධ්‍යස්ථාන ඉදිකළ හෙයිනි. දිස්ත්‍රික්කයේ අධ්‍යාපන තත්ත්වය පවා ඉහළ ගියේය. මෙහි ජීවත්වන ජනයාගේ දිවිපෙවත් ඉහළ තත්ත්වයට පැමිණි බව දක්නට ලැබිණ. පැහැදිලිවම ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවිණ. ඔවුන් අවතැන් වීමට පෙර සිටි තත්ත්වයට වඩා ඔවුන් මෙහි පැමිණීමෙන් තත්ත්වය දියුණුවිය.'
(ප්‍රධාන තොරතුරුදායකයා, කෝවිල් පූජකවරයෙක්)

'අපගේ ගම දියුණු වූයේ මුස්ලිම්වරුන්ගේ පැමිණීමේන් අනතුරුවය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇමතිවරයෙකු විසින් 1996දී දියත් කළ නැවත පදිංචි කිරීමේ සැලැස්ම, මෙම සංවර්ධනයට මුල්විය.'
(පි 72, සිරිමාපුර)

'මීට පෙර පල්ලිවසල්තුරෙයි ප්‍රදේශයේ එක වෙළෙඳ සැලක්වත් දක්නට නොලැබුණු. අද එවැනි වෙළෙඳ සැල් රාශියක් මේ පළාතේ ඇත. සෞඛ්‍ය සේවාවන් දියුණු වී ඇත. සෞඛ්‍ය සායනය එක් නිදසුනකි.'
(ගැ 32, නොරොච්චොලේ)

*අවතැන්වූවන්ගේ ව්‍යුහාත්මක වෙනස්වීම් හා සත්කාරක සමාජයේ සංජානනය*

බොහෝ අවතැන්වූ කඳවුරු පිහිටා තිබෙන්නේ සත්කාරක සමාජයෙන් හුදකලා වූ ස්ථානවලය. ඔවුන් දේශපාලන නියෝජනයෙන්, ආයතනවලින් හා ප්‍රාදේශීය පරිපාලනයෙන් වෙන්කර ඇත.

අවතැන්වූවන් සම්බන්ධ කාරණාවලදී කටයුතු කරන්නේ පුද්ගලයින් නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයයි. අවතැන්වූවන් ලියාපදිංචි වී සිටින්නේ ඔවුන්ගේ ගම් පළාත්වල නිසා දේශපාලන නියෝජිතයන් පත් කිරීමේ ඡන්ද අයිතිය සත්කාරක සමාජය තුළ ඔවුනට නොමැත. මේ තත්ත්වය නිසා අවතැන්වූවන් ගැන සේවීමට පුද්ගලයින් නැවත පදිංචි කරවීමේ අමාත්‍යාංශය යටතේ උතුරට හා නැගෙනහිරට වෙනම විශේෂ කොමිසමක් පත් කරන ලදි. ඔවුන්ට වියළි සලාක, විදුලිය, ජලය, ප්‍රවාහනය, පාසැල්, රෝහල් වැනි යටිතල පහසුකම් සපයන්නේ එම විශේෂ කොමිසම මගිනි. මෙසේ අවතැන්වූවන් ගැන සොයා බලන සංවර්ධන ආයතන උතුරේ ද ආරම්භ විය.

'මෙහි අපට ඇත්තේ සීමිත සම්පත් ප්‍රමාණයකි. දැන් එය පාර්ශ්ව දෙකටම පාවිච්චි කිරීමට සිදුවී ඇත. රාජ්‍ය නොවන සංවිධාන සියල්ල අවතැන්වූවන්ට උදව් කිරීම නිසා සත්කාරක සමාජය කෝප වූ අවස්ථා ඇතිවිය. දැන් දැන් සමහර රාජ්‍ය නොවන සංවර්ධන සත්කාරක සමාජයට ආධාර කරයි. අවතැන්වූවන් වෙනුවෙන් වෙන් වූ ආමාත්‍යාංශයක් තිබේ. ඔවුහු අපගේ සම්පත් භාවිතා කරති. නිදසුන් වශයෙන් ගත් කල, ඔවුනට දිස්ත්‍රික්ක දෙකේම විශ්වවිද්‍යාල කෝටා සහ රජයේ රැකියා අවස්ථා ලැබේ.'
(ගැ,32, නොරොච්චොලේ)

'ඔවුනට සංඛ්‍යාත්මක වශයෙන් හා දේශපාලනමය වශයෙන් වැඩි බලයක් ඇත. රජයේ ආහාර සලාක ලැබේ. විදුලිය හා ජලය වැනි යටිතල පහසුකම් ලැබේ. අපි මේ පළාතේ අවුරුදු ගණනාවක් පදිංචිව සිටියත් අපට තවමත් එවැනි පහසුකම් ලැබී නැත. අප පදිංචි ඉඩමේ ඔප්පු ලබාගැනීමට අවුරුදු 20-30 කාලයක් මුළුල්ලේ වෑයම් කළ ද එය සිදුවූයේ

නැත. අවතැන්වූවන් පුත්තලමට පැමිණ ගත වූ දින 2-3න් ඔවුන් පදිංචි ස්ථානවල ඔප්පු ලැබිණ.'
(ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා, පලාවි)

දේශපාලන අනුග්‍රහ ලබාගැනීමේ අවස්ථාවලදී අවතැන්වූවන් අතර බෙදීම් මතුවේ. ඔවුන්ගේ මුල් පදිංචිය අනුව, ඔවුනට දේශපාලනඥයින් සලකන්නේ වෙනස් ආකාරයෙනි.

'යාපනයේ අවතැන්වූවන්ට තමන්ගේම කියා මන්ත්‍රීවරයෙක් නැත. මන්නාරමේ අයට මන්ත්‍රීවරයෙක් සිටී. මන්ත්‍රීවරු සැමගේ සුබ සිද්ධියට වගකිව යුතුවේ. මන්නාරමේ මන්ත්‍රීවරයාගේ අවධානය එම ප්‍රදේශයේ අවතැන්වූවන්ට ලැබෙන එක ආසාධාරණයි.'
(ප්‍රධාන තොරතුරුදායකයා,පි)

'එක් මන්ත්‍රීවරයෙක් යාපනයේ මුස්ලිම්වරුන්ට වඩා මන්නාරමේ මුස්ලිම්වරුන්ට වැඩි සැලකිල්ලක් දක්වයි. ඔහුව තෝරා පත්කළේ මන්නාරමේ අවතැන්වූවන්. නමුත් දැන් ඔහු දැන් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ අමාත්‍යාංශයේ ඇමතිවරයාය.'
(ප්‍රධාන තොරතුරුදායකයා,පි, පලාවි)

අවතැන්වූවන්ට ආධාර කිරීම වෙනම ආයතන ඇති කිරීමෙන් සත්කාරක සමාජයට වෙනස්කම් කරන බවට හැඟීම් ඇති කරවයි. අවතැන්වූවන්ගේ තත්ත්වය හා ලැබෙනෙ ආධාර නිසා ඔවුනට සමාජ තත්ත්වයන් ලැබී ඇත. අවතැන්වූවන්ට වෙනම දේශපාලන නියෝජනයක් ලබා දීමෙන් දිස්ත්‍රික්කයේ පවතින බල ව්‍යුහය හා ජාතික මට්ටමේ බලතුලනය විකෘති කෙරේ. දිස්ත්‍රික්කයේ ප්‍රදේශවාසීන්ට එය පෙනෙන්නේ අවතැන්වූවන්ගේ දේශපාලන ශක්තිය වැඩි බවයි. පුත්තලමට සමාජ ආර්ථික වශයෙන් අනුගත වී සිටින අවතැන්වූවන්ට වෙනම දේශපාලන නියෝජනයක් හා ආධාර අවශ්‍ය මක්නිසාද යන්න අවදානම් සහගත ජනතාව සිටින සත්කාරක සමාජය ප්‍රශ්න කරයි. මෙම වෙන් කිරීම් හා මිනිසුන් තුළ පවතින අදහස් මෙම පර්යේෂණය අධ්‍යයනය කළ ගැටුමේ සැඟවුණු හේතු හැටියට පෙනේ.

*අවදානමට භාජනය වීම දෙස නැවත හැරී බැලීමක්*

මෙම අධ්‍යයනය අවදානමට ලක් වූ අය ගැන සොයා බැලීමක් කරන අතර ඊට දක්වන ප්‍රතිචාර විභාග කරයි. මූලික අධ්‍යයනය හා අතිරේක අධ්‍යයනය අවදානමට භාජනය වන කණ්ඩායම් සහ ප්‍රදේශයේ වෙනත් අවදානම් සහිත වීමේ හේතු ලක්ෂණ සොයා බැලීය. ඒ සමගම අවදානමට මුහුණ දීමට යොදාගන්නා ඇතැම් ක්‍රම හඳුනා ගනී. අවදානම් තත්ත්වයට බාහිර පුද්ගලයින් ප්‍රතිචාර සොයා බලයි.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන සොයා ගැනීම ලැබුණේ 'සාමය රඳවා ගැනීම' යන අංශයෙනි. ඔවුන්ගේ කාර්යය වූයේ ප්‍රදේශයේ සාමය පවත්වාගෙන යාමට අවශ්‍ය වැදගත් සාධක හඳුනාගැනීමයි. මෙහිදී සොයාගත් අදහස වූයේ අවතැන්වූවන් නොවන නමුත් අවදානමට ගොදුරුවන සෙසු ප්‍රදේශවාසීන් වෙනුවෙන් රාජ්‍ය බලධාරීන් හා සංවර්ධන සංවිධාන ප්‍රමාණවත් අවධානයක් යොමු නොකළහොත් ප්‍රදේශයේ 'සාමය' පවත්වාගෙන යා නොහැකි බවයි.

'මම ප්‍රකාශ කරන්න කැමතියි පසුගිය අවුරුදු 16 තුළ ප්‍රදේශාවාසීන් බොහෝ අවාසි සහගත තත්ත්වයනට මුහුණු දුන් බවය. ආගම අවතැන්වූවන් හා ප්‍රදේශවාසීන් සම්බන්ධ කරයි. නමුත් දෙපාර්ශ්වය ආගමික බැම්වලින් ඔබ්බට ගිය විට තත්ත්වය ප්‍රචණ්ඩත්වයට හැරෙයි. එම නිසා කරදර සිදුවීමට පෙර මෙම ප්‍රශ්නය විසඳා ගත යුතුයි.'
(ප්‍රධාන තොරතුරුදායකයා, මුස්ලිම් නායකයෙකු)

අවතැන්වූවන් සහ ඔවුන්ගේ නියෝජිතයින් මේ අවදානම් තත්ත්වය එලෙසින් තබා ගනිති. එම තත්ත්වය දේශාපාලන හා පරිපාලන රාමුවෙන් ශක්තිමත් කරයි. ඔවුන් යළි ගම්බිම් බලා යන බව පවසා පුත්තලමේ

සිටින්නේ තාවකාලිකව තත්ත්වයෙන් බව තහවුරු කරයි. මේ තාවකාලික පදිංචිය අවුරුදු 18ක් තිස්සේ පවතින්නේ ඒ සම්බන්ධයෙන් ලැබෙන වාසි නිසාය.

පුත්තලමේ අවදානම් සහිත අවතැන්වූවන් සිටිනවා වාගේම අවදානම් සහිත ප්‍රදේශවාසීන් ද සිටින බව රජයේ සංවර්ධන ක්‍රියාකාරීන් සහ රාජ්‍ය නොවන සංවිධාන සංවේදී විය යුතුය.

> 'අවතැන්වූවන් දියුණු තත්ත්වයකට පත්වී සිටියි. ඔවුන්ගේ ඉඩම්වලට ඔප්පු තිබේ. ඔවුන්ට යානවාහන තිබේ. නමුත් ප්‍රදේශවාසීන්ගේ තත්ත්වය වැඩිදියුණු වී නැත (මුල් පදිංචිකරුවෝ හිටපු තැනමයි) ඔවුන්ගේ ඉඩම්වලට ඔප්පු පවා නැත. මුස්ලිම්වරුන්ට දේශපාන අනුග්‍රහය ද ඇත.'
> (ප්‍රධාන තොරතුරුදායකයා, බෞද්ධ භික්ෂුවක්)

> 'මේ ප්‍රදේශයේ දුප්පත් වී සිටීම මුස්ලිම් කාන්තාවකට දුක්ඛදායක තත්ත්වයකි. ඇයට කිසි දිනෙක විවාහ විය නොහැක. විවාහයට රුපියල් ලක්ෂ 3ක් අවශ්‍යයි. එපමණ මුදලක් අපි කෙසේ සොයන්නද? අපට ඉඩමුත් නැහැ. අන්‍යෝන්‍ය අවබෝධය කියන කථාව මම දකින්නේ වංචාවක් ලෙසයි. මොකද එවැනි පුද්ගලයින් සත්‍ය වශයෙන්ම හමුනොවේ.'
> (ප්‍රධාන තොරතුරුදායකයා, WODEPT)

> 'මෙහි ජීවත්වන මිනිසුන් හුදකලා වී ජීවත් වෙති. සමහරෙකුට දෙමාපියන් නොමැත. තව කෙනෙකුට සැමියෙකු නැත. ඔවුන් එක්කෝ මිය ගොසිනි, නොඑසේ නම් පවුල් හැරදා ගොසිනි. වැඩි දෙනෙකුට වෙළඳාම් කිරීමේ හැකියාවන් තිබුණ ද ඒ සඳහා යට කී පිරිසට මුදල් නොමැත. සමහරු ස්වශක්තියෙන් දියුණු වී සිටිති. පොල් වෙළඳාමක් ආරම්භ කළ එක් කාන්තාවක් එය හොඳින් කරගෙන යයි. තවත් සමහරු කුඩා වෙළෙඳ සැල් හොඳින් පවත්වාගෙන යති. පොල් කර්මාන්තයට ආධාර ලැබුණේ CHA ආයතනයෙනි. එය අයිති කාන්තාව උගත් නිසා ඇයට වෙළෙඳ පසුබිම ගැන දැනුම් තේරුම් තිබේ.'
> (ප්‍රධාන තොරතුරුදායකහා, ගැ, නාගවිල්ලු)

අදහස් හුවමාරු කරගන්නා මුල් කණ්ඩායම පුත්තලම ප්‍රදේශයේ කණ්ඩායම් කිහිපයක් හඳුනාගත්හ. ඔවුන් අතර දුප්පත් ප්‍රදේශවාසීන්, කාන්තා මූලික කුටුම්භයන්, විගමනික දෙමාපියන් සිටින කුටුම්භයන් සහ සංක්‍රමණික ධීවරයන් වූහ. මේ සියළු දෙනා අවදානම් සහිත පුද්ගල කණ්ඩායම් ලෙස හඳුනාගන්නා ලදි. ඔවුන් පිළිබඳ තොරතුරු මෙම අධ්‍යයනයේ ඇතුළත් කළේ අවදානම් සහිත කණ්ඩායම් පිළිබඳ දැනුම පුළුල් කිරීමට හා මෙම අධ්‍යයනයෙන් පුත්තලමේ පවතින තත්ත්වයේ පුළුල් බව කියා පෑමටය.

මූලික වැඩමුළුවේදී කාන්තාවන් හඳුනාගන්නේ විශේෂ අවදානම් සහගත කණ්ඩායමක් ලෙසය. දික්කසාද වීම නිසා හෝ පුරුෂයා මිය යෑම හෝ අතුරුදහන් වීම නිසා හෝ නිර්මාණය වී තිබෙන කාන්තා මූලික කුටුම්භය ඉතා සුලබ සිද්ධියක් බව ප්‍රතිචාර දක්වන්නන්ගේ අදහස විය. විනිවිඳ සංවිධානය විසින් සොයාගන්නා ලද කරුණුවලට අනුව මෙම කාන්තාවන්ගෙන් බහුතරය සමෘද්ධි ලබති. කුලී වැඩකරති. කෘෂිකර්මයේ සහ ධීවර කර්මාන්තයේ (කලපු හා මුහුදේ) ස්වයං රැකියා කරති. ටික දෙනෙක් සුළු වෙළෙඳ සැල් පවත්වාගෙන යති.

විගමණික සේවකයන්ගේ පවුල් ද අවදානම් සහිත කණ්ඩායමක් ලෙස හඳුනා ගැණින. මේ අයගේ පවුලේ සාමාජිකයන්ගේ අදහස වූයේ විදේශ රැකියාවලට යනවාට වඩා රටේ කුමක් හෝ කිරීම වඩා හොඳ බවයි. ඒ, විශේෂයෙන් කාන්තාව විදේශගත වීමෙන් පවුලට සිදුවන ගැහැට නිසාය. විදේශගත වී ආපසු පැමිණි අය කියා සිටියේ ඔවුන් විදේශයේ සිටිනවාට වඩා මුදල් ප්‍රශ්න දැන් ඇති වී තිබෙන බවයි. ඔවුන් ද සිතන්නේ ඔවුන්ගේ විදේශගත වීම ඔවුන්ගේ ප්‍රශ්න නිරාකරණයට හොඳම මාර්ගය නොවන බවයි.

සංක්‍රමණික ධීවරයන් යුද්ධය ඇතිවීමට පෙර ඍතු කාලවලදී උතුරු නැගෙනහිරට ගියහ. සටන් විරාමය කාලය තුළ වාකරේ, කුකුලාව, පුල්මුඩෙයි, කල්ලරාව, නයාරු, වානිකුලම්, සමන්තුරෙයි, කුණ්ඩා සහ සෙල්ලක්කන්නි යන ප්‍රදේශවලට ගියහ. මේ ධීවරයන් විශ්වාස කරන්නේ නැගෙනහිර උතුරට වඩා සාමකාමී බැවින් මසුන් ඇල්ලීමේ යෙදිය හැකි බවයි. වාරකන් කාලයේ මසුන් ඇල්ලීමට නොහැකි නිසා ආර්ථික ප්‍රශ්න මතුවේ. අතීතයේදී ඔවුන් කලකෝලාහලවලට මැදි වී තමන්ගේ ධීවර ආම්පන්න අතහැර අලාභානි විඳ ගෙන ඇත.

මෙම කණ්ඩායම් අධ්‍යයනයේදී හඳුනාගත් හා ගවේෂණය කළ කණ්ඩායම් කිහියක් පමණි. පුත්තලමේ සංවර්ධන කටයුතුවලදී මෙම කණ්ඩායම් නොසලකා හැරිය යුතු නොවේ. සංවර්ධන ව්‍යාපෘති හා ආධාර ක්‍රම ඉතා පටු ලෙස අවදානම් සහිත ජන කණ්ඩායම් හඳුනාගෙන ඇත. ඒ නිසා සමාජයේ පවතින නොසන්සුන් තවත් තීව්‍ර වී තිබේ. මෙම නොසන්සුන්තාවය තවදුරටත් පැතිර යාමට ඉඩ නොදී බලධාරීන් බිම් මට්ටමේ යථාර්ථය තේරුම් ගෙන සංවේදී ලෙස සැලසුම් ක්‍රියාත්මක කළ යුතුය.

# 6 සාමය ගොඩනැගීම හා සාමය පවත්වාගෙන යාම

මෙම අධ්‍යයනයේ හරය වී ඇත්තේ ප්‍රජාවන් විසින් ගැටුම් කළමණාකරණය කිරීමයි. මීට ඉහතදී, ගැටුම, ඊට පාදක වූ හේතු හා එම සාධක එකිනෙක සමග ගැටෙන අයුරු පිළිබඳ තොරතුරු සැපයීය. ගැටුම් විග්‍රහය, මෙවැනි ගැටුම් විසඳු ආකාරය, එම ප්‍රයත්නයන්වල සාර්ථකත්වය ද ඉහතදී සාකච්ඡා කෙරිණි. මීළඟ ඡේද නැවතත් හරය ගැන කථා කරයි. එනම්, **සාමය ගොඩනැගීම හා පවත්වාගෙන යාමයි.**

*සාමය ගොඩනැගීම*

ගැටුම් සිද්ධි සියල්ල විසඳුනේ බාහිර ක්‍රියාකාරිකයන්ගේ උදව් ඇතිව, ගැටුම් පාර්ශ්වයන් මඟිනි. විසඳුම් සියල්ල සාමූහක තීරණ මත සිදුවිය. ඒ කිසිවෙක් තනිකරම බාහිර ක්‍රියාකාරීන් මත පමණක් යැපුනේ නැත.

බාහිර මැදිහත්වීම සිදුවූ වෙලාව සාධනීය විසඳුමකට යැමට වැදගත් අවස්ථාවකි. ප්‍රජාව එකිනෙකා සමග මුලාවීමට පෙර එම ගැටුම විසඳීමට 'කදිම අවස්ථාවක්' එළඹේ. එහිදී පාර්ශ්ව දෙකටම සම්මුතියකට එළඹීමට ඉඩ ප්‍රස්තා ලැබේ. මේ සම්මුති විසඳුම සාර්ථක වීමට නම් සරල එකක් විය යුතු මෙන්ම, නිවැරදි වෙලාවට ක්‍රියාවට නැංවීම වැදගත්ය. බොහෝ දුරට සාර්ථක විසඳුම් හෝ නිරාකරණය සිදුවන්නේ ගැටළුව සමාජ අසහනයකට හෝ අවුල් සහගත තත්ත්වයකට පත්වීමට පෙර අවධියේය. මෙම ඉඩ ප්‍රස්ථා අහිමි කරගත් විට, ගැටුම එක් මැදිහත් වීමකින් විසඳිය නොහැකි තත්ත්වයකට පත්වේ. නිදසුනක් වශයෙන් ග්‍රාමීය සංවර්ධන පදනම සිරිමාපුර සුසාන භූමිය මුල් කරගෙන හටගත් ගැටුම කලින් හඳුනාගත් නිසා එය පුපුරා යාමට පෙර ඊට මැදිහත් විය. ග්‍රාමීය සංවර්ධන පදනම කල් ඇතිව හා තීරණාත්මකව මැදිහත් වූ නිසා ගැටුම වර්ධනය වීම නැවතිණ. මීට ප්‍රතිවිරුද්ධ සිද්ධියක් වනාතවිල්ලුවේ සේරක්කුලිය ධීවරයන්ට අළුත් ජෙටියක් සැදීමේ දී මතුවිය. එම ගැටුම විසඳීම අසාර්ථක වී ගැටුම අඩවශයෙන් විසඳී ඇත.

තවත් තැනක, ගැටුම ඉඩම් හිමිකාරත්වය සම්බන්ධයෙන් පැන නැගුණු විට, පාර්ශ්ව නීතිමය අධාර පැතුහ. පලාච්චල හටගැණුනු ඉඩම් හබය උසාවියට ගෙන ගියේ සාධාරණ විනිශ්චයක් ලබාගැනීමටය. එය සාම කමිටු හා ආගමික නායකයින්ගේ මට්ටමින් විසඳිය නොහැකි වූයේ ඔවුන් ද දෙපැත්තට බෙදී හිටි හෙයිනි.

පොදු දේපල පිළිබඳ ගැටුම්වලදී විසඳුමක් සඳහා පාර්ශ්වයන් සංවර්ධන ආයතන කරා යති. නොරොච්චොලේ කාන්තා කණ්ඩායම් සත්කාරක සමාජය පාවිච්චි කළ සායනය, අවතැන්වූවන් සමග බෙදා හදා ගැනීමේ ප්‍රශ්නයේදී ISRC ආයතනය වෙත ගියහ.

ආරවුල් නිරාකරණයේදී රාජ්‍ය ව්‍යුහයන් සහ ක්‍රියාකාරීන් අපක්ෂපාතී බව ගැටුම් පාර්ශ්වයන්ට පෙනී යා යුතුය. වනාතවිල්ලු, උඩප්පු, නාගවිල්ලු යන ස්ථානවල ප්‍රජාවගේ අත්දැකීම් අනුව විසඳුමක් සාර්ථක වන්නේ, විසඳුම සාධාරණ බව සෑම පාර්ශ්වයකටම ඒත්තු ගිය හොත් පමණි.

පුත්තලමේ ඇතිවූ ගැටුම් නිරාකරණයේදී විවිධ කණ්ඩායම් විවිධ ක්‍රම පාවිච්චි කළහ. ඉන් වඩාත් සාර්ථක වූයේ සාම කමිටු හා පුද්ගලයන් ගැටුම් නිරාකරණයට මැදිහත් වූ අවස්ථාවලදීය. ඔවුන් අපක්ෂපාතීබව සැවොම පිළිගත් නිසා ගැටුමේ පාර්ශ්වයන් අතර සාකච්ඡා ආරම්භ කොට මැදහත්වීමට හා බේරුම් කර දීමට පුළුවන් විය. එම විසඳුම නීතියෙන් නොබැඳුණත් එය විශ්වාසය හා ගෞරවය මත පදනම් වූ නිසා ඵලදායී විය.

මීට ප්‍රතිවිරුද්ධව විධිමත් අධිකරණ ක්‍රමය තුළින් ලබාගන්නා නීතිමය තීන්දු විසඳුම් ලබා දෙන්නේ, පොලිසිය විසින් කරන ලද තීන්දුවක් ලෙසිනි. ඉඩම් ආරවුල්වලදී මේ ක්‍රමය එතරම් ඵලදායී නොවේ.

එම තීන්දුව නොපිළිගන්නා ගැටුම් පාර්ශ්වයක් තීන්දුවට විරුද්ධව ඉහළ උසාවියට අභියාචනය කළ හැකිය. මේ කරුණු නිසා එම ගැටුම කලක් තිස්සේ නොවිසඳී පවතියි.

*සාම කමිටු*

සාම කමිටු සකස් වූයේ ආරවුල් සමථය සඳහාය. මේ කමිටු ස්ථිරසාර ඒවා නොවේ. ගැටුම් අවසානයේ මේ කමිටු විසුරුවා හැර, ගැටුමක් ඇතිවුවහොත් නැවත ආරම්භ කෙරේ.

> 'සිංහල, මුස්ලිම් හා දෙමළ ප්‍රජාවන්ගෙන් හා අවතැන්වූවන්ගෙන් සමන්විත සාම කමිටු මේ ප්‍රදේශයේ ඇත. මෙම කමිටුවල නිලධාරීන් 6ක් 7ක් ඇතුළුව සාමාජිකයන් 45ක් සිටිති. කමිටුවල මූලික කාර්යභාරය සියළු වාර්ගික ජන කණ්ඩායම් ඒක රාශී කිරීමයි.'
> (ප්‍රධාන තොරතුරුදායකයා, ගැ, නාගවිල්ලු)

සාම කමිටු පිහිටවූයේ ආරවුල්වලට ප්‍රතිචාර ලෙසිනි. එම නිසා ඒවා වෙනස් මට්ටම්වලින් ක්‍රියාත්මක විය. ප්‍රජා මූලික සාම කමිටු සමන්විත වන්නේ ප්‍රාදේශීය ආගමික නායකයින්, ප්‍රජා නායකන්, පළාතේ සංවර්ධන ආයතනවල නියෝජිතයින්ගෙන්ය. මේ කමිටු කටයුතු කළේ ප්‍රාදේශීය මට්ටමේ ආරවුල් විසඳීමටය. දිස්ත්‍රික්කයේ මීට වඩා ඉහළ මට්ටමේ සාම කමිටු තිබේ. ඒවා එතරම් හොඳින් ක්‍රියාත්මක නොවේ. පුත්තලමේ දිස්ත්‍රික්ක/පළාත් මට්ටමේ සාම කමිටු වැදගත් ආගමික ප්‍රභූන් එනම් බෞද්ධ භික්ෂුව, ක්‍රිස්තියානි පූජක, මුස්ලිම් පල්ලියේ නායක (හසාරත්) හා හින්දු පූජක (කෝවිල් අයියර්) හා ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් සමන්විත වේ. මෙම කමිටුවල සාර්ථකත්වය රඳා පවතින්නේ ආගමික නායකයින් අතර තිබෙන මනා සම්බන්ධතාවන් මතය. දිස්ත්‍රික් ලේකම් මෙම කමිටුවේ සභාපතිවරයාය. අවශ්‍යතාවය පරිදි කොට්ඨාශ ලේකම්වරුන් හා ප්‍රධාන සංවර්ධන ආයතනවල නියෝජිතයින් ආරාධනය පරිදි කමිටුව සහභාගී වෙති.

> 'මේ දිනවල සාම කමිටු ක්‍රියාත්මක නොවන්නේ ඒවා එක් රැස් වන්නේ සිද්ධියක් ඇතිවීමෙන් අනතුරුව වීම නිසාය. දිසාපති මේ කමිටුවේ සභාපතිවරයාය.'
>
> 'නමුත් මේ සිද්ධියේදී දිස්ත්‍රික් සාම කමිටුව ඊට හොඳින් මැදිහත් වූයේ නැත. අද අවතැන්වූ පුද්ගලයන් එක් ඇමතිවරයෙක් මුණගැසී සිද්ධිය ගැන සාකච්ඡා කිරීමට කොළඹ යෑමට නියමිතයි. මේ ගැන සාකච්ඡා කිරීමට අපි බෞද්ධ භික්ෂුවක් මුණගැසීමට තීරණය කළා. නමුත් ඔහු ඉන්දියාවට ගිය නිසා ආපසු එනතෙක් මුණගැසීම කල් දැම්මා.'
> (ප්‍රධාන තොරතුරුදායකයා, මුස්ලිම් පල්ලි නායකයෙක්)

මෙම ඉහළ මට්ටමේ සාම කමිටු සාමාජිකයන් මෙම සිද්ධීන් සාකච්ඡා කිරීමට ආගමික හා සංස්කෘතික උත්සව අවස්ථාවක් කරගනිති.

> 'මෙම ප්‍රදේශයේ ආගමික නායකයන් අතර ශක්තිමත් සම්බන්ධතා ගොඩනැගී තිබේ. ආගමික නායකයින් වශයෙන් අපි සෑම විශේෂ උත්සවයකටම සහභාගි වන්නෙමු. මේ උත්සව අවස්ථාවලදී අපි නිතර මුණ ගැසෙන්නෙමු. එසේ මුණ ගැසුණුවිට වෙනත් අතරමැදියන් අප අතර ගැටුම් ඇති කිරීමට උත්සාහ ගනියි. ඔවුන්ගේ එම ප්‍රයත්නයන් සාර්ථක නොවන්නේ අප නිතර මුණ ගැසී කථා කරන නිසාය. දිනෙක මා ගැන වැරදි අදහසක් කෙනෙක් බෞද්ධ භික්ෂූන්වහන්සේට පවසා තිබේ. භික්ෂූන් වහන්සේ ඒ ගැන මගේ අසා සත්‍ය අවබෝධ කරගත්තේය.'
> (ප්‍රධාන තොරතුරුදායකහා, පල්ලියේ ස්වාමි)

ආගමික නායකයින් එකිනෙකා වෙත දක්වන ගෞරවය හා විශ්වාසය හා ඔවුන්ගේ ආගමික අනුගාමිකයන් ඔවුන් වෙත දක්වන විශ්වාසය හා ගෞරවය තරමටම වැදගත් වන්නේය.

අනෙකුත් ගැටුම් නිරාකරණය කරන යාන්ත්‍රණවලට වඩා සාම කමිටු හා ආගමික නායකයන් වෙත ගැටුම් පාර්ශ්වයන්ට පහසුවෙන් ළගා විය හැකියි. මේ කමිටු මුල්ම සම්බන්ධතාවයන් ලෙස අනෙකුත් ආයතන මුණගැසීමට ආධාර වෙති. අවතැන්වූවන්ගේ කඳවුරුවලට පත් කර ඇති ප්‍රජා නායකයන් කඳවුරේ ගැටළු ආගමික නායකයින් හා සාම කමිටුවෙත රැගෙන යති.

'සාම කමිටු සාමාජිකයන් අපට නීතිඥයන් මුණ ගැසීමට, අමත්‍යවරුන් මුණගැසීමට විශාල මෙහෙයක් ඉටු කළහ.'
(ප්‍රධාන තොරතුරුදායකයා,පි, පලාවි)

*ආගමික නායකයින්*

ආගමික නායකයින් පුද්ගලික වශයෙන් ද ආරවුල් විසඳීමට ක්‍රියා කරති. ගැටුමක් ආරම්භවන විට බෞද්ධ විහාරස්ථාන දායක සභාව, මුස්ලිම් පල්ලියේ භාර මණ්ඩලය, හින්දු කෝවිලේ සහ පල්ලියේ භාර මණ්ඩල මැදිහත් වෙති. තමන්ගේ ආගමිකයින් ගැටුමට මැදිහත්වූ විට එය විසඳීමට ඒ ඒ ආගමික නායකයින්ට හැකිවේ. ඔවුන් ගැටුම දුර දිග යාමෙන් වළක්වා ගනිති. ගැටුම් පාර්ශ්වයන් මුණ ගැසෙන මුල්ම ස්ථානය ඒ ආගමික නායකයන්ය.

'ගැටුමක් හට ගන්නාවිට අපි මුලින්ම යන්නේ පල්ලියේ භාරකාර මණ්ඩලය වෙතයි. මෙහිදී භාරකාර මණ්ඩලය ගැටුම විසඳීමට උත්සාහ කරයි. එසේ නොහැකිවුවහොත් පොලිසියට යන්නෙමු. මෙතෙක් අපට පොලිසියට යාමට සිදු වූයේ නැත'
(පි, 60, සිරිමාපුර)

'අපගේ ජන සමුහයේ ප්‍රශ්න බොහෝ දුරට විසඳන්නේ පල්ලියයි. මුස්ලිම් ප්‍රජාව අතර පල්ලිය ප්‍රධාන තැනක් ගනියි. අපට එය නැතැ'යි කිව නොහැක. මා දන්නා තරමින් පොලිසියට යාමට සිදුවන්නේ සිද්ධි එකක් හෝ දෙකක් සම්බන්ධයෙන් පමණි. වැඩිමනක් ගැටළු විසඳුවේ පල්ලියේ භාර මණ්ඩලයයි.'
(ප්‍රධාන තොරතුරුදායකයා,පි,නාගවිල්ලු)

*බලපෑම් කළහැකි පුද්ගලයන්*

ඇතැම්විට ජන සමාජයේ සිටින බලපෑම් කළ හැකි පුද්ගලයන් ගැටුම් විසඳන අවස්ථා දක්නට ලැබේ. ඔවුහු සාර්ථකව ගැටුම් පාර්ශ්වයන් විසඳුමකට රැගෙන යති. මේ මැදිහත්වීම සාධනීය හෝ නිෂේධනාත්මක වන්නේ, ඔවුන්ගේ පක්ෂග්‍රාහීබව හෝ න්‍යාය පත්‍ර නිසාවෙනි. ආගමික නායකයින්, ප්‍රජා නායකයින්, ප්‍රජා මණ්ඩල නායකයින් හෝ ඇතැම්විටෙක දේශපාලනඥයින් බලපෑම් කල හැකි තනි පුද්ගලයෝ වෙති.

සිරිමාපුර ජන සමාජයේ ප්‍රජා නායකයා සිංහලයකු වුවද සියළුම ජනවර්ගවල ගෞරවය දිනා සිටියි. සිරිමාපුර ජීවත්වන සිංහල, මුස්ලිම් ජන කණ්ඩායම් තමන්ගේ ගැටළු විසඳාගැනීමට ඔහු වෙත යයි.

'දැනට අවුරුදු 2කට පෙර තරුණයින්ගේ විරැකියාව හේතුවෙන් මත්පැන් භාවිතය වැඩි විය. ප්‍රජා නායකයා ඔවුන්ට ප්‍රදේශයෙන් පිට රැකියා අවස්ථා සොයා දීමෙන් පසුව ගැටළුව නිරාකරණය විය.'
(පි, 28, සිරිමාපුර)

'දැනට ගමේ ජීවත්වන මිනිසුන් සාමකාමීය. ගැටළුවක් තිබුණොත් ප්‍රජානායකයා වෙත ගොස් එය විසඳා ගනියි. ග්‍රාම සේවක හා පොලිසිය ද සිටියි.'
(පි, 70, සිරිමාපුර)

මේ පුද්ගලයන්ට ගැටුමකට සාධාරණ විසඳුමක් ලබා දීමට ශක්තියක් ඇත. ගැටුම්කාරී තත්ත්වයන් විසඳන්නේ දෙපාර්ශ්වය ඔවුන් විශ්වාස කරන හෙයිනි. ගැටුම් පාර්ශ්වයන්ගෙන් එක් පාර්ශ්වයක හෝ විශ්වාසය බෙදී යන්නේ නම් හෝ ඔවුන්ගේ පක්ෂග්‍රාහී බව පෙනී යන්නේ නම් හෝ ගැටුම් විසඳීමට ඇති ඉඩ ප්‍රස්තා හීන වෙයි.

*දේශපාලනඥයින්*

මිනිසුන් දේශපාලනඥයින් දකින්නේ තමන්ගේ බලය යොදා තමන්ට වාසි ලැබෙන පරිදි කවුරුන් හරිද වැරදිද නොසොයා ගැටුම හසුරුවන කණ්ඩායමක් ලෙසයි. තමන්ගේ අනුගාමිකයන්ට වාසි ගෙනන පරිදි ගැටුම් විසඳීම නිසා ඔවුන් ලබා දෙන විසඳුම්වලින් ගැටුම අර්බුදකාරී තත්ත්වයකට ඇද වැටේ. එක් ජනවර්ගයකට හෝ ආගමික අනන්‍යතාවයකින් එක් දේශපාන පක්ෂකට අනුගත වූ මිනිසුන් පළාතේ හෝ ජාතික මට්ටමේ දේශපාලනඥයින්ගෙන් උදව් උපකාර ඉල්ලයි. නිදසුනක් වශයෙන් ගත් කළ උතුරේ අවතැන්වූවන් සත්කාරක ප්‍රජාව නියෝජනය කරන ඇමතිවරයාට වඩා උතුර නියෝජනය කරන ඇමතිවරයා වෙත යාමට කැමැත්තක් දක්වයි.

ප්‍රතිචාර දැක්වූවන්ගේ මතය අනුව ගැටුම් නිරාකරණය දේශපාලනඥයින්ගේ මැදිහත්වීමේ සුදුසුකම පිළිබඳ අදහස් විවිධවේ. සමහරක් සිතන පරිදි දේශපාලනඥයින් ජනතා නියෝජිතයන් නිසා ගැටුම් නිරාකරණයට මැදිහත් විය යුතු බව පැවසේ. තව සමහරු විශ්වාස කරන්නේ ඔවුන් තමන්ගේ පාක්ෂිකත්වය, ජනවාර්ගිකත්වය හා ජන කණ්ඩායම් පිළිබඳ හැඟීමෙන් පක්ෂග්‍රාහීව කටයුතු කිරීම නිසා ඔවුන්ට ඵලදායී ලෙස යමක් කළ නොහැකි බවයි.

වැඩි දෙනෙක් විශ්වාස කරන්නේ දේශපාලනඥයින්ට මීට වඩා සේවාවක් කළ හැකි බවයි. මෙසේ ගැටුම්වලට සාර්ථකව මැදිහත් වී දේශපාලනඥයන් ඒවා විසඳූ ආකාරය පෙනෙන්නට තිබේ. අවතැන්වූවන්ගේ ගැටළුවලට ඔවුන් සාර්ථකව මැදිහත් වූ අවස්ථාවලට නිදසුන් තිබේ.

> 'අතීතයේදී මේ ප්‍රදේශයේ අවතැන්වූවන්ගේ කඳවුරු තනනවාට මිනිස්සු විරුද්ධ වුහ. ඔවුහු එම ඉඩමේ අයිතිකරුට පවා පහර දුන්හ. එවිට අෂ්රොෆ් ඇමතිවරයා සිංහල ප්‍රදේශවල ද යටිතල පහසුකම් ඇති කිරීමේ පොරොන්දුවක් දුන් නිසා කඳවුරු ඉදිකිරීමට හැකිවිය. එය සිදුනොවූයේ නම් අපට අදටත් විදුලිය ලැබෙන්නේ නැහැ. '
> (පි, 62, සිරිමාපුර)

*නීති ආයතන*

ගැටුම් නිරාකරණයට අධිකරයෙන් හා පොලිසියෙන් ලැබෙන විසඳුම් පක්ෂග්‍රාහී හා ඵලදායී නොවන බවට හැඟීමක් මිනිසුන් අතර තිබේ. තාවකාලිකව මාර්ග බාධක හා පරීක්ෂණ ස්ථාන යෙදීමෙන් පොලිසිය ගැටුමක් වර්ධනය වී සමාජයට බාධා පැමිණවීම වළක්වයි. මෙවැනි මැදිහත් වීම් තාවකාලික බවත් මූල හේතුවලට ඉන් විසඳුම් නොලැබෙන බවත් මිනිසුන්ගේ අදහසයි. පොලිසිය පක්ෂග්‍රාහීබව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් වැඩි දෙනෙකු පැවසූහ. උසාවි තීන්දු පවා බලය ඇති එක් ජන කොට්ඨාශයකට වාසි සලස්වන බවට මතයක් ජන සමාජය තුළ තිබේ.

> 'මෙහි පොලිසිය සම්බන්ධයෙන් ගැටළු පවතියි. දුප්පත් කිසිවක් කරගත නොහැකි ජනතාවට පොලිසියෙන් සේවයක් නොලැබේ. මේ තත්තවය දේශපාලනය ආශ්‍රයෙන් ද එක ලෙසින් දක්නට ලැබේ. සෑම උපකාරයක්ම වාසියක්ම ලබන්නේ දේශපාලනඥයින් සමග සම්බන්ධකම් ඇති පුද්ගලයන් පමණි. දුප්පත් ජනතාවට ඉන් සෙතක් සැලසෙන්නේ නැත '
> (ප්‍රධාන තොරතුරුදායකයා, පල්ලියේ පූජකතුමා)

විධිමත් ආයතන ස්වාධීන ස්භාවයක් නොපෙන්වයි නම් සාමාන්‍ය ජනතාවගේ විශ්වාසය දිනාගත නොහැකි අතර ඒවා ඵලදායී නොවේ.

*පරිපාලන නිලධාරීන්*

ගැටුම් පාර්ශ්වයන් සම්මුතියකට ඒමට අසමත් වූ විට පළාතේ පරිපාලන නිලධාරීන් වන දිස්ත්‍රික්ක ලේකම්, කොට්ඨාශ ලේකම් හා ග්‍රාම නිලධාරීන් පාර්ශ්වයන් කැඳවා විසඳුම් ලබා දෙයි. නිදසුනක් වශයෙන් පාර්ශ්ව තුනක් අතර මසුන් අල්ලීමට ඉඩ ලබා ගැනීමේ ගැටුම් තත්ත්වය සමනය කිරීමට ආණ්ඩුවේ ඒජන්තවරයා මැදිහත් වී විවිධ කණ්ඩායම්වලට ඉඩම් වෙන් කරදී ගැටුම විසඳුවේය. ඔවුහු ගැටුමේ හේතු කාරක සොයා විකල්ප විසඳුම් ලබාදී ගැටුම නිරාකරණය කරදෙයි.

> 'සුළු ආරවුලක් ඇතිවූ විට ග්‍රාමසේවක ඉදිරිපත් වී එය විසඳා දෙයි. අපගේ ඉඩම්වලට පිටතින් හරක් පැමිණ විනාශ කරති. හරක් පැමිණෙන්නේ අප ජලය ලබාගන්නා ගම් පෙදෙස් වලිනි. අපි ඔවුන්ගේ හරක් බැඳ තැබුවාම, ඔවන් අපට වතුර ලබා ගැනීමට ඉඩ නොදෙයි. මෙවැනි ගැටුම් විසඳා දීමට සමෘද්ධි නියාමකවරු පවා මැදිහත්වෙති. එසේ සිදුවන බෝග විනාශයට ගොවි නියාමකවරු අපට වන්දි ලබාදුන්නා.'
> (ගැ, 46, සිරිමාපුර)

ඇතැම් තැනක රජයේ නිලධාරීන් මැදිහත්වීම එක් පාර්ශ්වයක් විසින් වැළැක්වීම නිසා ඵලදායී නොවන අවස්ථා තිබේ. මෙවැනි අවසථාවල ගැටුම් පාර්ශ්ව යුක්තිය පතා වෙනත් පුද්ගලයින් හෝ ආයතන වෙත යති.

> 'දිසාපතිතුමා අවසන් විසඳුම ලබාදී තිබියදීත් එළුවන්කුලමේ ජනතාවට ධීවර කර්මාන්තයේ යෙදීම ඔවුන් වැළැක්විය.'
> (ප්‍රධාන තොරතුරුදායකයා,පි, වනාතවිල්ලු)

*සංවර්ධන ආයතන*

සංවර්ධන ආයතන ගැටුමට මැදිහත් වන්නේ, අතිරේක සම්පත් හෝ පොදු දේපල ලබා දීමෙනි.

> 'ඔවුන් මේ සොහොන් බිම අපට ලබා දුන්නේ USAID ආධාර ලබාගැනීමෙනි. ඊට ප්‍රථම, කනත්ත ජනවර්ග 3ටම පොදු ස්ථානයක් විය. අද එය වැටකින් කොටස් 3කට බෙදා දී තිබේ. මෙය සාමය ගොඩනැගීමේ ව්‍යාපෘතියකි.'
> (පි, 60, සිරිමාපුර)

විධිමත් නීතිමය යාන්ත්‍රණවලට වඩා සාම කමිටු, ආගමික නායකයින්, බලපෑම් කළ හැකි පුද්ගලයින් වැනි අවිධිමත් ක්‍රම ජනතාවට වඩාත් සමීප වේ. මේ අයගේ අත්දැකීම් තුළින් ගැටුම් නිරාකරණය සිදු කරන ආකාරය හා ජනතාවගේ ගෞරවය හා විශ්වාසය දිනා ගන්නා ආකාරය සම්බන්ධ කරගෙන පාඩම් ඉගෙන ගැනීමට පුළුවනි.

## සාමය පවත්වාගෙන යාම

*සංකීර්ණත්වය හා පටලැවිලි සහගත බව*

සාමය ගොඩ නැංවීමට ඇති ප්‍රධාන බාධකය වන්නේ ජනතාව විසඳුම් සොයා සම්මුතියකට පැමිණීමට ඇති නොකැමැත්තයි. මෙම අධ්‍යයනයේදී කළ සම්මුඛ සාකච්ඡා වලින් පෙනී ගියේ ගැටුමකදී හොඳම විසඳුම ලැබෙන තෙක් ජනතාව බලා සිටීම, පරිත්‍යාග කිරීමට හෝ අන් අයට ගැලපෙන පරිදි වෙනසකට

හැඩ ගැසීමට ඇති නොකැමැත්ත යනාදිය මිනිසුන්ගේ සිත් තුළ ධාරණය වී තිබෙන බවයි. මේ පටලැවිලි සහගත ආකල්පය ගැටුමකට දීර්ඝ කාලීන විසඳුමක් ලබාගැනීමට බාධාවක් වී ඇත.

ඔවුනොවුන් අතර ගැටුමක් හටගත්විට ප්‍රජා සමූහයන් අතර ඇති බෙදීම්, අනන්‍යතාවයන් හිස ඔසවයි. දිගු කාලීනව සාමයෙන් ජීවත් වූ පිරිසක් අතර ගැටුමක් හටගත් විට ඔවුන් අතර තිබෙන සමානතා අමතක කොට වෙනස්කම් ඉස්මතුවේ. මීට ඇති හොඳම නිදසුන අවතැන්වූවන් හා සත්කාරක සමාජය අතර මතුව අඛණ්ඩ ආතතියයි.

මෙම පාර්ශ්වයන් වෙත දිගුකලක් පවත්වා ගත හැකි විසඳුම් ලබාදීම ඔවුන් සතුව ඇති සමානකම් ගැන අවධානය යොමු කිරීම අභියෝගාත්මක කාරණයකි.

> 'මෙය හුදෙක් පළිගැනීමක් නොවේ. මෙම සිද්ධිය ඇතිවීමට පෙර ඔවුන් සමග ගැටුමක් නොතිබුණි. අප අතර හොඳ සම්බන්ධතාවයක් තිබුණි. මේ සිද්ධිය ඔවුන්ගේ ගෞරවයට කැළැලක් වනු ඇතැයි සිතා අපට විරුද්ධව වන බව හැඟී යයි.'
> (ප්‍රධාන තොරතුරුදායකයා,පි, උඩප්පු)

> 'මේ නඩුව ඉක්මණින්ම විසඳෙනවා නම් අපි සතුටුයි. කලින් අපි උසාවි නොගිහින් බේරගන්න උත්සාහ කළා. නමුත් ඒ අය එකඟ වුනේ නැහැ.'
> (ප්‍රධාන තොරතුරුදායකයා,පි, පලාවි)

සමහර සිද්ධීන් ඇසුරෙන් මතුවූ ප්‍රධාන කාරණයක් වූයේ අපක්ෂපාතී පාර්ශ්වය විසින් ගැටුමට දෙනු ලැබූ තීන්දුව ක්‍රියාවට නැංවීමටත් පිළිගැනීමටත් ඇති නොකැමැත්තයි. විසඳුම අසාර්ථක වන්නේ එක් පාර්ශ්වයක් හෝ ගැටුම් පාර්ශ්ව දෙකම නිර්දේශිත විසඳුම පිළිගැනීමට නොකැමති වීමයි.

> 'දිසාපතිතුමා විසින් අවසන් විසඳුම ලබාදී තිබියදී එළුවන්කුලමේ ජනතාවට ධීවර කර්මාන්තයේ යෙදීම ඔවුන් වැළැක්විය.'
> (ප්‍රධාන තොරතුරුදායකයා,පි, වනාතවිල්ලු)

ඇතැම් සිද්ධීන් කෙතරම් සංකීර්ණදැයි කිවහොත් ඒවා විසඳීම කෙසේ වෙතත්, නරක අතට හැරී යයි. ගැටුම් අවස්ථාවලදී බාහිර පුද්ගලයන් ඊට මැදිහත් වී අනෙක් ගැටුම් පාර්ශ්වයට සිදු කරන හිරිහැර හා ප්‍රචණ්ඩ ක්‍රියා නිසා ***සාමය ගොඩනැගීම*** දුෂ්කර වී තිබේ. මෙසේ තුන්වැනි පාර්ශ්වයක් ගැටුම විසඳීමේ මැදිහත්කරුවන් නොවී එක් එක් පාර්ශ්වවලට ආධාර කිරීමෙන් මුල් ආරවුල සංකීර්ණ වී සරල විසඳුමක් සොයාගැනීමට ඇති හැකියාවන් වළක්වාලයි.

> 'එක් අවස්ථාවක වීරපුරෙන් පැමිණි මිනිසුන් කණ්ඩායමක් අපේ ගම්වලට මුස්ලිම්වරුන් වැද්ද නොගන්නා ලෙස පැවසුහ. ඉන් අනතුරුව පුද්ගලයින් තුන් දෙනෙක් ගෙයක් තුළ සිරකර දමා දොර අගුල් දමා ගිනි තැබූහ. නිවසේ ජලය තිබූ නිසා ගින්න නිවා දැමූ නමුත් ඔවුන් උපකාර ඉල්ලා සිටියත් අප කිසිවෙනක් එහි නොගියේ අපට කළ තර්ජන හේතුවෙනි.'
> (පි, 70, සිරිමාපුර)

බාහිර සාධක

*විනාශ වීගෙන යන දේශපාලන තත්ත්වය හා ගැටුම අළුත්වීම*

සටන් විරාම ගිවිසුම අහෝසිවීම හා උතුරු.නැගෙනහිර තත්ත්වය උග්‍රවීම නිසා මිනිසුන් තම ගම්බිම් බලා යාමෙන් වළක්වා ඇත. මේ තත්ත්වය අවතැන්වූවන් හා සත්කාරක සමාජය අතර ගැටුම් පවත්වාගෙන යන පුද්ගලයන්ට අත වැනීමකි. අවතැන්වූවන් ආපසු යෑමට බාධා ඇති කිරීම නිසා ඔවුන් හා සත්කාරක සමාජය අතර සංවර්ධන ආධාර ලබාගැනීමේදී ගැටුම් ඇතිවේ. පුත්තලමේ ගැටුම් මේ සාධක නිසා ඇතිවේ.

> 'සටන් විරාමයෙන් පසුව යාපනයට ගිය අපි ඊළග අවුරුද්දේ ආපසු පැමිණියේ අපගේ නිවෙස් ආරක්ෂිත තත්ත්වයක නොතිබූ නිසයි. අදටත් යාපනයේ අපගේ පවුල් කීපයක් ජීවත් වෙති. යුද්ධයෙන් පසුව ඔවුන් ද නැවත පැමිණීමට බලාපොරොත්තු වෙයි.'
> (පි, 60, සිරිමාපුර)

> 'සත්කාරක සමාජය වැරදි ආකාරයෙන් අවතැන්වූවන් දෙස බලන්නේ සම්පත් ලබාගැනීමට ඇති තරගය හේතුවෙනි.'
> (පි, 60, සිරිමාපුර)

> 'රජය මෙම ජනවාර්ගික ප්‍රශ්නේ විසඳුවහොත් අපි ආපසු යාපනයට යෑමට කැමෙන්තෙන් සිටිමු.'
> (ප්‍රධාන තොරතුරුදායකයා,පි, පලාවි)

*දිගු කාලයක් සාමය පවත්වාගෙන යාම*

බාහිරින් බැලූ විට සාමකාමී දිස්ත්‍රික්කයක් ලෙස පෙනුණද පුත්තලමේ ආරවුල් හා ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවන බව මෙම අධ්‍යයනයෙන් හෙළිවේ. ගැටුම් පැවතීම හේතුවෙන් ඒවා වළක්වා ගැනීමට විවිධ ප්‍රාදේශීය යාන්ත්‍රණ පිහිටුවා ඇත. ඉහත කී අභියෝග හමුවේ වුවද සාර්ථක උත්සායන් මත සාමය ගොඩ නැගිය හැකිවේ.

මෙහි වඩාත් වැදගත් ලක්ෂණය වන්නේ බාහිර ආයතන මෙම පරිසරයේ බිඳෙන සුළු භාවය හමුවේ තත්ත්වය නරක අතට හැරීම සඳහා ක්‍රියා නොකිරීමයි. ආර්ථික සම්පත් සඳහා තිබෙන තරගය නිසා දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති දියත් කරන ආයතන සියළුම ප්‍රජාවන්ට සහ අවදානම් සහගත පුද්ගලයිනට ප්‍රතිලාභ සමානව ලැබෙන පරිදි වැඩ කටයුතු කරගෙන යයි.

පුත්තලමේ ක්‍රියාත්මක ප්‍රාදේශීය හා ජාත්‍යන්තර ආයතන දැන් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නංවන විට ඇතිවියි හැකි ගැටුම් ගැන සංවේදිව සිටියි. අවතැන්වූවන්ගේ සුබ සාධනය වෙනුවෙන් ක්‍රියාකරන ඇතැම් සංවර්ධන ආයතන ප්‍රාදේශීය ජනතාවගෙන් සැහෙන ප්‍රමාණයක් ද ඊට ඇතුළත් කරගනිති. මේ නිසා අවතැන්වූවන් හා සත්කාරක සමාජයේ ගැටුම් හට ගැනීමට ඇති ඉඩකඩ අවම වී තිබේ.

> 'ප්‍රදේශයේ පවුල් 175ට සෙත සලසන ජල ව්‍යාපෘතියක් CARE ජාත්‍යන්තර සංවිධානය විසින් අරඹා තිබේ. මේ නිසා අවතැන්වූවන් හා සත්කාරක සමාජය අතර ගැටුම් ඇති නොවන පරිදි කටයුතු කිරීමට ඔවුහු වග බලා ගනිති. *හිරිහැරයක් නොකරමු* යන තේමාවෙන් ක්‍රියාත්මක වන ඔවුහු මෙම ව්‍යාපෘතියට සත්කාරක සමාජයේ ජනයාගෙන් 25%ක් ඇතුළත් කරගෙන සිටියි.'
> (ප්‍රධාන තොරතුරුදායකයා, රාජ්‍ය නොවන සංවිධාන එකතුව)

අවතැන්වූවන් ජනතාවට සේවය කරමින් සත්කාරක ප්‍රජාවටද සේවයක් සැලසීම අනාගතයේදී ප්‍රදේශයේ ඇතිවිය හැකි වියවුල් අවම කෙරේ. ඇතැම් දේශපාලනඥයෝ ද ප්‍රජාවන් අතර ගැටුම් ඇති නොවන

ලෙස සංවර්ධන ක්‍රියාකාරකම් දියත් කිරීමට වගබලා ගනිති. සත්කාරක ප්‍රජාවගේ ප්‍රතිචාර දැක්වූවන්ගේ අදහස වූයේ අවතැන්වූවන්ගේ ප්‍රශ්නය නිසා සත්කාරක ප්‍රජාවට වැඩි පහසුකම් ලැබුණු බවයි.

'අපගේ ගම්වාසීන් අවතැන්වූවන් එහි පදිංචි වනවාට කැමැත්තක් දැක්වූයේ නැහැ. එවිට ඇමතිවරයා මහජන රැස්වීමක් කැඳවා මුස්ලිම්, සිංහල හෝ දෙමළ වේවා තමන් සියළු දෙනාට සමානව සලකන බවට පොරොන්දු වී නිවාස තනා ගැනීම සඳහා සෑම කෙනෙකුටම රුපියල් 32,500 බැගින් ලබා දුන්නේය. එම මුදලින් බොහෝ දෙනෙක් නිවාස තනාගත්හ.'
(පි, 70, සිරිමාපුර)

'අතීතයේදී මෙහි අවතැන්වූවන් කඳවුරක් ඇතිකරනවට බොහෝ අය අකමැති වූහ. ඔවුහු ඉඩමේ අයිතිකරුට හිරිහැර කළහ. එවිට සිංහල ගම්මානවල යටිතල පහසුකම් දියුණු කරන බවට අෂ්රොෆ් ඇමතිවරයා පොරොන්දු විය. ඒ සමගම මෙහි කඳවුරු ඉදි කළේය. එය නොකළේ නම් අපට තවමත් විදුලිය නොලැබෙනු ඇත.'
(පි, 62, සිරිමාපුර)

# 7. නිගමනයන්

මෙම අධ්‍යයනය සඳහා පුත්තලම තෝරාගත යුතු යැයි යෝජනා කළේ ප්‍රදේශයේ *විනිවිද ඒකාබද්ධ ස්වෙච්ඡා ප්‍රධානියා* විසිනි. ඊට හේතු වූයේ ගැටුම් ඇතිවීමට විභව්‍යතාවයක් තිබුණද පුත්තලමේ සාපේක්ෂව සාමකාමී වාතාවරණයක් තිබෙන හෙයිනි. ප්‍රදේශයේ සාමය පවත්වාගෙන යාමට ක්‍රියාකාරීන් හා කණ්ඩායම් ප්‍රාදේශීය දැනුම සහ පවත්නා යාන්ත්‍රණ හා ව්‍යුහයන් උපයෝගී කර ගනිති.

මෙම අධ්‍යයනයේ අරමුණ පළාතේ ක්‍රියාකාරීන්ට ආරවුල් මඟහරවා සාමය ළඟා කරගැනීමට ප්‍රජා මට්ටමේ පවතින ගැටුම් කළමණාකරණ දැනුම සොයා යාමයි. මෙම අධ්‍යයනය තුළින් විවිධ ජනකණ්ඩායම් සතුව තිබෙන ගැටුම් පිළිබඳ අත්දැකීම්, ව්‍යුහයන් හා ඒවායේ සාර්ථකත්වය, ඒවා ගැන ප්‍රජාවගේ පිළිගැනීම යනාදිය පිළිබඳ ගැඹුරු අවබෝධයක් අපට ලබා දී තිබිණි.

පුත්තලමේ සංක්‍රමණික සංසිද්ධිය අළුත් දෙයක් නොවේ. 1990දී යාපනයෙන් හා මන්නාරමෙන් වැඩිම සංක්‍රමණිකයන් පිරිසක් පැමිණි බව සත්‍යයකි. නමුත් සංඛ්‍යාලේඛන දෙස බැලූ විට පෙනී යන්නේ කාලයක් මුළුල්ලේ සිටි කුරුණෑගල හා ගම්පහ දිස්ත්‍රික්ක වලින් පුත්තලමට සංක්‍රමණය වූ අය 1990දී යාපනයෙන් හා මන්නාරමෙන් පැමිණි අයට වඩා වැඩි බවයි. ඔවුන් ඉතා හොඳින් දිස්ත්‍රික්කයට අනුගත වී ඇතත් ජනවාර්ගික ප්‍රශ්නය නිසා පැමිණි සංක්‍රමණිකයින් තවමත් පසුවන්නේ පිටස්තරයන් විලසිනි. ප්‍රතිචාර දක්වන්නන් එම විශාල සංක්‍රමණ අමතක කොට අවතැන්වූවන් පැමිණීමෙන් සිදු වූ බලපෑම ගැන කථා කරයි.

පුත්තලමේ ආර්ථික දරිද්‍රතාවය දිවයිනේ සෙසු ප්‍රදේශවල අනුව යමින් පසුගිය අවුරුදු 15 මුළුල්ලේම අඩු වැඩි වෙමින් පවතියි. පුත්තලමට අවතැන්වූවන් පැමිණියේ 1999දීය. 1990 දී 22%ට තිබූ දරිද්‍රතා මට්ටම 1995/96 වන විට 31% දක්වා වැඩිවිය. 2002 වන තෙක් එය ස්ථාවරව තිබිණි. 2006 සංගණන තොරතුරු අනුව විශාල වෙනස්කමක් පෙන්නුම් කරමින් ජනගහණ දරිද්‍රතා දර්ශකය 13% දක්වා අඩු විය. 1995දී පෙන්නුම් කළ නිෂේධනාත්මක තත්ත්වය අවතැන්වූවන් පැමිණීම නිසා විය හැකි අතර මෑතකදී ඇතිවූ සාධනීය වෙනස්කම් සිදුවූයේ අවතැන්වූවන්ට ලැබුණු ආධාර දිස්ත්‍රික්කයේ ආර්ථිකයට කරන ලද ආයෝජනය නිසාවෙනි.

වියළි කලාපයේ ස්ථානගත වුවද සෙසු වියළි කලාපවල දක්නට ලැබෙන වාරි කර්මාන්තය ඇසුරු කරගත් කෘෂිකර්මයක් නොමැති හෙයින් සාපේක්ෂව බලන කල්හි පුත්තලමට ඇත්තේ අවම ස්වාභාවික සම්පත් පදනමක් හා සීමිත ජීවනෝපාය මාර්ගයන්ය. එක්වරම 60,000 ක අවතැන්වූවන් ප්‍රමාණයක් පැමිණීම නිසා ස්වාභාවික සම්පත්, සේවා හා ජීවනෝපායන් සඳහා තරගයක් හට ගත්තේය. මෙම අධ්‍යයනයෙන් හඳුනාගත් සත්කාරක ප්‍රජාව තුළ හෝ අවතැන්වූවන් අතර හෝ හටගත් ගැටුම් සිද්ධීන්/ ගැටුම් රේඛා යටකී තරගය මුල් කරගත් ඒවාය. ඇතැම් හරස් කැපුම් කරුණු අනන්‍යතාවය (නිදසුන්, සත්කාරක ප්‍රජාව/අවතැන්වූවන්, අභ්‍යන්තර අවතැන්වූවන්/අභ්‍යන්තර අවතැන්වූවන්, සත්කාරක ප්‍රජාව/සත්කාරක ප්‍රජාව) පදනම් කරගෙන ඇති වූ සිද්ධීන්ය. ඇතැම් ඒවා ඉඩම් භුක්තිය සම්බන්ධයෙනි. තවත් සමහරක් සේවා සැපයීම (නිදසුන් සෞඛ්‍ය පහසුකම්) ආශ්‍රයෙන් හටගත්හ. තවත් තැනක ගැටුමට සම්බන්ධ ක්‍රියාකාරීන්ගේ දේශපාලන බලය සම්බන්ධ වූ සිද්ධීන්ය.

දිස්ත්‍රික්කයේ සංවර්ධන කාර්යයන්හි නිරත ආයතන 40-50 ක් පමණ සංඛ්‍යාවක් ඇත. ඒ හැරුණු විට ප්‍රාදේශීය පරිපාලනයෙන් හා රාජ්‍ය මට්ටමින් ද සංවර්ධනය උදෙසා මූල්‍යමය ආධාර දිස්ත්‍රික්කයට ලැබේ. සංවර්ධන කාර්යයන් බහුතරය සිදුවන්නේ අවතැන්වූවන්ට පදිංචි ප්‍රදේශවලය. අවතැන්වූවන්ගෙන් අමතරව මෙම අධ්‍යයනය හඳුනාගත් ඉතා දුප්පත් පුද්ගලයින්, කාන්තා මූල කුටුම්භයන්, සංක්‍රමණික ධීවරයන් වැනි අවදානම් සහිත ජන කණ්ඩායම් පුත්තලමේ ජීවත් වෙති. ඇතැම් ව්‍යාපෘති අවතැන්වූවන් වෙත පක්ෂග්‍රාහී බවක් දක්වන බවට ජනතාවගේ සිත් තුළ ආතතියක් ඇතිවෙමින් තිබේ. මෙම සංවර්ධන කාර්යයන් අවදානම් සහිත කණ්ඩායම් පිළිබඳව අවධානයක් යොමු කරන්නේ නම් ආතතීන් ප්‍රචණ්ඩ

දක්වා දුරදිග යනු ඇත. මෙම අධ්‍යයනය සිදු කළ කාල වකවානුව තුළදී ඇතැම් සංවිධාන යටකී අනතුරු දැක සංවර්ධන කාර්ය සැලසුම් කිරීමේදී ඊට ප්‍රතිචාර දැක්වූහ. රාජ්‍ය හා රාජ්‍ය නොවන වෙනත් සංවිධාන ද ඔවුන්ගේ සැලසුම් සකස් කිරීමේදී මෙම අනතුරුදායක තත්ත්වය සැලකිල්ලට ගන්නේ නම් මැනවි.

මෙම ගැටුම් නිරාකරණය සඳහා මැදිහත් වී සිටින ක්‍රියාකාරීන් හා ඔවුන් පාවිච්චි කරන යාන්ත්‍රණ ගැටුමේ ස්වභාවය හා තීව්‍රතාවය අනුව වෙනස් වෙයි. එකම නිරාකරණ ව්‍යුහය සියළුම ගැටුම් සිද්ධීන් විසඳා ගැනීමට යොදා ගැනීමට නුපුළුවන. මේ ප්‍රදේශයේ පවතින ගැටුම් විසඳීමේ ක්‍රියාවලියට පළාතේ ප්‍රජා මූල සංවිධාන, ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධාන, බලපෑම් කළ හැකි පුද්ගලයින් (ආගමික නායකයින්, ප්‍රජා නායකයින්, දේශපාලනඥයින්, සාම කමිටු) මැදිහත් වූහ. ඒ අරබයා විවිධ යාන්ත්‍රණ උදව් කරගත්හ. ගැටුම් පාර්ශ්ව අතර සාකච්ඡා පැවැත්වූහ. සම්පත් ලබා දුන්හ, තරඟය හටගත් සේවාවන් ලබා දුන්හ.

මෙසේ ප්‍රාදේශීය ව්‍යුහයන් අනුක්‍රමික වුවද බොහෝ දේ දිනාගත්හ. ඔවුන්ගේ ප්‍රයත්නයන් සාර්ථක වූයේ ප්‍රජාවගේ ගෞරවය දිනාගත් පුද්ගලයන් මාර්ගයෙන් ගැටුම් අවස්ථාවට ක්ෂණිකව මැදිහත්වීම නිසාය.

CEPA සංවිධානය මන්නාරමේ සිය කටයුතු සිදුකළ අවස්ථාවේ සොයාගත් තොරතුරු අනුව ගැටුම් අවස්ථාවලදී ඒවා විසඳා ගැනීමට ප්‍රජාව ප්‍රාදේශීය ව්‍යුහයන් කරා යාමට බොහෝ සෙයින් කැමැත්තක් දක්වති (තලයසිංහම්, 2006). මේ අධ්‍යයනය ද යට කී අදහස අනුමත කරමින් ප්‍රකාශ කරන්නේ ප්‍රාදේශීය ක්‍රියාකාරිකයන් සහ ව්‍යුහයන් ගැටුම් කළමණාකරණයට හා නිරාකරණයට බොහෝ සෙයින් සමත්වන බවයි. මන්නාරමේ සිදුකළ මුල් අධ්‍යයනයෙන් ද ප්‍රකාශ වූ පරිදි ප්‍රාදේශීය ව්‍යුහයන් අතර සම්බන්ධතා වැඩි දියුණු කොට රජයේ ආයතන හා පොලිසියේ කාර්යයන් ශක්තිමත් කිරීම කළ යුතුව ඇත. තවත් වැදගත් කාරණයක් වන්නේ පුත්තලමේ ගැටුම් නිරාකරණයට හා සාමය ගොඩනැගීමට මැදිහත් වන බාහිර ආයතන පළාතේ පවතින ව්‍යුහයන් පාවිච්චි කරනවා විනා ඊට සමාන්තර අළුත් ව්‍යුහයන් සකස් නොකළ යුතු බවයි.

ගැටුම් සිද්ධියේ සංකීර්ණභාවය හේතුකොටගෙන හෝ ප්‍රාදේශීය මට්ටමේ යාන්ත්‍රණය අසමත් වූ නිසා හෝ ඇතැම් ගැටුම් විනිශ්චයක් ලබාගැනීමට අධිකරණය වෙත යන අවස්ථා දැක ගත හැකිවේ. විවිධ පසුබිම් ඇති විවිධ බලයක් ඇති (දේශපාලනඥයින්) පාර්ශ්ව කීපයක මැදිහත්වීමෙන් ඇතිවෙන ගැටුම්වල සංකීර්ණභාවය නිසා නිරාකරණ ක්‍රියාවලිය දිග්ගැස්සෙන සුළු වන්නේය.

අවුරුදු 18ක් වැනි දිගු කාල පරායසයක් මුළුල්ලේ අවතැන්වූවන් පුත්තලමේ පදිංචි වීම නිසා පළාත සමග යම් තරමක අනුකලනය වීමක් දක්නට ලැබේ. අවතැන්වූවන් හා සත්කාරක ප්‍රජාව අතර ආර්ථික හා සමාජ සම්බන්ධතා වර්ධනය වී තිබුණ ද ඔවුන් අතර පවතින දුරස්තරභාවී හැඟීමේ අඩු වීමක් දක්නට නැත. රාජ්‍ය හා රාජ්‍ය නොවා සංවිධාන පළාතේ කටයුතු කිරීමේ දී දිගින් දිගටම පවතින මේ දුරස්ථරභාවය අවබෝධ කරගැනීම වැදගත්වේ. අවතැන්වූවන්ගෙන් අවතැන්වූ සමාජ තත්ත්වය හා පුත්තලමේ තාවකාලික ලැගුම්කරුවන්ය යන අදහස තිබෙන තාක් කල් දුරස්තරභාවය පවතිනු ඇත. ගම්බිම් කරා ආපසු යාමට ස්ථිර පරිසරයක් නොමැති හෙයින් ඔවුනොවුන් අතර සැඟවී පවතින ගැටුම්වලට තුඩු දෙන මෙම හැඟීම් හා බෙදීම් උත්සන්න නොකළ යුතුය. ඒ සමගම ගැටුම් ඇතිවීමේ විභවතාවයක් දිස්ත්‍රික්කයේ පවතින බව තේරුම් ගෙන හැකිතාක් දුරට ඒවා සාධාරණ ලෙස විසඳීම වැදගත්වේ.

මෙම අධ්‍යයනය පුත්තලම දිස්ත්‍රික්කයේ විවිධ ජාතීන්ගෙන් සමන්විතවූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කිහිපයක සිදුවන ගැටුම් අවස්ථා 6ක වර්ධනය හා විසඳීමේ ක්‍රියාවලිය හදාරයි. මෙම ගැටුම් අවස්ථා 6 ඒවායෙහි විවිධත්වය විසඳුම් සෙවීමේ අදියර හා හවුල් වී ඇති පාර්ශ්ව අනුව තෝරා ගනු ලැබිණි.

අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ක්ෂණික ආගමනය නිසා සිදුවූ ද්විත්ව බලපෑම මෙම අධ්‍යයනය මගින් සොයා බලයි. ප්‍රදේශයේ සම්පත් සඳහා ඇති තරගකාරීත්වය තීව්‍ර කිරීම මගින් ගැටුම් සඳහා අඩිතාලම වැටුනේ'යැයි සත්කාරක ප්‍රජාවගේ මතය සහ ප්‍රාදේශීය ආර්ථිකයේ දියුණුව සඳහා අවතැන් වූවන්ගෙන් ලැබුණු සහාය මෙම අංශ දෙකයි. ගැටුම් වඩාත් සංකූල කිරීම හා විසඳුම් සෙවීම වඩාත් දුෂ්කර කරවන අනන්‍යතාවය, ඉඩම් හා දේශපාලන බලය වැනි කරුණු පිළිබඳ වැඩිදුර අධ්‍යයනයක්ද මෙහි ඇතුළත් වේ. තවද ප්‍රාදේශීය සමාජ ආර්ථික තත්වයන් පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක්ද මෙහි ඇතුළත් වේ.

පරිපාලන ව්‍යුහයන්, නෛතික ආයතන, සංවර්ධන ආයතන, ආගමික නායකයන් හා සංවිධාන වැනි ආරවුල් විසඳීම සඳහා වූ ප්‍රාදේශීය යාන්ත්‍රණයන් ආරවුල් විසඳීමේදී පෙන්වන සාර්ථකත්වය සහ ඇති කරනු ලබන බලපෑම පිළිබඳවද අධ්‍යයනය කරයි.



මුද්‍රණය: සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පෞද්ගලික) සමාගම



cepa
centre for poverty analysis
දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය
29, ග්‍රෙගරී පාර, කොළඹ 7, ශ්‍රී ලංකාව
දු. අ.: +94 11 2676955-8, 2667967-8
ෆැක්ස්: +94 11 2676959
ඊ මේල්: info@cepa.lk
වෙබ්: www.cepa.lk



ISBN 978-955-1040-53-6
9 789551 040536



European Union
යුරෝපා සංගමය
ஐரோப்பிய ஒன்றியம்